# රණවිරුවා

2023 මැයි • 255 කලාපය




## උපන් බිම රැකි උතුම් පුතුනට උපහාර...



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර



# “බුද්ධ රශ්මි වෙසක් කලාපය”
# ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන්




ගංගාරාම බුද්ධ රශ්මි වෙසක් කලාපය ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පසුගිය මැයි මස 05 වන දින විවෘත කෙරිණ. ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන ඇතුළු මැති ඇමතිවරු රැසකගේ සහභාගීත්වයෙන් පැවති මෙම අවස්ථාවට ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදාධිපති, පොලිස්පති ඇතුළු ආරක්ෂක හමුදා ප්‍රධානීහු රැසක්ද එක්වූහ.







ත්‍රිවිධ හමුදා සාමාජිකයන්, පොලිස් නිලධාරීන්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයන් සහ විවිධ සංවිධාන වෙතින් නිර්මාණය කරනු ලැබූ අලංකාර වෙසක් පහන් කූඩු ඇතුළත් ප්‍රදර්ශන කුටි රැසක් මෙම වෙසක් කලාපයට එක්කොට තිබිණ. ඒ අතර යුද්ධ හමුදා සාමාජිකයින්ගේ නිර්මාණාත්මක හා තාක්‍ෂණික හැකියාවන් විදහාපාමින් විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලිකත්වයෙන් ඉදිරිපත් කරන ලද "අපාය" ප්‍රදර්ශන කුටිය එහිදී කැපී පෙනුණි. තවද, සමස්ත වෙසක් කලාපය පුරා වූ විවිධ අලංකාර, සැරසිලි වෙනුවෙන් යුද්ධ හමුදාවෙන් ලැබී තිබුණේ වැඩි දායකත්වයකි.

එහිදී, ජනාධිපතිතුමන්, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී හා යුද්ධ හමුදාධිපති නිර්මාණ ඉදිරිපත් කළ විවිධ රෙජිමේන්තු හා ආයතනවල සාමාජිකයන් සමග අදහස් හුවමාරු කරගනිමින් ඔවුන්ගේ නිර්මාණශීලි කුසලතා ඇගයීමටද ලක්කළේය. රණවිරුවන්ගේ දෑතින් හැඩ වූ මෙවර ගංගාරාම "බුද්ධ රශ්මි" ජාතික වෙසක් කලාපය එහි පැමිණි දහස් ගණන් ජනතාවගේ ඉමහත් ප්‍රසාදයට හේතුවිය. විශේෂයෙන්ම වසර කිහිපයකට පසු මෙවර නිදහසේ වෙසක් අසිරිය සැමරීමට හැකිවීම පිළිබඳ එම අවස්ථාවට එක්වූ ජනතාවගෙන් රණවිරුවන් වෙතද නොමඳ ප්‍රශංසාව හිමිවිය.











# උපන් බිම රැකි උතුම් පුතුනට උපහාර

මිලේච්ඡ ත්‍රස්තවාදයෙන් මවුබිම මුදාගැනීම සඳහා දිවිපිදූ විරෝදාර රණවිරුවන් 28,619 දෙනකු සිහිකර පුෂ්පෝපහාර පුදකිරීම වෙනුවෙන් පැවති 14 වන රණවිරු අනුස්මරණ උත්සවය ඉකුත් මැයි මස 19 දින සන්ධ්‍යාවේ බත්තරමුල්ල ජාතික රණවිරු ස්මාරකය අභියසදී සන්නද්ධ හමුදා සේනාධිනායක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.













තිස්වසරක් පුරා මෙරට පැවති කුරිරු යුද්ධයේදී මාතෘභූමියේ ඒකීයභාවය සහ ස්වෛරීභාවය ආරක්ෂා කිරීම උදෙසා යුද්ධ හමුදාවේ 23,962 ක්, නාවික හමුදාවේ 1160 ක්, ගුවන් හමුදාවේ 443 ක්, පොලිසියේ 2598 ක් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 456 දෙනකු දේශය වෙනුවෙන් තම දිවි කැපකොට ඇත. එම වීරෝදාර රණවිරුවන්ගේ උත්තරීතර කැපකිරීම අනුස්මරණය කරමින් මෙම උත්සවයේදී පුෂ්පෝපහාර පුදකර ඔවුන් වෙත ගෞරවාචාරය දැක්විය.

මෙම අවස්ථාවට භික්ෂූන් වහන්සේලා එම රණවිරුවන්ගේ භාර්යාවන්, ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්, ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මැතිතුමන්, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමන්, අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, ජනාධිපති ලේකම්, ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, හිටපු ත්‍රිවිධ හමුදාධිපතිවරු, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, වත්මන් ත්‍රිවිධ හමුදාධිපතිවරු, පොලිස්පති, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්, රණවිරු සේවා අධිකාරියේ සභාපති, ත්‍රිවිධ හමුදාවේ ප්‍රවීණයන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.











# යුද්ධ හමුදා මූලස්ථාන වෙසක් කලාපය





ජාතික වෙසක් සතිය නිමිත්තෙන් යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේ ඉදිකළ වෙසක් කලාපය මැයි 05 වන දින සන්ධ්‍යාවේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් විවෘත කරනු ලැබූහ.

ප්‍රධාන පිවිසුමේ සිට මධ්‍යම පරිසර අධිකාරී කාර්යාල පරිශ්‍රය තෙක් විහිදුණු වෙසක් කලාපයට යුද්ධ හමුදා මූලස්ථානයේ සහ රෙජිමේන්තුවල විවිධ ශාඛාවන්හි සාමාජිකයන් රැසක් ඉදිරිපත් කළ දර්ශනීය කැරකෙන කූඩු 14 ක් සහ අලපට්ටම් 700 කට අධික සංඛ්‍යාවක් ඇතුළත් විය. තවද, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් වෙසක් කලාපය නැරඹීමට පැමිණි සැදැහැවතුන් වෙනුවෙන් අයිස්ක්‍රීම් දන්සැලක් ද සංවිධානය කරන ලදී. යුද්ධ හමුදා සාමාජික සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් වෙසක් බැති ගී ප්‍රසංගයක්ද එහිදී පැවැත්විණ.



# කැලණි පුදබිමෙහි දන්සැලක්





අසිරිමත් වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයේ කැලණිය රජමහා විහාරස්ථානය කේන්ද්‍ර කොටගෙන ආගමික වැඩසටහන් මාලාවක් පැවැත්විණ. එහි විහාරාධිපති පූජ්‍ය (මහාචාර්ය) කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමිපාණන් වහන්සේගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයින් ලෙස සහභාගී වූහ.

එහිදී, එම දෙපල සධාතුක කරඬුව ඇතුළු පූජනීය ස්ථාන වැඳපුදාගැනීමෙන් අනතුරුව එහි බස්නායක නිලමේ ධම්මික ආටිගල මහතා ඇතුළු භික්ෂූන් වහන්සේලා හා සංවිධායක මණ්ඩලය වෙතින් සිදුකළ ආරාධනයට අනුව එහි පැවැත්වූ දන්සැල විවෘත කිරීම සඳහාද එක්වූහ.

# විරුවන් සමරා සඳහිරු සෑ පුදබිමේදී ආගමික කටයුතු රැසක්









බත්තරමුල්ල රණවිරු ස්මාරකය අභියසදී පැවති ජාතික රණවිරු දින සැමරුමට සමගාමීව ඉකුත් මැයි 20 සහ 21 දිනවල අනුරාධපුර සඳහිරු සෑ පුදබිමේදී පිංකම් මාලාවක් පැවැත්විණ. එහිදී, සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයක්, වර්ණවත් පෙරහැරක් සහ අටමස්ථානයන්හි භික්ෂූන් වහන්සේලා 100 නමක් වෙත හීල් දානය පූජා කිරීමේ පුණ්‍ය කටයුත්තක්ද සිදුකෙරිණ.

මෙම අවස්ථාව සඳහා ආරක්‍ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමන්, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් (විශ්‍රාමික) ජෙනරාල් කමල් ගුණරත්න, ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාධිපතිවරු ඇතුළු නිලධාරීන්, සෙබළුන්, පොලිස් සාමාජිකයින් විශාල පිරිසක් සහභාගී වූහ. ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති ගේ මගපෙන්වීම මත එම ආරක්‍ෂක සේනා මූලස්ථානය යටතේ සේවයේ නියුතු භටපිරිස් විසින් මෙම පුණ්‍ය වැඩසටහනේ සියලු කටයුතු සංවිධානය කළහ.



# යුද්ධ හමුදාධිපති රුවන්වැලි මහා සෑ චෛත්‍ය රාජයාණන් වහන්සේ වැඳපුදාගනී

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය පසුගිය මැයි මස 20 වන දින උදෑසන රුවන්වැලි මහා සෑය වෙත ගොස් එම පුදබිමේ විහාරාධිපති පූජ්‍ය ඊතලවැටුණුවැවේ ඥානතිලක හිමිපාණන් බැහැදැක ආශිර්වාද ලබාගත්හ.



රුවන්වැලි මහා සෑ රදුන් වන්දනාමාන කිරීමෙන් අනතුරුව අනුරාධපුර ප්‍රදේශයේ ආර්ථික අපහසුතා මධ්‍යයේ අධ්‍යාපනය හදාරන සිසු සිසුවියන් 750 දෙනකු වෙත පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ අවස්ථාව සඳහා විහාරාධිපති හිමිපාණන්ගේ ඇරයුමෙන් ප්‍රධාන ආරාධිතයින් ලෙස යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය එක්වූහ. රුවන්වැලි මහා සෑයේ සහ අටමස්ථානාධිපති පූජ්‍ය පල්ලේගම හේමරතන හිමිපාණන්ගේ මූලිකත්වයෙන් සංවිධානය කරනු ලැබූ මෙම පරිත්‍යාග වැඩසටහන සඳහා 'EWIS' සමාගම් සමූහය එක්ව අනුග්‍රාහකත්වය දැක්විය.



මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකාවේ වියට්නාම් තානාපතිනිය, ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති, ආඥාපති ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද), 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 'EWIS' සමාගම් සමූහයේ සභාපති සංජීව වික්‍රමනායක මහතා සහ ප්‍රදේශවාසී බැතිමතුන් විශාල පිරිසක් සහභාගී වූහ.



# ගංගාරාම වෙසක් කලාපයේ නිර්මාණශීලී විරුවන් ඇගයේ



ගංගාරාමයේ පැවැත් වූ බුද්ධ රශ්මි වෙසක් කලාපය තුළ නිර්මාණශීලී වෙසක් පහන් කූඩු ඉදිරිපත් කිරීම සඳහා දායකවූවන් වෙනුවෙන් මූල්‍යමය දිරිගැන්වීම් සහ ත්‍යාග පිරිනැමීම ඉකුත් මැයි මස 07 වන දින සිදුකෙරිණ. එම අවස්ථාව සඳහා භික්ෂූන් වහන්සේලා, ගරු අමාත්‍ය බන්දුල ගුණවර්ධන, ජනාධිපති ලේකම් සමන් ඒකනායක යන මහත්වරු, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා ආර්එස්පී යූඑස්පී, ඉහළ පෙළේ රාජ්‍ය නිලධාරීන්, පාසල් සිසු සිසුවියන් සහ ආරාධිතයින් රැසක් සහභාගී වූහ.

බුද්ධ රශ්මි වෙසක් කලාපය තුළ ත්‍රිවිධ හමුදා සාමාජිකයන්, ශ්‍රී ලංකා පොලිසිය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරනු ලැබූ වෙසක් පහන් කූඩු, භක්ති ගීත සහ දන්සැල් රැසක් එක්කොට තිබිණ. එම ත්‍යාග ප්‍රදානෝත්සවයේදී නිර්මාණාත්මක වෙසක් පහන් කූඩු ඉදිරිපත් කළ යුද්ධ හමුදා සාමාජිකයෝ දෙවන, තෙවන සහ හයවන ස්ථාන දිනාගැනීමට සමත්වූහ. ඒ අතරින්, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් නිර්මාණය කරනු ලැබූ "අපාය" අනුරුව සැදැහැවතුන්ගේ ආකර්ෂණයට ලක්විය.

# රණවිරු බැති ගී ගාලු මුවදොර දී





ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයෝ වෙසක් සමරුමට සමගාමීව සිය සෞන්දර්ය කුසලතා එළිදක්වමින් පසුගිය මැයි 6 වන දින ගාලු මුවදොර පිටියේදී භක්ති ගීත වැඩසටහනක් ද පැවැත්වූහ. එම අවස්ථාව සඳහා ගරු ජනාධිපති ලේකම් සමන් ඒකනායක මහතා, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය, රාජ්‍ය නිලධාරීන් සහ ආරාධිතයෝ රැසක් සහභාගී වූහ.

# පාසල් සිසුසිසුවියන්ට යුද්ධ හමුදාධිපතිගෙන් ලැප්ටොප් පරිත්‍යාගයක්



වෛද්‍ය හේතූන් මත යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම ගැන්වූ ලාන්ස් කෝප්‍රල්වරයකුගේ දියණියක් වෙත ලැප්ටොප් පරිගණකයක් පරිත්‍යාගය කිරීම ඉකුත් මැයි 23 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් සිදුවිය. අධ්‍යාපන කටයුතු සඳහා නිතැතින්ම දස්කම් දැක්වූ එම දැරිය අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ විශ්වවිද්‍යාල වරම් හිමිකරගනු ලැබූ අයෙකි. ගජබා රෙජිමේන්තුවට අනුයුක්තව සේවය කළ යුද්ධ හමුදා සාමාජිකයකු වූ ඇගේ පියා වන ලාන්ස් කෝප්‍රල් කේසීඩී මානුෂිය මෙහෙයුමේදී රණක්ෂිතයට පත්ව තිබිණ.

එසේම, යුද සේවා ලේකම් කාර්යාලයේ සේවයේ නිරත සිවිල් සේවක මහතකු වූ කේඒඑන් සරත් කුමාර මහතාගේ පුතනුවන් වෙනුවෙන් ද මෙම වැඩසටහන යටතේ ලැප්ටොප් පරිගණකයක් පරිත්‍යාග කෙරිණි. 2019 වසරේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළින් සමත් වූ එම සිසුවා ඔහුගේ ද්විතීයික අධ්‍යාපනය සඳහා කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුළත් වී ඇත.

# පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සම්පාදනය කළ ප්‍රකාශන එළිදැක්වේ





යුද්ධ හමුදා මූලස්ථානයේ පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සම්පාදනය කරනු ලැබූ මූලධර්ම ග්‍රන්ථ වන 'Special Operations Forces' Doctrine', 'Battle Group Tactics', 'Training Tactics','Infantry Platoon Basic Tactics', 'Urban Operations' සහ 'Intelligence' යන ප්‍රකාශනයන්හි මුල් පිටපත් පසුගිය මැයි 25 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ පැවති කෙටි උත්සවයකදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත පිළිගන්වනු ලැබිය.

එහිදී, පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ජීඩබ්ලිව්ජ් සෙනෙවිරත්න යූඑස්පී පීඑස්සී විසින් මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ යුද්ධ හමුදාධිපති ප්‍රමුඛ අනෙකුත් ආරාධිතයින් උණුසුම් අයුරින් පිළිගත් අතර, එම ප්‍රකාශනයන්හි මුල් පිටපත් අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී විසින් යුද්ධ හමුදාධිපති වෙත පිළිගැන්විය. මෙම අවස්ථාවේදී යුද්ධ හමුදාධිපතිගේ සුරතින් එම ප්‍රකාශනයන්හි විද්‍යුත් පිටපත් ද අන්තර්ජාලයට මුදාහරිනු ලැබිය. උත්සව අවස්ථාවට සමගාමීව පැමිණ සිටි ජ්‍යේෂ්ඨ නිලධාරීන් සඳහා ද කෘතිවල පිටපත් බෙදාදෙන ලද අතර, යුද්මය වාතාවරණයක සහ විශේෂිත අවස්ථාවන්හි අනුගමනය කළයුතු විධිවිධාන සහ යෙදවුම් ක්‍රම පිළිබඳ මෙම ප්‍රකාශනයන්හි අන්තර්ගත කරුණුවල මනාව පැහැදිළි කර ඇත.

යුද්ධ හමුදාධිපති විසින් එහි අංශ ප්‍රධානී - පර්යේෂණ විශ්ලේෂණ යෝජනා හා සංවර්ධන බ්‍රිගේඩියර් එච්සීඑල් ගලප්පත්ති ආර්එස්පී යූඑස්පී සමගින් එම අංශයේ නිරීක්ෂණ චාරිකාවක ද නිරත වූහ. එහිදී, අදාළ අංශය විසින් නිර්මාණය කරන ලද නවෝත්පාදන කිහිපයක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඒවා බිහිකිරීමට දායකත්වය දැක්වූ කාර්ය මණ්ඩලය ද ඇගයීමටද ලක් කරනු ලැබිය. එම නවෝත්පාදනයන් අතර නියමුවන් රහිත ගුවන් යානයක්, ත්‍රිමාණ සිතියම්කරණ උපකරණයක්, වායු පෙරහන පිරිසිදු කිරීමේ යන්ත්‍රයක්, අඩු වියදම් මල්ටි බැරල් රොකට් දියත් කිරීමේ ආරෝපණ නියාමකයක්, රථ වාහන වේග සීමාව දක්වන දර්ශකයක් සහ 'CDI Ignition Coil Spark Plug Testing' යන්ත්‍රයක් විය.

# ඉන්දීය ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධානී යුද්ධ හමුදාධිපති හමුවෙයි

ඉන්දීය ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධානී එයාර් චීෆ් මාර්ෂල් විවේක් රාම් චෞද්‍රි (Air Chief Marshal Vivek Ram Chaudharii) පසුගිය මැයි 03 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය.



යුද්ධ හමුදා මූලස්ථානය වෙත සපැමිණි ඉන්දීය ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධානී, වෙත යුද්ධ හමුදා හටපිරිස් විසින් එහිදී හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ සහ සම්මාන මුරයේ ගෞරවාචාරය ද පිරිනමනු ලැබූහ. සිය සංචාරය සිහිවනු වස් එම අවස්ථාවට එක්වූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග ඉන්දීය ගුවන් හමුදා මාණ්ඩලික ප්‍රධානී සමූහ ඡායාරූපයකටද එක්වූහ. අනතුරුව එතුමන් යුද්ධ හමුදාධිපති කාර්යාලයේ පැවති සුහද හමුවේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට සහ ඉන්දීය ගුවන් හමුදාවට වැදගත් වන ද්විපාර්ශ්වික කරුණු සහ ඒ ආශ්‍රිත ගැටලු පිළිබඳවද අවධානය යොමු කරන ලදී.

# බුහුමන් මැදින් අභිමන් ගමනකට සුබපැතුම්



පසුගිය මැයි මස 19 දිනට යෙදුන ජාතික රණවිරු අනුස්මරණ දිනයට සමගාමීව උසස්වීම් ලැබූ යුද්ධ හමුදාවේ මේජර් ජෙනරාල් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 7 දෙනකු වෙත නිල ලාංඡන පැළඳවීම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් පසුගියදා යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණ.

යුද්ධ හමුදා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් පීජීසී ප්‍රනාන්දු යූඑස්පී, පුහුණු අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී පීඑස්සී, ක්‍රියාන්විත අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් එස්ඒඑන්ඩී එදිරිසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එච්ඩීඑම්සී පීඑස්සී, ජාතික ආරක්ෂක විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපදේශක (යුද්ධ හමුදා) මේජර් ජෙනරාල් සීඑස් මුණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී, යුද්ධ හමුදා යුද විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ අධ්‍යක්ෂ (ක්‍රියාන්විත සහ සැලසුම්) මේජර් ජෙනරාල් එම්එස් දේවප්‍රිය යූඑස්පී එන්ඩීසී සහ ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් කේඑම්එස් කුමාර වෙත එහිදී යුද්ධ හමුදාධිපති ගේ සුරතින් නිල ලාංඡන පැළඳවීමෙන් අනතුරුව සංකේතාත්මකව අසිපත් ප්‍රදානය කෙරිණි.





# ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායට නව බළලත් නිලධාරී සහ සැරයන් නිවස්නයක්

කොළඹ 15, මෝදර ප්‍රදේශයේ ස්ථාපිත ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ බළලත් නිලධාරී සහ සැරයන් නිවස්නය ඉකුත් මැයි 25 වන දින විවෘත කෙරිණ. එම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති සහ ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී ගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.

ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ හටපිරිස්හි සහයෝගය මත 1 ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ හටපිරිස් විසින් මෙම දෙමහල් බළලත් නිලධාරී සහ සැරයන් නිවස්නයේ ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලැබූ අතර එය භෝජනාගාරයක්, රූපවාහිනී නැරඹුම් මැදිරියක්, මුළුතැන්ගෙයක්, අමුත්තන්ගේ කාමරයක් ඇතුළු නේවාසික පහසුකම්වලින් සමන්විත වේ. රෙජිමේන්තු පරිශ්‍රයෙන් නික්ම යාමට ප්‍රථම යුද්ධ හමුදාධිපති විසින් ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ කර්නල් සේනාවිධායක වෙත ක්‍රියාන්විත රාජකාරීන්හිදී භාවිතා කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය වෙතින් නිෂ්පාදනය කළ බිම්බෝම්බ ප්‍රතිරෝධක ආරක්ෂිත රථයක් ද ප්‍රදානය කරනු ලැබීය.

# එක්සත් ජනපද පැසිපික් හමුදා විධානයේ ඕස්ට්‍රේලියානු නියෝජිත යුද්ධ හමුදාධිපති හමුවෙයි

එක්සත් ජනපද පැසිපික් හමුදා විධානයේ ඕස්ට්‍රේලියානු නියෝජ්‍ය අණදෙන නිලධාරී මේජර් ජෙනරාල් ක්‍රිස් ස්මිත් (Major General Chris Smith) ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් ඇන්තනි සී. නෙල්සන් (Lieutenant Colonel Anthony C' Nelson), දකුණු ආසියාවේ එක්සත් ජනපද යුද්ධ හමුදා පැසිපික් විධානයේ අධ්‍යක්ෂ මේජර් ඇන්ඩෘ ටෙරූයා (Major Andrew Teruya) සහ කපිතාන් බ්‍රිට්නි ඩේවිස් (Captain Brittney Davis) පසුගිය මැයි 02 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූහ.



දෙපාර්ශ්වය අතර පැවති මෙම සුහද හමුවේදී ආසියානු පැසිපික් විධානයේ වත්මන් ආරක්ෂක කටයුතු මෙන්ම ද්විපාර්ශ්වික පුහුණු අවස්ථා තවදුරටත් පුළුල් කිරීම සහ දෙරටෙහි යුද්ධ හමුදාවන් සඳහා බලපානු ලබන අනෙකුත් කරුණු පිළිබඳව අදහස් හුවමාරු කරගත්හ.

# "අභිමංසල - 2" හි විරුවන්ගේ සුවදුක් සොයාබලමින්





ත්‍රස්තවාදීන්ට එරෙහි මෙහෙයුම්වලදී මාතෘභූමිය වෙනුවෙන් තම කායදානය ලැබදී රණක්ෂිතයට පත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන වීරෝදාර රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය ඉකුත් මැයි 27 වන දින කඹුරුපිටිය "අභිමංසල - 2" සුවතා නිකේතනයෙහි සංචාරයක නිරත වූහ.

එහි සේනාවිධායක කර්නල් ජීජීආර් මාදුගොඩ යූඑස්පී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි යුද්ධ හමුදාධිපති සහ සේවා වනිතා සභාපතිනිය රණවිරුවන් වෙනුවෙන් ඇති පහසුකම්, සිදුකරන පුහුණු හා අධ්‍යාපනික වැඩසටහන් ආදිය සොයාබලමින් ඔවුන් වෙත ත්‍යාග පාර්සල්ද පිරිනමනු ලැබූහ. තවද, එහිදී එම සුවතා නිකේතනයේ රණවිරුවන්ගේ ජල චිකිත්සක ප්‍රතිකාර සඳහා යොදා ගැනෙන පිහිනුම් තටාකයේ, පිරිසිදු කිරීමේ කටයුතු සඳහා "දියර ක්ලෝරීන්" තොගයක් ද පරිත්‍යාග කෙරිණ. වර්ෂ 2012 මෙම පුනරුත්ථාපන මධ්‍යස්ථානය ආරම්භ කිරීමෙන් පසු යුද්ධ හමුදාධිපතිතුමන් එහි සිදුකළ පළමු සංචාරය මෙය වීම විශේෂත්වයකි.

# "විශ්මිත හෙළ ඔසුව" යුද්ධ හමුදාධිපති වෙත පිළිගන්වයි

මාදුරුඔය විශේෂ බලකා පුහුණු පාසල විසින් පාලනය කරනු ලබන "Survival ඔසු උයනේ" ඇති ඖෂධ පැළෑටි පිළිබඳ ලබාගත් දැනුම භාවිතා කරමින් 3 වන විශේෂ බලකායට අයත් කෝප්‍රල් එම්ටීඅයිඑස් බණ්ඩාර විසින් රචනා කරන ලද "විශ්මිත හෙළ ඔසුව" කෘතියෙහි මංගල පිටපත යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත ඉකුත් මැයි 29 වන දින පිරිනමනු ලැබීය. එම අවස්ථාවට යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී සහ විශේෂ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද සහභාගී විය.

කෘතිය මඟින් කතුවරයා ඖෂධීය ශාක විශේෂ 100 ක් පමණ විස්තර ඉදිරිපත් කරමින් ඒවායේ විද්‍යාත්මක හා පොදු තොරතුරු, එම ශාකවල "ආයුර්වේද" වටිනාකම සහ විවිධ රෝග සුව කිරීම සඳහා එම ශාක භාවිතා කළ හැකි ආකාරය විස්තර කරයි. වර්ෂ 2018 - 2021 කාලය තුළ එම කොනොනි 'Survival Escape Evation and Combat' පිළිබඳව උපදේශකවරයෙක් වශයෙන් කටයුතු කර ඇති අතර, වර්තමානය වනවිට හෙතෙම විශේෂ බලකා පුහුණු පාසලෙහි උපදේශකවරයකු ලෙස ද කටයුතු කරයි.

කෘතිය මඟින් එම ඖෂධ පැළෑටි හඳුනාගැනීමට මාර්ගෝපදේශය සපයනු ලබන අතර, සමහර ශාක විශේෂ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති බැවින් ඒවා නැවත වගා කිරීමේ වැදගත්කම පිළිබඳවත් සඳහන් කර ඇත. යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී සහ විශේෂ බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, බ්‍රිගේඩියර් ආර්පීඑස් ප්‍රසාද් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ විශේෂ බලකා පුහුණු පාසලෙහි සේනාවිධායක කර්නල් ඩීඑස් හොරවලවිතාන ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යන නිලධාරීන්ගේ මඟපෙන්වීම යටතේ මෙම කෘතිය රචනාකර ඇත.



# යුද හමුදා පුහුණු පාසල්හි ඉදිරි සැලසුම් හා ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡාවක්





යුද හමුදා පුහුණු පාසල්හි පුහුණු කටයුතුවල ගුණාත්මක බව අඛණ්ඩව පවත්වාගෙන යාම අරමුණු කරගනිමින් 2023 පළමු කළමනාකරණ මණ්ඩල සාකච්ඡාව යුද්ධ හමුදා යුද විද්‍යාලය බුත්තල හිදී යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි 09 වන දින පැවැත්විණ. එහිදී, පුහුණු පාසල්හි ඉදිරි සැලසුම් හා ව්‍යාපෘති පිළිබඳ මෙන්ම අභිවෘද්ධිය හා ප්‍රගමනය සඳහා ඉවහල් වන කරුණු රැසක් පිළිබඳ සාකච්ඡා කරන ලදී.

මෙම විශේෂ අවස්ථාව සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී පර්යේෂණ සංවර්ධන හා මූලධර්ම අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ජීඩබ්ලිව්ඒ සෙනවිරත්න යූඑස්පී පීඑස්සී, අයවැය හා මුදල් පරිපාලන වැඩබලන අධ්‍යක්ෂ ලුතිනන් කර්නල් එස්එම් මුණසිංහ යූඑස්පී මෙන්ම යුද විද්‍යාලයේ සේනාවිධායක බ්‍රිගේඩියර් වයිඒබීඑම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ඇතුළු නිලධාරීහු පිරිසක් සහභාගී වූහ.

# "මේජර් ජෙනරාල් ජාලිය නම්මුණි" ක්‍රීඩාගාරය විවෘත කෙරේ


විජයබාහු පාබල රෙජිමේන්තුවේ පියා ලෙස සැලකෙන මේජර් ජෙනරාල් ජාලිය නම්මුණි වෙත දක්වන ගෞරවයක් වශයෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ඉදිකරනු ලැබූ "මේජර් ජෙනරාල් ජාලිය නම්මුනි" ක්‍රීඩාගාරය ඉකුත් මැයි 20 වන දින පැවති උත්සවයකදී එතුමන්ගේම සුරතින් විවෘත කරනු ලැබීය.

එහිදී, එම අවස්ථාවට සපැමිණි මේජර් ජෙනරාල් ජාලිය නම්මුණි (විශ්‍රාමික) ජ්‍යේෂ්ඨ නිලධාරීතුමන් වෙත විජයබාහු පාබල රෙජිමේන්තු අධිපති, යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික සහ 1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ප්‍රමුඛ එම රෙජිමේන්තුවේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් වෙතින් හිමිවූයේ ගෞරවණීය පිළිගැනීමකි.











පුද්ගලයින් 400 දෙනකුට පමණ අසුන්ගැනීමේ හැකියාව ඇති මෙම නවීන ප්‍රමිතීන්ගෙන් සමන්විත ක්‍රීඩාගාරය අංගසම්පූර්ණ කායවර්ධන මධ්‍යස්ථානයක්, ඇඳුම් මාරුකිරීමේ කාමර සහ ප්‍රභූ විවේකාගාරයකින් සමන්විත වේ. ක්‍රීඩාගාරය විවෘත කිරීමෙන් අනතුරුව මේජර් ජෙනරාල් ජාලිය නම්මුණි (විශ්‍රාමික) එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සහ ඒ අවට සිදුකර ඇති නව සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳ නිරීක්ෂණ චාරිකාවකද නිරත වූයේය. මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී ප්‍රස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු ජ්‍යේෂ්ඨ නිලධාරීන්, රෙජිමේන්තු මන්ත්‍රණ සභාවේ සාමාජිකයින් සහ රෙජිමේන්තු කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් රැසක්ද සහභාගී වූහ.

# ගුරුනගර් වෙරළ තීරය පිරිසිදු කෙරේ

51 වන පාබල සේනාංකයේ හටපිරිස් විසින් වෙරළබඩ හා සමුද්‍ර සම්පත්වල වැදගත්කම සහ ඒවා සංරක්ෂණය කිරීම පිළිබඳව පොදු ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් ගුරුනගර් වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් ප්‍රදේශවාසීන් සමග එක්ව ඉකුත් අප්‍රේල් 24 වන දින සිදුකරනු ලැබූහ. මෙම වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ සමුද්‍ර පරිසර සංරක්ෂණ අධිකාරිය විසින් සිදුකළ අතර, ඉවතලන ද්‍රව්‍ය, පොලිතීන්, ප්ලාස්ටික් බෝතල්, හිස්කැන් වැනි ද්‍රව්‍ය හේතුවෙන් දැඩිලෙස දූෂණයට ලක්ව් තිබූ වෙරළ තීරයෙන් ඒවා ඉවත්කිරීම සිදුකරන ලදී. ඒ සඳහා යාපනය දිස්ත්‍රික් ලේකම් ඒ. සිවබාලසුන්දරම් මහතා, ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී, 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ඇතුළු ත්‍රිවිධ හමුදා සාමාජිකයින්, පොලිස් නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, බාලදක්ෂයින්, පාසල් සිසු සිසුවියන් රැසක් සිය දායකත්වය ලබාදුන්හ.



# කොත් පැළඳවීමේ අවස්ථාවට එක්වෙමින්



යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකළ යාපනය ඓතිහාසික තිස්ස රජමහා විහාරයේ චෛත්‍යරාජයාණන් වහන්සේගේ කොත පැළඳවීමේ පුණ්‍යෝත්සවය ඉකුත් අප්‍රේල් 27 වන දිනට යෙදුණු සුබ මොහොතින් සිදුකරන ලදී. කන්කසන්තුරය තිස්ස රජමහා විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය ගිංතොට නන්දාරාම හිමි ඇතුළු මහා සංඝරත්නය සහ ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීබ්එස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී එහි ප්‍රධානත්වය දැරූහ.



# යුද්ධ හමුදා විධායක ජෙනරාල්, වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ නිල සංචාරයක





යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එම්ඩීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් ඉකුත් මැයි 22 වන දින වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ නිල සංචාරයක නිරත වූහ. එම මූලස්ථානය යටතේ ස්ථාපිත සියළුම සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන සහ ඒකකයන්හි පාලන කටයුතු පිළිබඳව සොයාබැලීමේ අරමුණින් මෙම සංචාරය සිදුකරනු ලැබීය.

එහිදී, යුද්ධ හමුදා විධායක ජෙනරාල් විසින් ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) යටතේ ස්ථාපිත සියලුම සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, මාණ්ඩලික නිලධාරීන් සහ ඒකක අණදෙන නිලධාරීන් සමඟ එක්ව එම ආයතනවල පාලන කටයුතු සම්බන්ධ කරුණු සාකච්ඡා කරමින් ඉදිරි කටයුතු සිදුකරගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

# විශේෂ අතිරේක ප්‍රහාරක බණ්ඩ පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන්





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ගේ අධීක්ෂණය යටතේ පොම්පේමඩු බළඇණි පුහුණු පාසල මගින් පවත්වනු ලැබූ විශේෂ අතිරේක ප්‍රහාරක බණ්ඩ පුහුණු පාඨමාලා අංක - 05 ඉකුත් අප්‍රේල් 27 වන දින එම පුහුණු පාසල් පරිශ්‍රයේදී සාර්ථකව අවසන් විය. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා (වන්නි) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික බ්‍රිගේඩියර් එස්පීජී ගමගේ ආර්ඩබ්ලිව්පී යූඑස්පී සහභාගී වූයේය.

ජී.පී.එස් යන්ත්‍ර හැසිරවීම, ආත්මාරක්ෂක සටන් කලාව (කරාතේ), අවි රහිත සටන් ක්‍රම, විශේෂ පුද්ගලයින් ආරක්ෂා කිරීම, වෙඩි ද්‍රව්‍ය හඳුන්වාදීම හා බිඳ හෙලීම, අවි හැසිරවීම හා ජීව වෙඩි තැබීම මෙන්ම යුද මූලධර්ම හා අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී පිළිබඳ ප්‍රායෝගික මෙන්ම න්‍යායාත්මක පුහුණුවක් එහිදී ලබාදෙන ලදී. වන්නි මූලස්ථානය යටතේ ස්ථාපිත 21, 54, 56, 62, සහ 65 වන පාබල සේනාංක යටතේ පාලනය වන බළඇණි අතුරින් තෝරාගත් බණ්ඩ 10 ක් නියෝජනය කරමින් නිලධාරීන් 10 දෙනකු සහ සෙසුනිලයන් 250 දෙනකු ඊට සහභාගී වූහ.






# 37 වන වාර්ෂික මහා කන්තූරි සැමරුම

ගරීබ් නවාස් පදනම විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන මහා දානමය පිංකම පසුගිය වසර 36 පුරාවට ඉන්දියාවේ අජ්මීර්හිදී සදාකාලිකත්වයට පත් වූ හස්රත් කවාජ් මුයිනුදීන් චිස්ති රලියල්ලාහු අන්හු නමින් පවත්වන අතර, මෙවරද ඉතා උත්කර්ෂවත් අයුරින් 37 වන වාර්ෂික මහා කන්තූරි සැමරුම ඉකුත් මැයි 17 වන දින කාත්තන්කුඩි - ක්වාජාජි මජ්ලිස් ශාලාවේදී පැවැත්විණ. ඒ සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති, මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී සහභාගී විය.

# නව නිලධාරී නිවස්නය විවෘත කෙරේ



නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ සේවයේ නියුතු මේජර් නිලයේ නිලධාරීන් වෙනුවෙන් නවතමයෙන් ඉදිකරන ලද ගොඩනැගිල්ල ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ සුරතින් ඉකුත් මැයි 18 වන දින විවෘත කෙරිණ. ආරක්ෂක සේනා ආඥාපතිගේ උපදෙස් මත එහි ඉදිකිරීම් මාස පහක් වැනි කෙටි කලක් තුළදී සිදුකිරීම විශේෂත්වයකි.

## අභිනවයෙන් ඉදිකරන ලද භික්ෂුණී ආරාමය සසුනට පූජා කෙරේ





අරලගංවිල වජිරා ධම්මදීප මෙහෙණින් වහන්සේගේ ඉල්ලීම පරිදි එම පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකරන ලද භික්ෂුණී ආරාමය අරලගංවිල වජිරා ධම්මදීප භික්ෂුණිය වෙත පූජා කිරීම ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි 06 වන දින සුබ මොහොතින් සිදුකෙරිණ. ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපතිගේ මගපෙන්වීම යටතේ 12 වන ගැමුණු හේවා බලඇණියේ සහ 2 (සේවා) ශ්‍රී ලංකා සංඥා බලකායේ භටපිරිස් විසින් එහි ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද අතර, ඒ සඳහා මනම්පිටිය මෝටර්ස් සභාපති අශෝක පලන්සූරිය මහතා විසින් ධන පරිත්‍යාගය සිදුකරන ලදී.

# යුද්ධ හමුදා කාන්තා ධාවන පැදි කණ්ඩායමක් ස්ථාපනය කෙරේ

මුලතිව් සහ කිලිනොච්චි බලප්‍රදේශය තුළ හදිසි අවශ්‍යතාවන්වලදී ක්ෂණිකව ක්‍රියාත්මක වීම සඳහා ධාවනපැදි බණ්ඩයක අවශ්‍යතාව කලක සිට පැවතිණ. ඒ අනුව මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ අදහසකට අනුව 4(සෙව්) කාන්තා බලකායේ සෙබලියන් 08 දෙනකුගෙන් යුත් ධාවනපැදි බණ්ඩයක් එහි පසුගියදා ස්ථාපනය කරනු ලැබීය.

මෙම බණ්ඩය සඳහා පැවති පාඨමාලාව අවසානයේ ඔවුන් හට රාජකාරි සඳහා අවශ්‍ය යුද්ධ හමුදා බඩු භාහිරාදිය ලබාදීම ඉකුත් අප්‍රේල් 21 වන දින ආඥාපතිගේ සුරතින් සිදුකෙරිණ.



# හෙට දිනන දරු දැරියන්ට රණවිරු අතහිත





මුතියන්කඩ්ඩුකුලම් වම් ඉවුර රජයේ දමිළ මිශ්‍ර පාසල, දකුණු ඉවුර රජයේ දමිළ මිශ්‍ර පාසල හා මුත්තුවිනායගපුරම් ප්‍රාථමික පාසල් තුනහි ඉගෙනුම ලබන සිසු දරු දැරියන් 603 දෙනකු වෙත රුපියල් 120,0000.00 ක මූල්‍ය වටිනාකමකින් යුත් පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් මැයි 10 වන දින සිදුකෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී සහභාගී විය. මහරගම ලක්ධන බැක් බෙන්ච් මාධ්‍ය ආයතනයේ දායකත්වය මත මෙම පාසල් උපකරණ පරිත්‍යාග කෙරිණ. මෙම අවස්ථාවට 64 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, මහරගම ලක්ධන බැක් බෙන්ච් මාධ්‍ය ආයතනයේ අධිපති තිළිණි අතුකෝරල මහත්මිය ඇතුළු එම කාර්ය මණ්ඩලයේ පිරිසක් සහභාගී වූහ.

# නිසට සෙවණක්





කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෝපිවත්ත ප්‍රදේශයේ වෙසෙන ආර්ථික අපහසුතා මධ්‍යයේ දිවිගෙවන පවුලක් වෙනුවෙන් ඉදිකරනු ලැබූ නව නිවසක් පසුගිය මැයි 22 දින පැවති කෙටි උත්සවයකදී නිවාසලාභී පවුලේ සාමාජිකයන් වෙත පවරාදෙනු ලැබීය. 612 වන පාබල බලසේනා බලප්‍රදේශයේ පිහිටි 12 වන ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ හටපිරිස් පරිත්‍යාගශීලීන්ගේ අනුග්‍රාහකත්වය ඇතිව මෙම කටයුත්ත සිදුකළහ.

දරුවන් සිවුදෙනකු සමගින් ආර්ථික අපහසුතා මධ්‍යයේ දිවිගෙවන මෙම කාන්තාවගේ පවුල පිළිබඳ දැනුවත් වීමෙන් අනතුරුව එම ප්‍රදේශයේ පරිත්‍යාගශීලීන් සහ දානපතියන් කිහිපදෙනකු මෙම නව නිවස ඉදිකරදීමට ඉදිරිපත් වී තිබිණ. බටහිර ආරක්ෂක සේනා ආඥාපති ගේ අධීක්ෂණය යටතේ *TDK Trade Links Pvt Ltd* සමාගම වෙතින් ලබාදුන් මූල්‍ය අනුග්‍රාහකත්වය මත එම ආරක්ෂක සේනා මූලස්ථානයේ හටපිරිස් මෙම නව නිවස ඉදිකිරීම සඳහා අවශ්‍ය ශ්‍රම දායකත්වය සහ තාක්ෂණික දැනුම ලබාදුන්හ.

මෙම ව්‍යාපෘතිය සඳහා ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය වෙතින් රු. 300,000/= ක් සහ සිවිල් සම්බන්ධීකරණ කාර්යාලයේ සම්බන්ධීකරණය මත 12 ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ හටපිරිස් විසින් රුපියල් 486,000/= ක මූල්‍ය පරිත්‍යාග සිදුකළහ. සම්පූර්ණ ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් මිලියන 2.4 ක් විය.

ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සුරතින් පැවති මෙම නිවස භාරදීමේ අවස්ථාවට 61 පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එම්යූ හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී සහ 612 පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එම්ඩබ්ලිව්එස් මිල්ලගල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ද සහභාගී වූහ. තවද එහිදී නිවාසලාභී පවුලේ සාමාජිකයන් වෙත ගෘහ භාණ්ඩ ද පිරිනැමිණ.

# සර්වඥ ධාතු ප්‍රදර්ශන පිංකමක්

වෙසක් උත්සවය වෙනුවෙන් ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර) යුද්ධ හමුදා හටපිරිස්, යුද්ධ හමුදා බෞද්ධ සංගමය සහ "ශ්‍රී සමන් මෙත් සංසදය" එක්ව ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ සර්වඥ ධාතූන් සහ බුදුන් වහන්සේගේ ශ්‍රාවක රහතන් වහන්සේලාගේ ධාතු ප්‍රදර්ශනය කිරීමේ උත්සවයක් පනාගොඩ බෝධිරාජාරාම විහාරස්ථානයේ දී ඉකුත් මැයි 5 සහ 6 යන දෙදින තුළ පවත්වනු ලැබීය. ආරක්ෂක සේනා මූලස්ථානය - බටහිර වෙතින් "ශ්‍රී සමන් මෙත් සංසදය" සිදුකරනු ලැබූ ඉල්ලීමකට අනුව යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මගපෙන්වීම යටතේ ධාතූන් වහන්සේලා ප්‍රදර්ශනය කිරීමේ පිංකම සංවිධානය කරන ලදී.





# ප්‍රජාසත්කාරක වැඩසටහනකට එක්වෙමින්





බුත්තල අධ්‍යාපන කොට්ඨාශයේ ගෝනගංආර කණිෂ්ඨ විද්‍යාලයේ ඉගෙනුම ලබන දරු දැරියන්ගේ හා ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා 20 ශ්‍රීලංසිරෙ ඒකකය විසින් රුපියල් මිලියන 3 කට ආසන්න වටිනාකමින් යුත් ප්‍රජාසත්කාරක වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව පාසලේ දරු දැරියන්ගේ හා ප්‍රදේශයේ පවුල් 650 කට වඩා වැඩි පිරිසකගේ ප්‍රයෝජනය සඳහා ජල පිරිපහදු යන්ත්‍රයක් ස්ථාපනය කිරීම, පාසල් දරු දැරියන් සඳහා පාසල් පොත් හා උපකරණ කට්ටලය බැගින් ලබාදීම, ස්වාමීන්වහන්සේලා 15 නමක් විෂයෙහි සාංඝික දානය පිරිනැමීම හා පාසල් දරුවන් ඇතුළු දෙමාපියන් සඳහා දිවා ආහාරය ලබාදීම ආදී වැඩසටහන් ඊට ඇතුළත් විය. මෙම සත්ක්‍රියාව කොළඹ ප්‍රදේශයේ දානපතියන්ගේ ධන පරිත්‍යාගයෙන් හා යුද්ධ හමුදා මූලස්ථානයේ විනිසුරු අධිනීතිඥ ජෙනරාල් ගේ සම්බන්ධීකරණයෙන් සිදුකරන ලදි. මෙම අවස්ථාවට ආසේමු (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ, 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 121 පාබල බලසේනාවේ බලසේනාධිපති, විදුහල්පති, කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂක, සිසු දරු දැරියන්, දෙමව්පියන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

# ක්ෂණික ක්‍රියාන්විත යතුරුපැදි බණ්ඩය/අභ්‍යන්තර ආරක්ෂක බණ්ඩය තෙදින පුහුණු පාඨමාලාවක්

ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ පූර්ණ මගපෙන්වීම යටතේ ක්ෂණික ක්‍රියාන්විත යතුරුපැදි බණ්ඩය, අභ්‍යන්තර ආරක්ෂක බණ්ඩය සඳහා තෙදින පුහුණු පාඨමාලාවක් ඉකුත් අප්‍රේල් 04, 06 සහ 07 යන දිනයන්හිදී පැවැත්විණ. එහිදී, නීතිවිරෝධී රැස්වීම් විසිරුවා හැරීම හා නිවාස සෝදිසි කිරීම පිළිබඳව පුහුණු කිරීමට කටයුතු සිදුකරන ලද අතර, එම පාඨමාලාව ප්‍රවීණ පුහුණු උපදේශකයින් පිරිසක් විසින් මෙහෙයවනු ලැබූහ.








# තැන තැන වෙසක් අසිරිය





1 බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ උපදේශකත්වයෙන් සංවිධානය කරන ලද වෙසක් කලාපය හා බත් දන්සැල ඉකුත් මැයි 05 සිට 07 වන දින දක්වා කිලිනොච්චිය, ඉරණමඩු හිදී පැවැත්විණ.





ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ වෙසක් පොහොය දිනයට සමගාමීව වැලිකන්ද නගර පරිශ්‍රයේදී වෙසක් කලාපයක් සහ බත් දන්සැලක් පැවැත්විණ.



වෙසක් පොහොය දිනයට සමගාමීව කරවෙඩ්ඩි ප්‍රදේශයේ පිහිටි වතිරි ශ්‍රී පරමානන්ද ළමා සහ වැඩිහිටි නිවාසයේ නේවාසික ළමුන් සහ වැඩිහිටියන් සඳහා ඉකුත් මැයි 13 වන දින විශේෂ දිවා භෝජන සංග්‍රහයක් ලබාදෙන ලදී. 551 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්ජේ කාරියකරවන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ මඟපෙන්වීම මත මෙම සත්කාරය සිදුවිය.

17(සෙව) ගජබා රෙජිමේන්තු අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ එම ඒකක හටපිරිස් විසින් වෙසක් පොහොය දිනය නිමිත්තෙන් ඉකුත් මැයි 05 වන දින සිවිල් වැසියන් හට සිසිල්පැන් දන්සැලක් පවත්වන ලදී.





ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී පීඑස්සී ගේ අදහසකට අනුව ජාතීන් අතර ආගමික සංහිඳියාව ඇතිකිරීමේ පරමාර්ථයෙන් යාපනයෙහි රාජකාරී නියුතු රණවිරුවන් විසින් බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සිහිපත් කරමින් ආගමික වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී.



මේ යටතේ 51, 52 සහ 55 සේනාංක වෙතින් සිදුකළ වැඩසටහන් අතර, ශ්‍රී නාග විහාරස්ථානයේදී බැති ගී ගායනා, වෙසක් කූඩු ප්‍රදර්ශන, ධර්ම දේශනා, පාසල් උපකරණ බෙදාදීම් හා සිවිල් වැසියන් 1500 දෙනකු සඳහා රාත්‍රී ආහාර පාර්සල් බෙදාදීම්, දන්සැල් ඇතුළු වැඩසටහන් සුවිශේෂී විය.











11 වන පාබල සේනාංක කඳවුරු පරිශ්‍රයේදී ද එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ උපදෙස් මත විචිත්‍රවත් වෙසක් කලාපයක් පැවැත්විණ. එය නැරඹීමට පැමිණි ජනතාව වෙත කොත්තමල්ලි සහ බිස්කට් දන්සැලක්ද පවත්වන ලද අතර, එම අවස්ථාවට ප්‍රදේශවාසීහු විශාල පිරිසක්ද එක්රොක් වූහ.

වෙසක් උත්සවය නිමිත්තෙන් ත්‍රිකුණාමලය හටකාර්ය සම්පාදන පුහුණු පාසල් පරිශ්‍රය තුළ ද එහි සේනාවිධායක බ්‍රිගේඩියර් ඊඑම්එම් ප්‍රනාන්දු එච්ඩීඑම්සී එල්එස්සී ඒඒටීඕ ගේ උපදෙස් මත ආගමික වැඩසටහන් මාලාවක් සංවිධානය කොට තිබිණ. එහිදී, හටපිරිස් විසින් ඉදිරිපත්කර තිබූ වෙසක් පහන් කූඩු සහ සැරසිලිවලින් අලංකාරවත් වූ එම වෙසක් සැමරුමට සිවිල් ජනතාව වෙනුවෙන් කඩල දන්සැලක්ද ඇතුළත් විය.





24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ පූර්ණ මගපෙන්වීම මත එළැඹි වෙසක් දිනය නිමිත්තෙන් ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්ට මුල්තැනක් දෙමින් ප්‍රදේශවාසීන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් තොරණ, පහන්කූඩු ප්‍රදර්ශන හා දන්සැල් රැසක් පැවැත්විණ.





23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ ප්‍රධානත්වයෙන් එම පාබල සේනාංකයේ නිලධාරීන් සහ හටපිරිස් වෙසක් උත්සවය සැමරීම වෙනුවෙන් වැඩසටහනක් සංවිධානය කළහ. ඊට දන්සැල්, වෙසක් සැරසිලි නිර්මාණ රැසක් එක්කොට තිබිණ.

64 වන පාබල සේනාංකය මගින් සංවිධානය කළ වෙසක් පහන්කූඩු ප්‍රදර්ශනයක් ඉකුත් මැයි 05 වන දින ඔඩ්ඩුසුඩාන් නගරයේදී පවත්වන ලදී. මේ සඳහා එම සේනාංකය යටතේ ඇති 641, 642, 643 වන පාබල බලසේනා හා 8 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව, 14 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, 23 විජයබාහු පාබල රෙජිමේන්තුව සහ 17 (සේවා) ගජබා රෙජිමේන්තුව වෙතින් අලංකාර වෙසක් කූඩු රැසක් ඉදිරිපත් කොට තිබිණ. එම නගරයේ ජීවත්වන 3000 කට ආසන්න දමිළ ජනතාව සිය දූ දරුවන් සමගින් මෙම වෙසක් කලාපය නැරඹීම සඳහා පැමිණි අතර, ඔවුන් වෙනුවෙන් බතිස් හා තේපැන් දන්සැලක්ද පවත්වන ලදී.







1 බලකාය යටතේ පාලනය වන 58 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ඇතුළු සියලු නිලයින් මෙවර උතුම් සම්බුදු තෙමඟුල සිහිපත් කරමින් ආගමික කටයුතු රැසකට සම්බන්ධ වූහ. එහිදී, ගරුතර සංඝරත්නය වැඩම කරවා දහවල් දානය පිරිනැමීම, එදින පස්වරුවේදී කඳවුරු පරිශ්‍රයේ බෝධි පූජා පිංකමක් පැවැත්වීම, කඳවුර අසල ඇති අභයාරාම විහාරස්ථානය වෙත බුදුපිළිම වහන්සේ නමක් පෙරහැරෙන් වැඩම කරවීම සිදුවිය. තවද, විශේෂ බලකායේ සේවය කර පසුව 3 වන පාබල රෙජිමේන්තුවේ රාජකාරී නිරතව සිටියදී මව්බිම වෙනුවෙන් තම ජීවිතය පූජාකළ මේජර් සමන්තිලක සේපාල දහනායක විරෝදාර රණවිරුවා හට නිවන්සුව පතා එම නිලධාරීගේ මැණියන් හා සේනාංකාධිපති ගේ සහභාගීත්වයෙන් මරණයට කැපවුණ ගවයකු නිදහස් කිරීමද සිදුකෙරිණ. තවද, එහි පහන්කූඩුවලින් සමන්විත විචිත්‍රවත් වෙසක් කලාපයක්ද පැවැත්විණ.





මාන්කුලම් ශ්‍රී සුගත විහාරස්ථානයේ දාගැබ, බුදුමැදුර, වලාකුළුබැම්ම හා භාණ්ඩාර කුළුණ රුපියල් 300,000.00 ක මුදලක් වැයකර ප්‍රතිසංස්කරණය කොට වෙසක් පොහොය දිනයට සමගාමීව ඉකුත් මැයි 05 වන දින විවෘත කෙරිණ. 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මඟපෙන්වීමෙන් 573 වන පාබල බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ සිදුවූ මෙම සත්කාරය සඳහා ආර්එම් රවිශාන්ත, මනෝජ් චන්දිම විමලනාත්, චන්දශාන් ප්‍රනාන්දු යන මහත්වරු අනුග්‍රාහකත්වය දැක්වූහ. තවද, මෙදිනම එම බලප්‍රදේශයේ සිවිල් වැසියන් සඳහා බත් දන්සැලක් ද පවත්වන ලදී.





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ගේ මඟපෙන්වීම යටතේ එම ආරක්ෂක සේනා බලප්‍රදේශයේ රාජකාරී නියුතු යුද, ගුවන් හා නාවික සාමාජිකයින් උදෙසා "සිත් නිවාලන අමා බුදුගුණ සුවඳ" නමින් ආධ්‍යාත්මික ප්‍රවර්ධනය ඇතිකිරීමේ සුමුදුර ධර්ම දේශනයක් බෙලිහුල්ඔය භාවනා මධ්‍යස්ථානයේ විහාරාධිපති  බලංගොඩ රාධ ස්වාමීන් වහන්සේ විසින් සිදුකළ සේක. වන්නි මූලස්ථානයේදී පසුගිය අප්‍රේල් 24 වන දින පවත්වන ලද මෙම පිංකම සඳහා ආරක්ෂක සේනා (වන්නි) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික බ්‍රිගේඩියර් එස්පීජී ගමගේ ආර්ඩබ්ලිව්පී යූඑස්පී ඇතුළු එම බලප්‍රදේශයේ රාජකාරී නියුතු ත්‍රිවිධ හමුදා සාමාජික සාමාජිකාවන් 1200 කට වැඩි පිරිසක් සහභාගී වූහ.





බූස්ස පිහිටි 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එම්යූ හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී ගේ මඟපෙන්වීමෙන් එම සේනාංකය යටතේ ස්ථාපිත බලසේනා සහ ඒකක සමග එක්ව ඉකුත් මැයි 05 වන දින බත් දන්සැලක් සහ වෙසක් කලාපයක් පවත්වනු ලැබීය. මෙම දන්සැල කොළඹ-ගාල්ල ප්‍රධාන මාර්ගයෙහි ගමන්ගත් බැතිමතුන්ගේ ඉමහත් ප්‍රසාදයට ලක් විය.

# යුද්ධ හමුදාවේ මැදිහත්වීමෙන් අතරමං වූවන් සොයාගැනේ



2023 මැයි 09 වන දින ත්‍රිකුණාමලය කුඹුරුපිටිඩි මඩුවන්කුලම් සහ පුනෙයි - ආරු කැලෑ ප්‍රදේශයේ අතරමං වූ සිවිල් වැසියන් 04 දෙනකු සොයාගෙන නිරුපද්‍රිතව භාරකරුවන් වෙත භාරදීමට 17 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ භටපිරිස් කටයුතු කළහ. විදි වෙළෙන්දන් වූ මෙම ගම්වාසීන් කැලෑවෙන් කඩා ගන්නා පලතුරු සහ දර වැනි දෑ අලෙවි කරන්නන් වන අතර, ඔවුන් ඉකුත් මැයි 08 වන දින අළුයම "පලු"නෙලීම සහ දර එකතු කිරීම සඳහා අදාළ කැලෑ ප්‍රදේශයට ගොස් ඇත. සිය කටයුතු නිමවීමෙන් පසු සවස අඳුරත් සමග නැවත තම ගම්මානයට යාමට ඇති මාර්ගය සොයාගත නොහැකිව තිබූ ඔවුනට දුරකථන මාර්ග ඔස්සේ ගම්වාසීන් සම්බන්ධ කර ගැනීමට දැරූ උත්සහයන්ද අසාර්ථක වී අවසානයේ එහි අතරමංවී ඇත.

අනතුරුව කුඹුරුපිටිඩි පොලිස් ස්ථානයේ ඉල්ලීම මත 221 වන පාබල බලසේනාවේ බළසේනාධිපතිගේ අධීක්ෂණයෙන් 17 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ සෙබළු මැදිහත්ව එහි ගම්වාසීන් සමග එදින රාත්‍රි පුරා සිදුකරන ලද සෝදිසි මෙහෙයුමකින් පසු මැයි 09 වන දින උදෑසන එම අතුරුදහන් පිරිස සොයාගැනීමට සමත් වූහ. මෙම සෝදිසි මෙහෙයුම මගින් යුද්ධ හමුදා භටපිරිස් පිරිමි පුද්ගලයකු සහ ගැහැණු පුද්ගලයින් තිදෙනකු ආරක්ෂිතව ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් වෙත භාරදෙනු ලැබූහ.




# ජන දිවියට විරු සත්කාරයක්

521 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් එම්එච්ආර් ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පීගේ මගපෙන්වීම යටතේ එහි සිවිල් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ අධීක්ෂණයෙන් අච්චුවේලි, වල්ලෙයි සහ උාරික්කාඩු ප්‍රදේශවල තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියළි සලාක ඇසුරුම් 50 ක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 2023 මැයි 12 වන දින එම බලසේනා මූලස්ථානයේදී පැවැත්විණ.

# විරු සරණින් දෙපයට වාරුවක්



සුගන්ධිපුරම් ග්‍රාමසේවා වසමේ පදිංචි 07 දෙනකුගෙන් යුත් දිළිඳු පවුලක උපතින්ම ඇවිදීමට නොහැකි වයස අවුරුදු 15 ක් වන ජීවන් කුමාර් ධනුෂ් නමැති පිරිමි දරුවා වෙත රෝද පුටුවක් පරිත්‍යාග කිරීමට 9 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවට අයත් නිලධාරීහු හා භටපිරිස් දායක වූහ. සිවිල් වැසියන් සහ යුද්ධ හමුදාව අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ උපදෙස් මත 681 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ අධීක්‍ෂණයෙන් මෙම කටයුත්ත සිදුවිය. 9 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ අණදෙන නිලධාරී මේජර් එච්පීඅයි කුමාර ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි 05 වන දින මෙම රෝද පුටුව පරිත්‍යාග කළ අතර, එදින ඔවුන් වෙත වියළි සලාක තොගයක්ද පිරිනමන ලදී.

# වැඩිහිටියන් හා දූදරුවන් වෙත රණවිරු සත්කාරයක්



රාජගිරිය ගැලවීමේ හමුදාවේ වැඩිහිටි නිවාසයේ අයවලුන් හා කාර්ය මණ්ඩලයේ 45 දෙනකු වෙත දිවා ආහාරය ලබාදීම මෙන්ම එහි ළමා නිවාසයේ දරුවන් හා කාර්ය මණ්ඩලයේ 30 දෙනකු වෙත දිවා ආහාරය සහ පාසල් උපකරණ ලබාදීමේ වැඩසටහනක් ඉකුත් මැයි 04 වන දින සිදුකෙරිණ. 144 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ ප්‍රධානත්වයෙන් පැවති එම අවස්ථාවට එම බලසේනා මූලස්ථානයේ ජ්‍යේෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්, එහි සිවිල් සම්බන්ධීකරණ නිලධාරී සහ එම බලසේනාව යටතේ ඇති සියලු ඒකකවල අණදෙන නිලධාරීහුද එක්වූහ.

## අභිමානවත් 12 වන සංවත්සරය සමරමින්





12 වන පාබල සේනාංකයේ 12 වන සංවත්සරය එහි සේනාංකාධිපති මේජර් ජෙනරල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ මගපෙන්වීම යටතේ පසුගියදා අභිමානවත්ව පැවැත්විණ.

## 33 වන බළඇණි සංවත්සර දිනය සමරමින්





7 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සිය 33 වන බලඇණි සංවත්සරය වව්නියාව, ඕමන්තයේ පිහිටි යුද්ධ හමුදා කඳවුරේදී ඉකුත් මැයි 12 වන දින සමරන ලදී. ඒකකයේ අණදෙන නිලධාරී මේජර් ඩීඑම්ජේජ් දසනායක ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම සැමරුම් උත්සවයට වැඩසටහන් රැසක් එක්කොට තිබිණ.



## ඒකක සංවත්සරය සමරමින්

ඉකුත් අප්‍රේල් 16 වන දිනට යෙදී තිබූ 11 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 29 වන සංවත්සරය නිමිත්තෙන් වැඩසටහන් රැසක් සංවිධානය කර තිබුණි. එහිදී, ඒකකයේ සියලු නිලයින් විසින් දානමය පිංකමක් පැවැත්වීම, මානුෂීය මෙහෙයුමේදී දිවිපිදූ මෙන්ම රණසෂිතයට පත් විරුවන් සිහිකොට බෝධිපූජා පිංකමක් පැවැත්වීම ඇතුළු වැඩසටහන් කැපීපෙණුනි.

## අභිමංසල 3 අභිමානවත් සංවත්සර දිනය සමරයි

අභිමංසල 3 සුවසහන නිකේතනයේ 09 වන සංවත්සරය ඉකුත් 25 වන දිනට යෙදී තිබුණි. එහිදී සේනාවිධායක විසින් හටපිරිස් ඇමතීම, මහා සංඝරත්නය 12 නමක් වැඩමවා සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් පැවැත්වීම, පසු දින උදෑසන මහා සංඝරත්නය වෙත හීල් දානය පූජා කිරීම ඒ අතර ප්‍රධාන විය. ඒ සඳහා අභිමංසල 3 සුවසහන නිකේතනයේ සේනාවිධායක, පුනරුත්ථාපනලාභීන්, කාර්ය මණ්ඩලයේ නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් රැසක් සහභාගී වූහ.



# පෙරපාසල් දරුවන්ට භාණ්ඩ පරිත්‍යාගයක්



11 ක්ෂේත්‍ර ඉංජිනේරු රෙජිමේන්තුවේ මේජර් කේජීසීකේ කුඩාගමගේ සහ එම ඒකකයේ නිලධාරීන්, සෙසුනිලයින් එකතුව ඉකුත් මැයි 15 වන දින නාවට්කුලි ලක්දරු පෙරපාසල වෙත පරිත්‍යාගයන් සිදුකරනු ලැබූහ. එහිදී ඉගෙනුම ලබන ළමුන් 26 දෙනකු සඳහා පාසල් උපකරණ සහ ගුරුවරුන් සඳහා සාරි මෙන්ම ජල පෙරන යන්ත්‍රයක් ද පිරිනැමිණ.



# පොල් පැළ බෙදාදීමේ වැඩසටහනක්

651 වන පාබල බලසේනාව යටතේ පාලනය වන 17(සේව) ශ්‍රී ලංකා පාබල හමුදා බලප්‍රදේශයේ සිවිල් වැසියන් 200 දෙනකු සඳහා පොල් පැළ 1000 ක් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් මැයි 02 වන දින එම ඒකක මූලස්ථානය ඉදිරිපිටදී එහි අණදෙන නිලධාරී සහ සියලු භටපිරිස් ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ.

# ගැබිණි මව්වරුන් හට පරිත්‍යාගයක්

11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ පසුගියදා මහනුවර ජාතික රෝහලේ නේවාසිකව ප්‍රතිකර ලබන ගැබිනි මව්වරුන් 200 දෙනකු සඳහා ප්‍රණීත දිවා ආහාර වේලක් සහ ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය භාණ්ඩ බෙදාදීමේ වැඩසටහනක් පැවැත්විණ. ඒ සඳහා අනුග්‍රාහක දායකත්වය මහනුවර අස්ගිරි මහා විහාරයේ පූජ්‍ය ශ්‍රීලානන්ද ස්වාමීන් වහන්සේ විසින් ලබාදෙන ලදී.



# ලුම්බිනි විහාරය වෙත පරිත්‍යාගයක්



කිලිනොච්චිය ප්‍රදේශයේ ස්ථාපිත ලුම්බිනි විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ බුදු පිළිරුවක් සහිත මල් ආසනයක් ඉකුත් මැයි 14 වන දින ආගමික වතාවත් මධ්‍යයේ විවෘත කෙරිණ. එහි විහාරාධිපති ඉංගිරියේ ශ්‍රී ධර්මාලංකාර ස්වාමීන් වහන්සේගේ ඉල්ලීමකට අනුව 57 වන පාබල සේනාංකයේ භටපිරිස් මෙම සත්කාරයට දායක වූහ.

# WORKSHOP ON MILITARY POLICE DESIGNATED ROLE




ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත පැවරී ඇති විෂය පරියට අදාළව රාජකාරීන් නිවැරදිව ඉටුකිරීමේදී එකී ස්වභාවයන් අනුව පැනනැගෙන ගැටළු නිරාකරණය කරගැනීම සඳහා වූ ඒකදින වැඩමුළුවක් පසුගියදා යුද්ධ හමුදා විනයාරක්‍ෂක අධ්‍යක්‍ෂ මණ්ඩලයේ දී පැවැත්විණ. විනයාරක්‍ෂාධිපතිගේ අදහසක් අනුව පැවැත්වූ මෙම වැඩමුළුවට එම බලකා අණදෙන නිලධාරීන්, පොලිස් සේවා බලකා පුහුණු පාසලේ සේනාවිධායක ඇතුළු නිලධාරීන් රැසක් සහභාගී වූහ.

මෙම වැඩමුළුව අවසානයේ සහතිකපත්‍ර බෙදාදීමේ අවස්ථාවට විනයාරක්‍ෂාධිපති මේජර් ජෙනරාල් ඒසීඑ ද සොයිසා යූඑස්පී එච්ඩීඑම්සී එල්එස්සී ප්‍රධානත්වය දැරිය.

## "නීරෝගී හමුදාවක් නීරෝගී දැයක්"





කොළඹ යුද හමුදා රෝහල විසින් සංවිධානය කරන ලද "නිරෝගී දැයක් නිරෝගී හමුදාවක් " මැයෙන් වූ දේශනයක් ඉකුත් මැයි 17 වන දින, පනාගොඩ, යුධ හමුදා කඳවුරේ, ඉංජිනේරු සේවා රෙජිමේන්තු දේශන ශාලාවේදී පැවැත්විණ. මේ සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානයේ (බටහිර) යටතේ රාජකාරී නියුතු භටපිරිස් සහභාගී වූහ. සෞඛ්‍ය සම්පන්න පුරුදු අනුගමනය කිරීමට ඔවුන් පෙලඹවීමටත්, සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම අවබෝධ කර ගැනීමටත් මෙම දේශණය ඔවුනට ඉතා වැදගත් විය. උපදේශක වෛද්‍ය සහ "නිරෝගී දැයක් නිරෝගී හමුදාවක්" ව්‍යාපෘතියේ විධායක සම්බන්ධීකරණ බ්‍රිගේඩියර් වෛද්‍ය ඒඑස්එම් විජේවර්ධන යූඑස්පී (විශ්‍රාමික) විසින් මෙම දේශනය මෙහෙයවන ලදී.

## පාඨමාලා ආරම්භය සනිටුහන් කරමින්





ජ්‍යෙෂ්ඨ නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාව - අංක 44 සහ ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලාව - අංක 65 ඉකුත් අප්‍රේල් 24 වන දින සිට ඉකුත් මැයි 20 වන දින දක්වා අම්පාර සටන් පුහුණු පාසල වෙතින් පැවැත්විණ. පාඨමාලාවන්හි ආරම්භක දේශනය එම පුහුණු පාසලේ අණදෙන නිලධාරී කර්නල් ඒකේසීඑස් ද සිල්වා ආර්එස්පී විසින් සිදුකරන ලදී.

# සංචාරයක මතක සටහන්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීකේආර් සිල්වා කේඑස්පී ඉකුත් මැයි 19 වන දින පනාගොඩ පිහිටි 2(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා කඳවුරේ සංචාරයක නිරත විය. කඳවුරු පරිශ්‍රය වෙත සපැමිණි නියෝජ්‍ය සේනාවිධායක, එම ඒකක අණදෙන නිලධාරි විසින් උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව බළඇණියේ කාර්යභාරය පිළිබඳ පැහැදිලි කරන ලදී. එහිදී, ඒකකයේ නිලධාරීන්ගේ සහ සෙසු නිලයන්ගේ පුහුණුව, යහපැවැත්ම සහ සුභසාධනයේ වැදගත්කම පිළිබඳව කරුණු අවධාරණය කරමින් නියෝජ්‍ය සේනාවිධායක හටපිරිස් අමතන්නටද කටයුතු කළේය.

# "හෑන්ඩ්බෝල්" ක්‍රීඩා වැඩමුළුවක්





කිලිනොච්චි ප්‍රදේශයේ පාසල් සිසුන්ගේ ක්‍රීඩා කෞශල්‍ය වැඩිදියුණු කිරීමේ අරමුණින් වූ "හෑන්ඩ්බෝල්" ක්‍රීඩා වැඩමුළුවක් ඉකුත් මැයි 26 සහ 27 යන දෙදින තුළ කිලිනොච්චි ක්‍රීඩා සංකීර්ණයේදී පැවැත්විණ. 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුකළ මෙම වැඩමුළුවට යුද්ධ හමුදා "හෑන්ඩ්බෝල්" සංචිතයේ සහයෝගය හිමිවිය. කිලිනොච්චි කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 10 ක සිසුසිසුවියන් 150 ක් හා පාසල් ක්‍රීඩා උපදේශකයින් 12 දෙනකු ඊට සහභාගී වූහ. යුද්ධ හමුදාව හා සිවිල් ජනතාව අතර සංහිඳියාව ඇතිකිරීමේ අරමුණින් සංවිධානය කළ මෙම වැඩමුළුව සඳහා 57 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, කිලිනොච්චි කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක අතුළු ගුරුභවතුන් හා අනෙකුත් යුද්ධ හමුදා නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# දිරියෙන් දිනන විරුවකුගේ ජන්මදින සමරමින්





ක්‍රියාන්විත හේතූන් මත තුවාල ලබා රණසිහිතයට පත්ව මිහිඳුසෙත් මැදුර සුවසහන නිකේතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන 6 වන බළඇණිය ගැමුණු හේවා රෙජිමේන්තුවට අයත් සෙ/414116 බනි II දයාරත්න සීඒඩී ගේ 43 වන ජන්ම දිනය පසුගිය මැයි 02 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු උපන්දින සැමරුම් උත්සවයක් එම සුවසහන නිකේතනයේ පවත්වන ලද අතර, එම අවස්ථාවට එහි සේනාවිධායක බ්‍රිගේඩියර් ටීඑස් බාලසූරිය ඇතුළු පුනරුත්ථාපනලාභීන් එහි කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් එක්වූහ.

# මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් විරුදිවි දිනුමට අත්වැලක්





ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ සේවයේ නියුතු භටපිරිස් සඳහා මනස පාලනය කරගැනීමට මනෝවිද්‍යාත්මක මඟපෙන්වීම සහ නීතිය පිළිබඳ මනෝවිද්‍යාත්මක පැතිකඩ යන මැයෙන් වූ එක්දින වැඩමුළුවක් පසුගිය මැයි මස 10 වන දින පනාගොඩ යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවැත්විය.

යුද්ධ හමුදාධිපතිගේ මාහැඟි අදහසකට අනුව මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ගේ අධීක්ෂණයෙන් පවත්වන ලද මෙම වැඩමුළුවෙහි සාර්ථකත්වය සඳහා ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්පීවීපී ආර්එස්පී සහ එහි කාර්යය මණ්ඩලය නොමඳ සහයක් ලබාදුන්හ.













එහිදී, නීතිඥ මේදා ද අල්විස් මහත්මිය විසින් වැඩදායී හා විනයගරුක යුද්ධ හමුදාවක් ගොඩනැගීමට අදාලව විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් "නීතිය පිළිබඳ මනෝවිද්‍යාත්මක පැතිකඩ" යන මැයෙන් දේශනයක්ද, ප්‍රවීණ මනෝවිද්‍යා දේශක අමා දිසානායක මහත්මිය විසින් හටපිරිස් අතර මානසික සෞඛ්‍යය වැඩිදියුණු කිරීමට "ප්‍රීතිමත් ජීවිතයක් සඳහා මනස පාලනය කිරීම" යන මැයෙන් ද දේශන පවත්වනු ලැබූහ. නිලධාරීන් 52 ක් සෙසු නිලයින් 750 කගේ සහභාගීත්වයෙන් පැවති මෙම වැඩසටහන මාර්ගගත තාක්ෂණය ඔස්සේ යුද්ධ හමුදාවේ 300 කට වැඩි අංශ ආයතන වෙත විකාශය කරනු ලැබීම විශේෂත්වයකි.

යුද්ධ හමුදා සාමාජිකයින් සිය වෘත්තිය තුළදී හා පෞද්ගලික ජීවිතවල ගැටළු හා අභියෝගවලට මුහුණදීමේදී අවශ්‍ය දැනුම්වත්භාවය හා මඟපෙන්වීම ලබාගැනීම සඳහා මෙම වැඩමුළුව මහත් පිටුවහලක් විය.

# 10 වන ප්‍රේමය



මම එවකට ඉදිරි ආරක්ෂක වළල්ලේ රාජකාරී කරමින් සිටියෙමි. එකල මාගේ කුළුඳුල් ප්‍රේමය වූයේ සීතාය. ඇය මා සමඟ උරණ වූයේ ආලයෙන් මත් වූ මාගේ හාද්දක් නිසාය. මන්ද යත් ප්‍රසිද්ධ ස්ථානයක එම හාද්දට මඟ පාදාගත් බැවිණි.

ඉන්පසු මාගේ ජීවිතයට එක්වූයේ ලලිතාය. පෙර වූ දෑ සිහියෙන් සිටි මා සමඟ ඇයද විරසක වූයේ හාද්දක් දීම සඳහා පාලු ස්ථානයකට කථාකළ බැවිණි.

පසු කලෙක දී ජානකී මුණගැසිණි. ඇය යතුරු ලේඛිකාවක් වූවාය. ඉතාමත් කෙටි කලකදී ඇය මා සමඟ විරසක වූයේ යතුරු ලියනයේ ආරක්ෂක සංවිධානය හා ගැලවීම, සුද්ධ කිරීම හා නැවත සවි කිරීම ගැන කථාකළ හෙයින් විය හැක.

කලක් ගතවිය. මාගේ සිතුරු දසාවේ හොඳකම නිසාදෝ තවත් ප්‍රේමයක් මෝදු වන්නට විය. ඇය ලිපිකාරිණියක් වූවාය. ඇයගේ පෙම් හසුන්වල යොමු අංකය ගැටළුවක් වූ නිසාවෙන් මා එයට ද නැවතීමේ තිත තැබුවෙමි.

ඉන්පසු සහශ්‍රයට ගැළපෙන යුවතියක් මගේ ජීවිතයට එක්විය. ඇය රම්‍යලතා වූවාය. වෘත්තියෙන් ඇය පරිගණක දත්ත ක්‍රියාකාරිණියකි. අහෝ අවාසනාවක මහත ඇය නිතරම පැවසූ Windows හා MSWord ආදි දේවල් ගැන තුෂ්නිම්භූතව බලා සිටි මා කෙරෙහි බිය වී තුලක් මතුරා ගන්නා ලෙස නිතර උපදෙස් දුන්නාය. කෙසේ වුවත්, එයද අවසන්ව ඇති බව ඊළඟ නිවාඩුවෙන් මම දැන ගතිමි.

කාලය ගතවිය. ඉන්පසු මාහට මුණගැසුණේ සුමනලතාය. ඇය පාවහන් ආයතනයක වෙළඳ සහායිකාවක් වූවාය. දිනක මා හමුවීමට පැමිණි ඇය මා පැළඳ සිටි සපත්තු යුවල පොලිෂ් කර පෙන්වීමට එයට කෙල ගැසීම හේතුවෙන් අප්‍රසාදයෙන් යුතුව ඇය මා හැර ගියේ නිමේෂයකිනි.

පසුව මට මුණ ගැසුණු ශාලිකා සෑහෙන කලක් මා සමඟ ප්‍රේමයෙන් වෙලී සිටියාය. දිනක ඇය හා සහභාගී වූ මංගල උත්සවයක දී පිගානෙන් වතුර බිව් නිසා ප්‍රේමයට වූ දෙය තේරුම් ගන්නට මට කලක් ගතවිය.

දේශානිගේ ප්‍රේමය කෙළවර වූයේ ඇගේ දෙමාපියන් බැලීමට ගොස් අනාගත බෑනාගේ දැඩි විනය පෙන්වීමට සිතා ශබ්ද නගා රපෝර්තු කිරීම හේතුවෙනි. ඒ සමඟම මා පිස්සෙක් යැයි ලේබලයක් සමගම දොට්ට බහින ලෙස මිහිරි වදනින් පැවසීමට ඇගේ පියා මොහොතකුදු පමා නොවීය.

තවත් කලදී සන්නාලි යුවතියකගේ ආදරයෙන් වෙලුනු මා හට අත්වූ ඉරණම නම් උපතින් ආබාධිත වූ ඇගේ බාල සොහොයුරා හට නිවැරදි සිරුවෙන් ඉරියව්ව ඉගැන්වීමට ගොස් මා ඇසූ මිහිරි වදන් වැල් නිසාවෙනි. එදින මාගේ පැමිණීමද ඩබල් එකේ සිදුනොවුනිනම් ..........?

# ආගමික සහජීවනය වපුරන සැමරුමක්





1 බලකායේ බලකාධිපති සහ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් නිශාන්ත මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ මඟපෙන්වීම යටතේ එම බලකායේ භටපිරිස් විසින් මානුෂීය මෙහෙයුමේදී මියගිය සියලු ජනතාවට සෙත්පැතීම සඳහා සංවිධානය කරන ලද ආගමික වැඩසටහනක් පසුගිය මැයි මස 14 වන දින කිලිනොච්චි ප්‍රදේශයේ සියලුම ජාතීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. මෙම ආගමික වැඩසටහන් කිලිනොච්චියේ ලුම්බිණි විහාරස්ථානය, මුරුකන්ඩි මුරුගන් හින්දු කෝවිල, මස්ජිඩුස් සලාම් ජුම්මා පල්ලිය, ශාන්ත තෙරේසා දේවස්ථානය සහ ඉරණමඩු අම්මාන් හින්දු කෝවිල යන සිද්ධස්ථානවලදී පැවැත්විණ. 1 බලකා මූලස්ථානයේ සහ ඒ යටතේ ඇති 9 ශ්‍රීලංසංබ, 6 ශ්‍රීලයුයුබ, 7 ශ්‍රීලවියාඉ යන ඒකකයන්හි සියලු නිලයන්ගේ සහයෝගයෙන් මෙම ආගමික වැඩසටහන සංවිධානය කරන ලදී.

# තුති පැසසුම් ලැබූ වගයි



මැදවච්චියේ පිහිටි 211 වන පාබල බලසේනාව විසින් පසුගිය කාලසීමාව තුළ එම ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පවුල් වෙත නිවාස ඉදිකිරීමේ කටයුතු, ආගමික ස්ථාන ඉදිකිරීම් සහ වෙනත් සමාජ සුභසාධක කටයුතු විශාල ප්‍රමාණයක් විවිධ සිවිල් ආයතන සහ පුද්ගලයින් සම්බන්ධ කරගනිමින් යුද්ධ හමුදාවේ ශිල්පීය දැනුම සහ ශ්‍රමය ඇතිව සිදුකරන ලදී.

මෑතකදී ද අඩු ආදායම් පවුල් වෙනුවෙන් එලෙස ඉදිකළ නිවාස 06 ක් ද භාරදෙන ලද අතර, ඊට කොළඹ රාජකීය විද්‍යාලේ විදුහල්පති ඇතුළු ගුරුභවතුන් සම්බන්ධ කරගනිමින් අංග සම්පූර්ණ ලෙස ඉදිකළ නිවාස 02 ක් ද අයත්විය. විශේෂයෙන්ම එම නිවාස ඉදිකිරීමේදී 211 වන පාබල බලසේනාවේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂි හා පශු සම්පත් බලකායට අයත් මේජර් ආර්එම්එස්ජේ රාජනායක යන නිලධාරී විසින් අදාළ විදුහල සමඟ සියලු කටයුතු සම්බන්ධීකරණය කරමින් ඉටුකළ කාර්යභාරය එහි විදුහල්පති හා ගුරු මණ්ඩලයේ නොමඳ පැසසුමට ලක්විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඉකුත් මැයි මස 02 වන දින අභිනවයෙන් ඉදිකළ එම නිවාස විවෘත කිරීමේ අවස්ථාවේදී විද්‍යාලයේ විදුහල්පති අතින් තත් නිලධාරී හට සමරු තිළිණයක් පිරිනමන ලදී. තත් නිලධාරී වෙත රටේ පිළිගත් උසස්ම විදුහලක් වන රාජකීය විද්‍යාලයෙන් එලෙස ඇගයුමක් හිමිවීම අනෙකුත් යුද්ධ හමුදා සිවිල් සම්බන්ධීකරණ නිලධාරීන්ටද ආදර්ශයක් සේම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රතිරූපයටද ඉහල වටිනාකමකි.

# හෙට ලොව දිනන්නට රණවිරු සත්කාරයක්



අපොස (උ/පෙළ) විභාගයෙන් සමත්ව යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ඇතුළත් වීමට සුදුසුකම් ලද යාපනය ප්‍රදේශයේ පදිංචි නිලානි ශ්‍රී ස්කන්දරාජා සිසුවියට සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට තේරී පත්වූ රූපන් ජතුර්සන් සිසුවාට යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ මැදිහත්වීම මත ලැප්ටොප් පරිගණක පරිත්‍යාග කිරීමේ මාහැඟි සත්කාරයක් ඉකුත් මැයි 14 වන දින කන්කසන්තුරය තල්සෙවණ යුද්ධ හමුදා නිවාඩු නිකේතනයේදී සිදුකෙරිණ. එම මූලස්ථාන ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ නිලධාරීගේ සම්බන්ධීකරණය මත ඕස්ට්‍රේලියාවේ පදිංචි ජුලී කැපර් මහත්මියගේ මූල්‍ය දායකත්වයෙන් එහිදී රුපියල් 386,000.00 ක වටිනාකමකින් යුත් ලැප්ටොප් පරිගණක පිරිනමන ලදී. එම අවස්ථාව සඳහා ජුලී කැපර් මහත්මිය සහ ඇගේ සැමියාද යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක්ද සහභාගී වූහ.

# මැනික්පාලම සහ ඩයගම ගොවිපලයන්හි වගා ව්‍යාපෘතිවල සාර්ථකත්වය සහ අස්වනු නෙලා ගැනේ




1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකායට අයත් මැණික්පාලම සහ ඩයගම ගොවිපලවල ඉතා සාර්ථකව සිදුකෙරෙන වගා කටයුතු පිළිබඳ සොයාබැලීම සඳහා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී විඑස්වී යූඑස්පී පසුගියදා සංචාරයක නිරත විය.

එම වගාබිම්වල කැරට්, අර්තාපල් සහ ගෝවා වගාවල අස්වනු නෙලීම මැයි මස පුරා සිදුකෙරෙන අතර, එහිදී මැණික්පාලම ගොවිපලෙහි අක්කරයක භූමි භාගයක වගාකළ අර්තාපල් වගාවෙන් කිලෝ 13,000 ක පමණ නෙලාගැනීමට හැකිවීම සුවිශේෂී කරුණකි. එසේම, එහි අක්කර දෙකක පමණ ඇති කැරට් වගාවේ අස්වැන්නද ඩයගම ගොවිපලෙහි අක්කරයක වගාකර ඇති ගෝවා අස්වැන්න නෙලීමද ජූනි මස තුළදී සිදුකිරීමට නියමිතව ඇත. මෙලෙස ලබාගන්නා අස්වැන්න සමස්ත යුද්ධ හමුදාවේ පරිභෝජනය සඳහා යොදාගැනීමට නියමිතය.







# රණකෂිතයට පත් විරුවන්ගේ සුවදුක් සොයාබලයි





කොළඹ රාජකීය විද්‍යාලයේ *Interact Club* හි සාමාජිකයින් පිරිසක් ඉකුත් මැයි 15 වන දින අත්තිඩිය මිහිඳුසෙත් මැදුර සුවසහන නිකේතනයේ සංචාරයක නිරත වූහ. එහිදී, ඔවුන් නේවාසික ප්‍රතිකාර රණවිරුවන්ගේ සුවදුක් විමසා බලා ඔවුන් හට තෑගි සංග්‍රහයක් ද පිරිනමන ලදී. තවද, එම රණවිරුවන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය සාර්ථකව කරගෙන යාමේදී අවශ්‍ය වන පරිගණක පුහුණුවීම් වෙනුවෙන් *UPS* යන්ත්‍ර 08 ක් ද ප්‍රදානය කෙරිණ. එම අවස්ථාව සඳහා මිහිඳුසෙත් මැදුර සුවසහන නිකේතනයේ සේනාවිධායක, රණකෂිතයට පත් පුනරුත්ථාපනලාභීන්, කාර්යය මණ්ඩලයේ නිලධාරීන් සහ සෙසුනිලයින් ද සහභාගී වූහ.



# ගර්භණී සෙබළියන්ට සැහැල්ලුවක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ඒකකවල රාජකාරී සිදුකරන ගර්භණී කාලසීමාව මාස 05 ට වඩා වැඩි සියලුම සෙබළියන්ට දරු ප්‍රසූතිය සඳහා රෝහල් ගතවීමේදී අනිවාර්යෙන් රැගෙන යා යුතු ළදරු භාණ්ඩ ඇතුළත් ත්‍යාග කට්ටල බෙදාදීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ගේ ප්‍රධානත්වයෙන් 2023 මැයි මස 08 වන සඳුදා දින බොරැල්ල පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිදුකෙරිණි. තවද, එම රෙජිමේන්තු මධ්‍යස්ථානය තුළ දීර්ඝ කාලයක් පුරා අඩුපාඩුවක්ව පැවති ඔලිව් රූපලාවණ්‍යාගාරය විවෘත කිරීමද එහිදී සිදුවිය. මෙමගින් යුද්ධ හමුදා සාමාජිකාවන්ගේ මෙන්ම සිවිල් ජනතාවගේද රූපලාවණ්‍ය අවශ්‍යතාවයන් ඉතා සහනදායී මිලකට මෙහිදී සපුරා ගැනීමට අවකාශය වෙන්වීම සුවිශේෂී කරුණකි.

ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති සහ  ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශ්‍යාමලි විජේසේකර මැතිණියගේ මඟපෙන්වීම මත මෙම සමාජ මෙහෙවර සිදුවිය. එහිදී, එක් ත්‍යාග පාර්සලයක වටිනාකම රුපියල් 11500 ක් පමණ වූ අතර, අදාළ ත්‍යාග පාර්සල් ගර්භණී සෙබළියන් 72 ක් සඳහා ප්‍රදානය කෙරිණ.

# ශිෂ්‍යත්ව සහ මූල්‍ය ප්‍රදානය කිරීමේ වැඩසටහනක්



ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ සේවා වනිතා ශාඛාව මගින් එම බලකායේ යුද්ධ හමුදා පවුල්වල සාමාජිකයන්ගේ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ උත්සවයක් ඉකුත් මැයි 25 වන දින රොක්හවුස් කඳවුරු පරිශ්‍රයේදී පවත්වන ලදී. එහිදී, එම බලකායේ රාජකාරි කරනු ලබන තෝරාගත් භටපිරිස් හා සිවිල් සේවක මහතුන් සඳහා මූල්‍යාධාර ප්‍රදානය කිරීම සහ සෙබළකුගේ මවක් වෙත රෝද පුටුවක් පිරිනැමීම ද සිදුවිය. ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි (වෛද්‍ය) හර්ෂිණී බෝතොට මහත්මියගේ ආරාධනයෙන් එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූවාය.

මෙහිදී, දරුවන් සඳහා රුපියල් 36,000.00 බැගින් ශිෂ්‍යත්ව 20ක් ද, ස්වයං රැකියා අවස්ථා නගාසිටුවීම සඳහා රුපියල් 60,000.00 බැගින් වූ මූල්‍ය ආධාර හතරක් ද පිරිනැමිණි. තවද, සෙබළකුගේ නිවසේ ආරක්ෂාව සඳහා තාප්පයක් ඉදිකිරීමට රුපියල් 200,000.00 ක් ද, සිවිල් සේවක මහතකුගේ නිවසේ වහල අලුත්වැඩියා කිරීම සඳහා රුපියල් 75,000.00 ක මුදලක් ද ලබාදෙන ලදී.



# සංචාරයක මතක සටහන්



ශ්‍රී ලංකා මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් තම කායදානය ලබාදුන් රාගම රණවිරු සෙවණෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන වීරෝදාර රණවිරුවන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඉකුත් මැයි 23 වන දින සංචාරයක නිරතවිය. එහිදී, එම රණවිරුවන් සමඟ සුහද පිළිසඳරකද නිරත වූ එතුමිය රණවිරුවන්ට අත්‍යවශ්‍ය පාවහන් හා කෘත්‍රිම පාද සකස් කරන නිෂ්පාදනාගාරය නිරීක්ෂණය කිරීමටද එක්වූවාය.

# කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවෙන් මාහැඟි පරිත්‍යාගයක්



2023 වර්ෂය වෙනුවෙන් පැවැත්වීමට නියමිත වාර්ෂික මහසභා රැස්වීම සහ එයට සමගාමීව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව යටතේ රාජකාරී නියුතු සිවිල් සේවක මහතුන් හට විශ්‍රාම වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 06 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස කාලතුවක්කු හමුදා කර්නල් සේනාධිනායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චාමා වනසිංහ මහත්මිය සහභාගී වූහ.

# ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවෙන් දානමය පිංකමක්





ඉංජිනේරු බලකා කර්නල් සේනාධිධායක සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් ඇඹිලිපිටිය ප්‍රදේශයේ පිහිටි කුසුමා වැඩිහිටි නිවාසය වෙත වියළි සලාක ලබාදීම සහ ඔවුන් හට ආහාර වේලක් ලබාදීමේ දානමය පුණ්‍යකර්මයක් ඉකුත් අප්‍රේල් 13 වන දින සිදුකෙරිණ. මෙම අවස්ථාවට එහි සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක් එක්වූහ.

# වෙසක් පොහොය දිනය නිමිත්තෙන් ආගමික වැඩසටහනක්





ශ්‍රී ලංකා පාබල හමුදාව වෙතින් එළැඹි වෙසක් පොහොය දිනයට සමගාමීව ධර්ම දේශනා වැඩසටහනක් එම රෙජිමේන්තු පරිශ්‍රයේදී පවත්වන ලදී. එය තිස් වසරක කුරිරු යුද්ධය වෙනුවෙන් සක්‍රීය දායකත්වය ලබාදී මියගිය විරුවන් හට ඉක්මන් සුව ප්‍රාර්ථනා කිරීමත්, රණඝිතයට පත් විරුවන් සහ දැනට රාජකාරියේ නියුතු සියලු නිලයින්, සිවිල් සේවක මහතුන් ඇතුළු ඔවුන්ගේ පවුලේ ඥාතීන් හට නීරෝගී සුවය ප්‍රාර්ථනා කිරීමත් අරමුණු විය. මෙම ධර්ම දේශනාව ගංගොඩවිල සුනේත්‍රා මහාදේවි බෞද්ධ මධ්‍යස්ථානයේ වැඩ වාසය කරන උඩුපුස්සැල්ලායායේ චන්දිම ස්වාමීන් වහන්සේ විසින් පැවැත්වූ අතර, මේ සඳහා එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ධනූෂා වීරසූරිය මහත්මිය ඇතුළු විශාල පිරිසක් එක්වූහ.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් රණවිරුවන්ගේ 2020 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 170 කට වඩා ලබාගත් දූ දරුවන් 19 දෙනකුට හා 2020 වර්ෂයේ අපොස (සා/පෙළ) විභාගයෙන් සාමාර්ථ 8 කට වඩා ලබාගත් දූ දරුවන් 6 දෙනකු සඳහා ශිෂ්‍යත්ව ආධාර ලබාදීමේ වැඩසටහනක් පසුගිය මැයි 28 වන දින එම රෙජිමේන්තු පරිශ්‍රයේදී පැවැත්විණ. තවද, එම රෙජිමේන්තුවට අයත් ක්‍රියාන්විත හේතුන් මත මියගිය පරම වීර විභූෂණ පදක්කමෙන් පිදුම්ලත් සැරයන් අනුර ඊඑම් ජේ‍යකොනොනිගේ විදේශගතව සිටින දියණිය කිසියම් අසනීප තත්වයක් හේතුවෙන් මෙරටට ගෙන්වා ගැනීම සඳහා ඊට වැයවන මුදලින් රු. 400000 ක වටිනාමකින් යුත් ප්‍රේෂණපතක් පිරිනැමීමද එහිදී සිදුවිය. එසේම, එම රෙජිමේන්තුවට අයත් රණවිරුන්ගේ පාසල් අධ්‍යාපනය හදාරනු ලබන දූ දරුවන් තිදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින පවුල්වල දරුවන් 67 දෙනකු සඳහා පාසල් නිල ඇඳුම් රෙදි හා පාවහන් යුගල බැගින්ද ප්‍රදානය කෙරිණ. මෙම අවස්ථාවට සිංහ රෙජිමේන්තු සේවාවනිතා ශාඛාවේ ඔම්ලා ජයවර්ධන මහත්මියගේ ආරාධනයෙන් හිටපු සභාපතිනියක වන රාණි ජයතිලක මහත්මිය සහභාගී වූවාය.

# එක්නැලිගොඩ විද්‍යාලය අළුත්වැඩියා කරමින්

ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය හා එහි සාමාජිකාවන්, කොළඹ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණ පීඨයේ පීඨාධිපති, කථිකාචාර්යවරු ඇතුළු එම විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සමග ඒකාබද්ධව කුරුවිට එක්නැලිගොඩ විද්‍යාලයේ ගොඩනැගිලි දෙකක් අලුත්වැඩියා කටයුතු සිදුකළහ. ඒ යටතේ එහි තීන්ත ආලේප කිරීම, වහලය සකස් කිරීම, විද්‍යාලයට අඩුපාඩුවක්ව පැවති ජල විදුලි පොම්පයක් ලබාදීම සිදුකෙරිණ. අදාළ අලුත්වැඩියා කටයුතු නිමකිරීමෙන් පසු ඉකුත් මැයි 03 වන දින එම ගොඩනැගිලි පාසල් සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදුන් අතර, එම අවස්ථාවට ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශාලිකා එදිරිසිංහ මහත්මිය සමගින් එම රෙජිමේන්තු කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඊඒඩීපී එදිරිසිංහ පීඑස්සී සහභාගී වූහ. එහිදී, එම දරුවන් සඳහා පාසල් උපකරණ පිරිනැමීමක්ද සිදුකෙරිණ.



# විජයබාහු සේවා වනිතාවෙන් ලේ දන්දීමේ වැඩසටහනක්





විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ ලේ දන්දීමේ වැඩසටහනක් පසුගිය මැයි 09 වන දින එහි සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මේ සඳහා එම රෙජිමේන්තුවට අයත් නිලධාරීන් සෙසුනිලයින් සිවිල් සේවක මහතුන් ඇතුළු 260 දෙනකු සහභාගී වූහ.

# සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවෙන් දානමය පිංකමක්





තල්ගස්ගොඩ පාර, පොල්වත්ත, අම්බලන්ගොඩ යන ලිපිනයෙහි පිහිටි වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත උදේ, දවල් සහ රාත්‍රී දානය පිළිගැන්වීමේ පිංකමක් පසුගිය අප්‍රේල් 29 වන දා සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ දායකත්වයෙන් සිදුකෙරිණ.

# "සුදන්ත සමඟ මුව හසරැලි" වැඩසටහන





*Link Natural Pvt Ltd* සමඟ සහයෝගීතාවයෙන් පනාගොඩ විරු කැකුළු පෙරපාසල විසින් "සුදන්ත සමඟ විරු කැකුළු මුවහසරලි" යන තේමාව යටතේ ජංගම දන්ත වෛද්‍ය සායනයක් ඉකුත් අප්‍රේල් 28 වන දින ශ්‍රී ලංකා සංඥා බලකා පරිශ්‍රයේදී පවත්වන ලදී. යුධ හමුදා සේවා වනිතා ඒකකයේ මගපෙන්වීම යටතේ යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මෙන්ම 'විරු කැකුළු' පෙරපාසල භාර ජ්‍යෙෂ්ඨ සාමාජිකාව වන හිමාලි පුස්සැල්ල මහත්මියගේ ප්‍රධානත්වයෙන් මෙම වැඩසටහන පැවැත්විණ.

එහිදී, විශේෂඥ දන්ත වෛද්‍ය සකුන්තලා ගුණවර්ධන මහත්මිය විසින් "මුඛ සෞඛ්‍යය" පිළිබඳ දේශනයක් පවත්වමින් දන්ත වෛද්‍යවරුන් සහ වෛද්‍ය කාර්යමණ්ඩලය සායනය ආරම්භ කිරීමට පෙර දරුවන්ගේ දෙමාපියන්ට "මුඛ සෞඛ්‍ය" පිළිබඳ උපදෙස් ලබා දෙන ලදී. අනතුරුව, දරුවන් 160 දෙනකු වෙත එහි පැමිණි ආරාධිත අමුත්තන්ගේ සුරතින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් ලබාදී තිබූ ත්‍යාග පිරිනැමීම සිදුවිය.

# සේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාගයක්

සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වනිගසේකර මහත්මියගේ අදහසකට අනුව එම බලකායේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන් 37 දෙනකු සහ ඔවුන්ගේ දූ දරුවන් වෙනුවෙන් වියළි සලාක, පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පැවැත්විණ. සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහන සඳහා සහභාගී වූ සිවිල් සේවක මහතුන් සඳහා සංගීත රසාස්වාදය සමඟින් රාත්‍රී භෝජන සංග්‍රහයක් ලබාදීමටද කටයුතු කෙරිණ.



# වෛද්‍ය බලකා සේවා වනිතා සාමාජිකාවෝ අභිමංසලෙහි සංචාරයක



වෛද්‍ය බලකා සේවා වනිතා සාමාජිකාවෝ පසුගිය අප්‍රේල් මස 29 වන දින අනුරාධපුර අභිමංසලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් සොයා බැලීම සඳහා සංචාරයක් සිදුකළහ. එහිදී, එම මධ්‍යස්ථානයෙහි රණවිරුවන් වෙනුවෙන් උදෑසන කෙටි ආහාර වේලක් සහ ත්‍යාග පාර්සල් බෙදාදීමද එහි නාන තටාකය පිරිසිදු කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමද සිදුකෙරිණ. මෙම අවස්ථාවට වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නිල්මිණි ප්‍රනාන්දු මහත්මිය ඇතුළු එම බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක් සහභාගී වූහ.

# වෙසක් පොහෝ දින නිමිත්තෙන් මාහැඟි කටයුත්තක්

යුද්ධ හමුදා යුධෝපකරණ බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරියෙහි නියුතු හටපිරිස් වෙසක් පොහෝ දිනය නිමිත්තෙන් ඉකුත් මැයි 05 වන දින දොඹගොඩ මංසන්ධියේදී ඔසුපැන් දන්සැලක් පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ බලකාධිපති සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ උපදෙස් මත සංවිධානය කළ මෙම දන්සැල සඳහා ප්‍රදේශවාසීන් විශාල පිරිසක් එක්රොක්වූහ.



# නව නිවසේ ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කෙරේ



ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය යටතේ රාජකාරී කරනු ලබන දැඩි ආර්ථික අපහසුතාවයෙන් පෙළෙන සෙ/628056 මා/සැරයන් තිස්ස කේ් යන ජේ්කොනොනි හට එම බලකා සේවා වනිතා ශාඛාවේ මූලිකත්වයෙන් ලබාදුන් රුපියල් 500,000.00 ක මුදලින් හෙට්ටිගොඩ, ඉඳුරුව ප්‍රදේශයේ නව නිවසක් ඉදිකෙරෙමින් පවතී. එහි වැඩ කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ඉකුත් මැයි 01 වන දින එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මිය ඇතුළු එහි සාමාජිකාවන් පිරිසක් සමඟින් ආඥාපති යුද්ධ හමුදා හකාස අණසක හා ශ්‍රීලවියාඉ බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී සහභාගී වූහ.

# කෘෂි හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාව





යුද්ධයේදී රණශූරත්වයට පත් රණවිරුවන්ගේ පවුල් හා දැනට සක්‍රීය සේවයේ යෙදී සිටින හා විශ්‍රාමික රණවිරුවන්ගේ පවුල්වල ආර්ථික තත්වය නගාසිටුවීම සඳහා දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන අත්කම් නිර්මාණ, කෘෂි නිෂ්පාදන, කාබනික නිෂ්පාදන ආදිය දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අලෙවි කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ උපදෙස් හා මගපෙන්වීම මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ පූර්ණ අධීක්ෂණයෙන් මෙම කටයුත්ත සිදුකෙරේ. ඒ පිළිබඳ වූ සාකච්ඡාවක් කෘෂිකර්ම හා පශු සම්පත් බලකා සේවා වනිතා සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මියගේ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකක බ්‍රිගේඩියර් (සම්බන්ධීකරණ) කර්නල් එන් මහවිතාන කේඑස්පී ගේ සහභාගීත්වයෙන් පසුගිය මැයි 26 වන දින සේවා වනිතා ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණ.



පරම වීර විභූෂණ අභිමානයෙන් පිදුම් ලැබූ විරුවෝ

## පුදුමාතලන් හිදී සිදුකරනු ලැබූ

# වීර ක්‍රියාව

සෙ/ කමා 552009 මාණ්ඩලික සැරයන් පෙරේරා කේපීවීවන් එල්ආර් පීඩබ්ලිව්වී ආර්එස්පී කමාන්ඩෝ රෙජිමේන්තුව

ලක්මව සිරස සරසන කිත් කිරුළෙහි අනගි මිණිකැට අතර දිදුලන්නට වරම් ලත්, නමින් නිරෝෂ් ලක්මාල් රුවන් පෙරේරා ද රුවන් රඳන හෙළබිමේ රුවන් පුරයෙන් උපන් මහ විරු රුවනකි.

1976 ඔක්තෝබර් මස 24 වන දා කුරුගමගේ රූබන් පෙරේරා සහ සුමනා වාසලතන්ත්‍රි දම්පතීන්ගේ පළමු පුත්‍ර රත්නය ලෙස බලංගොඩදී උපත ලත් හෙතෙම එම දෙමව්පියන්ගේ දහසක් පැතුම් අතර, සොඳුරුතම පැතුම වූවාට සැක නැත. දෙවු සොහොයුරියකට සෙනෙහෙබර මලණුවන් වූ ඔහු බාල සොහොයුරකුගේ සහ සොහොයුරියකගේ ද ආදරයට මැදිව ගතකළ ළමාවිය දෙමාපිය නෑසිය හිතමිතුරන් අතර, ප්‍රසාදය දිනාගත් සාමකාමී කාලපරිච්ඡේදයක් විය.

1982 ජනවාරි 19 දින රත්නපුර, බලංගොඩ කිරිමැටිතැන්න විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය සඳහා අත්පොත් තැබූ හෙතෙම පාසල් ප්‍රජාව අතර සහයෝගයෙන් කටයුතු කළ ශිෂ්‍ය රත්නයක්ද වූයේය. වැඩිදුර අධ්‍යාපනය සඳහා 1990 මාර්තු මස 05 වැනි දින බලංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන් විද්‍යාස්ථානයට ඇතුළත් වූ හෙතෙම පරිවේනාධිපති හිමියන්ගේ ආදරය හා අවධානය දිනාගනිමින් අධ්‍යාපන කටයුතුවල නිරතවූයේය. විෂය බාහිර ක්‍රියාකාරකම්වල හා බොක්සිං, අත්පන්දු ආදී ක්‍රීඩාවන්හිද දක්ෂතා පළකළ රුවන් පෙරේරා විනයගරුක ශිෂ්‍ය නායකයකු වශයෙන් ද සිය වගකීම් නොපිරිහෙළා ඉටුකළේය. අ.පො.ස (සා/පෙළ) විභාගයට පෙනී සිටීමෙන් අනතුරුව පාසල් අධ්‍යාපනයට සමුදුන් හෙතෙම සිය පවුල වෙනුවෙන් ඉටුවිය යුතු වගකීම් උරමතට ගත්තේ, ප්‍රාදේශීය උරුමය වූ පතල් කර්මාන්තයට ද පිවිසෙමින්ය. ඉන්පසු බලංගොඩ වෝල්ටයිල්ස් පුද්ගලික ආයතනයෙහි සේවයට බැඳුනු හෙතෙම සිය දෙමව්පියන් විසින් ගෙනයන ලද දුෂ්කර ජීවන අරගලයට අත්වැලක් වූයේය.

වසර දෙකක සේවා කාලයකින් පසු සිය වැඩිමහල් සහෝදරිය පදිංචි රත්මලාන ප්‍රදේශයට සංක්‍රමණය වූ නිරෝෂ් ලක්මාල් සිය දස්කම් මත ටයිකොන්ඩෝ සටන් කලාව වෙත ඇදී ගියේය. තම මාතෘභූමිය කෙරෙහි යුතුකම් ඉටුකළ හැකි අභිමානවත් සේවයකට එක්වීමේ අභිලාෂය ඔහු තුළ ඇතිවන්නේ 1996 කාලවකවානුවේදීය. මේ වනවිට ශ්‍රී ලාංකීය මාතෘභූමිය පුරා

පැතිර පැවතියේ කුරිරු ත්‍රස්තවාදයේ අඳුරු සෙවණැල්ලයි. එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ මිලේච්ඡ ප්‍රහාර හමුවේ මේ කාලය වනවිට ආරක්ෂක අංශ මෙන්ම සිවිල් ජනතාව ද මහත් සේ පීඩාවට පත්ව සිටියහ. විශේෂයෙන්ම උතුරු නැගෙනහිරට සීමාවී පැවති ත්‍රස්ත ක්‍රියා දකුණටත්, එනම් කොළඹ ඇතුළු තදාසන්න ප්‍රදේශ කරා ද පැතිරිණි. ආරක්ෂක අංශවල සෙබළුන් බොහෝ දෙනෙක් රට වෙනුවෙන් සිය ජීවිත පූජා කරන්නේ මේ කාලය තුළදීය. දකුණේ උපන් තරුණ විරුවන් දහස් ගණන් ආරක්ෂක හමුදාවන්ට එක්වූයේ ද මේ කාලය තුළදීමය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කමාන්ඩෝ රෙජිමේන්තුව වෙත ආධුනිකයන් බඳවාගන්නා බව දැනගන්නා නිරෝන් ලක්මාල් ත්‍රස්තවාදය මුලිනුපුටා දමන මානුෂීය මෙහෙයුමේ කොටස්කරුවකු වෙමින් රටට දැයට සිය යුතුකම ඉටුකළ යුතු අවස්ථාව මෙය බව තීරණය කළේය. ඒ අනුව 1996 ජූලි මස 04 වන දින ඔහු ඉඳුරාම බඳවාගැනීම් අංක 13 යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කමාන්ඩෝ රෙජිමේන්තුව වෙත ඇතුළත් වූයේ ස්වකැමැත්තෙනි. මෙම අවදානම් සහගත රාජකාරිය ඉටුකිරීමේදී සිය ආදරණීය පුත්‍රයාගේ ජීවිතය මව්බිම වෙනුවෙන් කැපවන බව දත් ඒ මැණියන් ඔහුගේ තීරණය අනුමත නොකළාය.



ළමා කාලයේදී

කෙසේ වුවද අවසානයේ තම දෙමව්පියන්ගේ අවසරය හා ආශිර්වාදය මැද ශ්‍රී ලංකා යුද්ධ හමුදා සිංහ රෙජිමේන්තුව වෙතින් ආධුනික පුහුණු පාඨමාලා අංක 23 සාර්ථකව හදාරන නිරෝන් ලක්මාල් රණවිරුවා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අති දුෂ්කර පාඨමාලාවක් වන මූලික කමාන්ඩෝ පාඨමාලා අංක 40 සඳහා යොමුවන්නේ නිදහස් මාතෘභූමියේ ඒකායන අවශ්‍යතාව සඳහා සිය මෙහෙවර නිසි අයුරින් ඉටුකිරීමේ අපේක්ෂාවෙනි. පසුව කමාන්ඩෝ උසස් පාඨමාලා අංක 23 ද හදාරන ඔහු අභීත රණවිරුවන් අතලොස්සකට පමණක් හිමිවන මෙරූන් හිස්වැස්ම හා කමාන්ඩෝ නිල ලාංඡන තම ආදරණීය මවගේ දෑතින් පැළඳ කමාන්ඩෝ සේවයට එක්වන්නේ රට දැය පිළිබඳව හදෙහි උපන් අභිමානී හැඟීමෙනි. නිරෝන් ලක්මාල් සිය රණවිරු දිවිය අරඹනුයේ 2 වන කමාන්ඩෝ රෙජිමෙන්තුව වෙත ඇතුළත් වීමෙන් තම පවුලේ ජීවන අරගලයට අත්වැලක් වෙමිනි. ත්‍රස්ත ග්‍රහණයට නතුව පැවති උතුරු නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාන්විත රාජකාරී සඳහා නිරෝන් ලක්මාල්ගේ දායකත්වය හිමිවන්නේ මේ සමගය. කමාන්ඩෝ සෙබළකු වශයෙන් රණබිමට පිවිසෙන නිරෝන් ලක්මාල් "ජයසිකුරු ක්‍රියාන්විතයට" තම සක්‍රිය දායකත්වය ලබාදුන් අතර, එහිදී ඔහු රණබිමේදී දැක්වූ දැඩි කර්යශූරත්වය හා කැපවීම හේතුවෙන් 1998 අගෝස්තු මස 25 වන දින ලාන්ස් කෝප්‍රල් නිලයට උසස්වීමක් ලද්දේය.



> මගේ පුතා කමාන්ඩෝ විරුවෙක්. ඔහුගේ වීරත්වයට පදක්කම් රාශියක් ලැබුනා. සටන්වලදී ලද තුවාල සුවවීමත් සමඟ නැවතත් ඔහු රුදුරු ත්‍රස්තවාදයෙන් රට මුදවා ගැනීමට යුද පිටියේදී ජීවිතය පූජාකළා. මම තනිවුනාට මුළු රටම නිදහස්. ඒක ආඩම්බරයක් හා සැනසීමක්
>
> - මව

2000 වර්ෂයේ මාර්තු මස 27 වන දින නිරෝන් ලක්මාල් ඇතුළු 2 වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ "ඩී" කණ්ඩායමේ සෙබළුන් යාපනය සෝරම්පත්තු ප්‍රදේශයේ කුඩා කණ්ඩායම් මෙහෙයුම් රාජකාරි කරමින් සිටියදී එල්ටීටීඊ ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන ලද මෝටාර් ප්‍රහාරයකින් නිරෝන් රණවිරුවා සුළු තුවාල ලද්දේය. ලද අවසරය මත සිය රාජකාරි දිවියට මද විරාමයක් ලැබූ නිරෝන් සිය ආදරණීය මව්පියන් දැකීමට පැමිණියේය. මේ කාලය තුළ ඔහු දැන හඳුනාගන්නා ඉරෝෂා උදයංගනී නම් තරුණිය 2002 වසරේදී සිය සහකාරියකොට ගත්තේය. නැවතත් 2004 වසරේදී නිරෝන් වඩාත් ප්‍රතිඵලදායී අන්දමින් කුඩා කණ්ඩායම් ක්‍රියාන්විත රාජකාරීන්හි නිරතවන අතර, මොහු අප්‍රේල් මස 25 වන දින කෝප්‍රල්වරයකු ලෙසට උසස්වීම් ලබන්නේ තම යුද්ධ හමුදා දිවිය තව තවත් වර්ණවත් කරගනිමිනි.

මේ අයුරින් 2004 වසර ඔහුගේ රාජකාරි දිවියේ වැදගත් කඩඉමක් සලකුණු කරන අතර, ඔහුගේ පෞද්ගලික ජීවිතය ද වර්ණවත් වූ වසරක් වූයේය. ඒ නොවැම්බර් මස 07 වන දින නිරෝන් ඉරෝෂා යුවලට දාව සුරතල් දියණියක් මෙලොව එළිය දුටු බැවිණි. ඈ කේ.ජී. විෂ්මි ලක්ෂාණි නම් වූවාය.

වර්ෂ 2007 මැයි මස 31 වන දින නිරෝන් ඉරෝෂා යුවළ කේ.ජී. නිකිණි තරුෂිකා නම් සුරතල් දියණිය තම ආදරණීය කැදැල්ලට කැඳවාලමින් දෙවැනි වරටත් මව්පිය පදවි ලැබීමට වරම් ලබන්නේය. නිරෝන් රණවිරුවා ක්‍රියාන්විත රාජකාරී සිදුකළේ මහත් කැපවීමකිනි. ඔහුගේ නිර්භීත බව මෙන්ම දක්ෂතාවය ද අනෙකුත් රණවිරුවන් අතර කැපී පෙනුණි. මොහුගේ මෙම විනයගරුකවූත් කාර්යශූරවූත් රාජකාරී ස්වභාවය හේතුවෙන් 2008 වසරේදී එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරී නිමකර ශ්‍රී ලංකාවට පැමිණෙන්නේ 2009 වසරේ ජනවාරි මස 01 වන දිනය. සාමසාධක රාජකාරීන් හී නිරතව සිටියදී පෙන්වූ අති දක්ෂ රාජකාරී ස්වභාවය හා දැඩි කැපවීම හේතුවෙන් සැරයන් නිලයට උසස්වීම ලබන්නේ යුද්ධ හමුදා දිවිය වර්ණවත් කරගනිමිනි.

සැබෑ රණවිරුවකු ලෙස ඔහු ඉටු කරන මෙහෙවරත්, ඔහුගේ විරෝදාර නායකත්වයත් අවස්ථා ගණනාවකදීම ඇගයීමට ලක් කෙරිණි. රණ ශූර පදක්කම, දේශපුත්‍ර සම්මානය, පූර්ණභූමි පදක්කම, උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම, නිදහස් ස්වර්ණ ජයන්ති පදක්කම, විදේශ සේවා පදක්කම ඔහු වෙත පිරිනැමෙන්නේ ඒ අභීත වීරත්වයට කෘතගුණ දැක්වීමක් වශයෙනි. එල්ටීටීඊ ත්‍රස්තවාදීහු සිය නියත පරාජය මේ වනවිටත් දැන සිටි අතර උතුරු නැගෙනහිර නිරායුධ දමිළ ජනතාව සිය දහස් ගණනක් තමන් ප්‍රාණ ඇපකරුවන් ලෙස රඳවා ගැනීමට ඔවුන් කටයුතු කරන්නේ එබැවිනි.

මේ පාපතර ක්‍රියාව ආරක්ෂක හමුදාවන්හි මෙහෙයුම් කටයුතු සඳහා ඇතිකළේ බලවත් බාධාවකි. ත්‍රස්තවාදීහු පුද්ගල නාශක බෝම්බ, ක්ලේමෝ බෝම්බ හා බර අවි ස්ථානගත කරමින් සිය ආරක්ෂක වළලු තරකර ගත්හ. පස්බැම් හා යුධ අගල් කපමින් ආරක්ෂක හමුදාවන්ට සිය ප්‍රදේශකරා පැමිණීමට තිබූ අවකාශයන් ද ඔවුහු අවහිර කළහ. මේ අවස්ථාවේ ආරක්ෂක හමුදාවන් සතුව තිබූ වගකීම අතිමහත්ය. ඔවුන් විසින් සැලසුම් සකස් කළ යුතුව තිබුණේ මේ සියලු අසීරුතා මගහරවා ගතහැකි අන්දමිනි. ඒ අනුව 2009 අප්‍රේල් 19 දින ආරක්ෂක හමුදාවෝ සැලසුම් සකස් කළහ.

මේ අනුව 2 වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ "ඒ" හා "බී" කණ්ඩායම්වලට මෙම සැලසුම්වල ප්‍රථම අදියර වශයෙන් ත්‍රස්තවාදීන් විසින් ඉදිකරනු ලැබූ පස්බැම්මේ නැගෙනහිර හා බටහිර ප්‍රදේශයේ ස්ථානගතව සිටින ත්‍රස්තවාදීන් දෙසට ප්‍රහාරයක් එල්ල කිරීමට නියමිතව තිබුණි. සතුරන් සමග සිදුකෙරුණු බිහිසුණු සටනේ කෙළවර ආරක්ෂක හමුදාවෝ ත්‍රස්තවාදීන් සිය ගණනින් විනාශ කළහ. 2009 අප්‍රේල් 19 වන දිනයේදී ප්‍රාණ ඇපකරුවන් ලෙස රඳවාගෙන සිටි සිවිල් ජනතාව ඉන් මුදාගනිමින් නිරෝන් ඇතුළු රණවිරුවෝ ජයටැඹ වෙත ළඟාවූහ.

පුදුමාතලන් යුද මුක්ත කලාපයේ ප්‍රාණ ඇපකරුවන් මුදාගැනීමේ මෙහෙයුම් අවසන් අදියරට ළඟාවෙමින් සිටියදී ත්‍රස්තවාදීන් සමග සිදුකෙරුණු ගැටුම් ද වඩාත් බිහිසුණු තත්ත්වයකට පත්ව තිබුණි. නිරෝන් ලක්මාල් අභීත රණවිරුවකු වශයෙන් සිය සගයන්ට සැබෑ නායකත්වයක් ලබාදෙමින් සිය උදාරතර මෙහෙයුම අඛණ්ඩව සිදුකළේය.

පාබල හමුදාවන්ට ත්‍රස්තවාදී ආරක්ෂක වළල්ලේ බංකර් එකින් එක ලබාදෙමින් ඉදිරියට තම ඉලක්ක කරා ගමන් කරන අවස්ථාවේ දැඩි සතුරු ප්‍රහාරයක් එක් බංකරයකින් එල්ලවිය. එහි මි.මී 12.7 අවියක් ස්ථානගතකර තිබූ අතර, එමගින් ඉදිරියට ඇදෙන නිරෝන්ගේ නායකත්වයෙන් යුතු කණ්ඩායට දැඩි ප්‍රහාරයක් එල්ලවන්නට වූ අතර, එය ඉදිරි ක්‍රියාන්විත සිදුකිරීම සඳහා දැඩි බාධකයක් විය.

කොතරම් දරුණු ලෙස ත්‍රස්තවාදීන් ප්‍රහාර එල්ල කළද තම ඉලක්කය සපුරාකර ගැනීම ඒකායන අරමුණ කරගත් නිරෝන් ඇතුළු කණ්ඩායම ප්‍රතිප්‍රහාරයක් දියත් කරමින් බර අවිය සහිත බංකරය ආසන්නයටම පැමිණියහ. මෙම ප්‍රහාර මගින් ත්‍රස්තවාදීන් විශාල පිරිසක් ජීවිතක්ෂයට පත්වූහ. සියලු උපදෙස් නිසි පරිදි ලබාදෙමින් ස්වකීය සහෝදර සෙබළුන්ගේද ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වෙමින් නිරෝන් ලක්මාල් රණවිරුවා මේ අවස්ථාවේදී ත්‍රස්වාදීන්ගේ බර අවිය විනාශ කිරීම තමන් සතුව ඇති වගකීමක් බව වටහා ගන්නා ලදී. මෙම විරෝදාර රණවිරුවා සියලු වගකීම් තම උර මතට ගනිමින් ස්වකැමැත්තෙන්ම තනිවම බංකරය තුළට කඩාවැදී බරඅවිය හසුරුවන ත්‍රස්තවාදියා හා එම අවියද එම බංකරයේ සිටි අනෙකුත් සතුරන්ද විනාශ කරන ලද අතර, මෙහිදී නොසිතූවිරූ අවස්ථාවක ක්‍රියාත්මක වූ එම බංකරය තුළ සැඟව සිටි මරාගෙන මැරෙන ත්‍රස්තවාදියකුගේ කුරිරු ප්‍රහාරයකට ගොදුරුවන්නට නිරෝල් ලක්මාල් හට සිදුවිය. අනපේක්ෂිතව එල්ලවන මෙම ප්‍රහාරයෙන් නිරෝන් ලක්මාල් රණවිරුවා දිවි පුදනුයේ ලක්මාතාවට තවත් අභීත වීර පුතණුවක අභිමානවත් කරවමිනි. නිරෝන් ලක්මාල් වැනි ශ්‍රේෂ්ඨ වීර පුත්‍රයකු මුළු මහත් ජාතියටම අභිමානවත්නේ ත්‍රස්තවාදය මුලිනුපුටා දැමූ මානුෂීය මෙහෙයුමේ අවසානය පෙනි පෙනීය.

සතුරු මරමස්ථානයක් වූ පුදුමාතලන් අත්පත්කර ගැනීමේ මෙහෙයුමේදී ත්‍රස්තවාදී පස්බැම්ම අත්පත්කර ගැනීම සඳහා උතුරු දෙසින් සතුරු බංකර් ආසන්නයට ගොස් දැඩි ප්‍රහාර එල්ලකොට සතුරන් විශාල ප්‍රමාණයක් විනාශ කරමින් සතුරු බංකරයට කඩා වැදී එහි වූ බර අවිය හා එය ක්‍රියාත්මක කරවන ත්‍රස්තවාදියා විනාශ කිරීම හා ක්‍රියාන්විතය සාර්ථකව කර ගැනීමට දැඩි අධිෂ්ඨානයෙන් හා අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව සිදුකළාවූ උත්කෘෂ්ටවූත්, වික්‍රමාන්විතවූත් මෙම නිර්භීත ක්‍රියාව වෙනුවෙන් සෙ/කමා 552009 මාණ්ඩලික සැරයන් පෙරේරා කේජීඑන්එල්ආර් ආර්එස්පී රණවිරුවා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති සහ සන්නද්ධ සේවාවන්හි සේනාවිධායක ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් වර්ෂ 2013 ක් වූ ජූලි මස 15 වෙනි දින අරලියගහ මන්දිරයේදී පරම වීර විභූෂණයෙන් පිදුම් ලැබිය.

මෙම අභීත රණවිරුවාගේ බිරිඳ වන සමරසිංහ ආරච්චිගේ දොන් ඉරෝෂා උදයංගනී මහත්මිය සහ කුඹල්මලුව මහා විදුහලේ 10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන විෂ්මි ලක්ෂාණි වන මෙම දෙපලගේ වැඩිමහල් දියණිය සහ වේයන්ගොඩ ශාන්ත මරියා විද්‍යාලයේ 7 ශ්‍රේණියේ ඉගෙනුම ලබන නිකිණි තරුෂිකා නමැති බාල දියණිය සමගින් අංක 447/බී, ජය මාවත, කුඹල්මලුව වේයන්ගොඩ යන ලිපිනයේ දැනට පදිංචිව සිටිති.



සටහන -:
"උත්තමාචාරය" ග්‍රන්ථය ඇසුරිනි...

විශේෂාංග රාශියකින් සමන්විත නව මුහුණුවරකින් එළිදක්වන රණවිරුවාහි ඔබගේ ලිපි, නිර්මාණ වෙනුවෙන් වැඩි ඉඩකඩක් වෙන් කෙරේ. ඔබ ඇසූ දුටු අත්විඳි ඕනෑම දෙයක් නිර්මාණශීලිව අප වෙත ලියා එවන්න. එසේ එවනු ලබන කවි, නිසඳැස්, කෙටිකතා, ලිපි හා ඡායාරූප ආදිය (සුදුසු ඒවා) අප්‍රමාදව රණවිරුවාහි පළකිරීමට කටයුතු යොදා ඇත. ඔබේ නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක
"රණවිරුවා"
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර,
කොළඹ.





# ඔබ ආයුෂ කෙටිකර ගන්නවාද?

පිපාසයෙන් තොරව මත්වීමෙන් තොරව සාදයකින් පිටවී යන්නාක් මෙන් ජීවිතයෙන්ද අප නික්ම යා යුතු බව ඇරිස්ටෝටල් පඬිවරයා කීවේය.

අප දිනපතා ගත කරන්නේ විවිධ ආකාරයේ පුරුදු හා ඇබ්බැහිකම්වලින් ගහණ සංකීර්ණ ජීවිතයකි. අපේ ජීවිතයේ හැඩ ගැස්මත් එහි ආයුෂ ප්‍රමාණයත් පාලනය කරනු ලබන්නේ මේ ඇබ්බැහිකම් මගිනි.

අප නොයෙකුත් ආකාරයේ ඇබ්බැහිකම්වලට ගොදුරු වන්නේ නොයෙකුත් මානසික ඉරියව් හා පෙළඹවීම් හේතු කොටගෙනය. ඇබ්බැහිකම් නැත්නම් පුරුදු හොඳ හෝ නරක වශයෙන් අපට වෙන්කළ හැකිවන අතර, නවීන විද්‍යා ගවේශකයන් විසින් සොයාගනු ලැබ ඇති පරිදි ජීවිතය කොට කරන සමහර විට වහාම මරණය පවා ගෙනදිය හැකි ඇබ්බැහිකම් ගැන පමණක් විමසා බලමු.

ජීවිතයේ අධික සැප සෙවීම හා සුඛෝපභෝගී භාණ්ඩ පරිහරණය හේතුකොටගෙන අපේ ආයුෂ කොටවන බව සොයාගෙන ඇත. සිරුරේ ලේ කැටි ගැසීම හා හෘදයාබාධ වැනි රෝග මෝටර් රථ පාවිච්චියත් සමග කිට්ටු සම්බන්ධයක් ඇතැයි මහාචාර්ය ජෝන් යුඩ්කින් නම් විද්‍යාඥයා කියයි. තට්ටු දෙකේ බස්රථ පදවන රියදුරන් ද මේ රෝගවලට පහසුවෙන්ම ගොදුරුවන බව ජේකේ මුයලි නම් වෛද්‍ය විද්‍යාඥයාගේ අදහසයි.

ශරීරයට අවශ්‍ය ව්‍යායාම නොමැති විට වැළදෙන තවත් රෝගයකි දියවැඩියාව. ව්‍යායාමය පහසුවෙන් ලබාගත හැකි ක්‍රම වශයෙන් විද්‍යාඥයන් අනුමත කරන්නේ පයින් ගමන් කිරීම, පිහිනීම හා බයිසිකල් පැදීමයි. හදවත සම්බන්ධ රෝග කිහිපයකටම

**අපේ ජීවිතයට හානිකර තවත් භයානක පුරුද්දක් නම් පසුතැවිල්ලයි. පසුගිය දේ ගැන හෝ අනාගතයේදී ඇතිවිය හැකි තත්වයක් ගැන හෝ සිතමින් පසුතැවිලි වීම සිරුරට ඉතාමත් හානිකරය.**

අපේ නරක පුරුදු අතරින් ඉතාම භයානක පුරුද්ද වශයෙන් විද්‍යාඥයන් හඳුන්වන්නේ වැඩියෙන් ආහාර ගැනීමයි. මේ පුරුද්දට ඇබ්බැහි වී ඇති පුද්ගලයින් වැඩිවන තරමට වෛද්‍යවරුන්ගේ ආදායම්ද තරවන බව එක් විද්‍යාඥයෙක් පවසයි. තවත් විද්‍යාඥයෙක් පවසන අන්දමට සිරුර ස්ථූල කරන මස්, බටර්, බිත්තර, ආදිය පමණක් නොව සීනි හා පැණිරස කෑමද සිරුරට හානිකරය. මෙවැනි ආහාර ගැනීම නිසා අධික රුධිර පීඩනය, දියවැඩියාව හා හෘදයාබාධ ඇති විය හැකිය. බිස්කට්, කේක්, අයිස්ක්‍රීම් ආදී පැණි රස බහුල ආහාරවලින් වැඩිපුර කැලරි ප්‍රමාණයක් සිරුරට ලැබෙන නමුත්, සුළු ආහාර ප්‍රමාණයකින් බඩගින්න නොනිවෙන හෙයින් ඒවා සිරුරට හානිකර බව එදා ගවේෂණවලින් හෙළිවී ඇත. ඔබ වැඩිකල් ජීවත්වීමට කැමති නම් ඔබේ ආහාරයට පළතුරු, එළවළු හා පළා වර්ග හැකි තරම් අඩංගු විය යුතුය.

වයස අවුරුදු හතලිහ පසුකළ විට එළවළු, පළතුරු, කිරි ආදී ප්‍රෝටීන් සහ විටමින් බහුල ආහාර වැඩියෙන්ද ආහාරයට ගත යුතුය. මෙවැනි ආහාර දිගාසිරි විඳීමට බෙහෙවින් උපකාරී වන බව විද්‍යාඥයෝ කියති.


අපේ ජීවිතයට හානිකර තවත් භයානක පුරුද්දක් නම් පසුතැවිල්ලයි. පසුගිය දේ ගැන හෝ අනාගතයේදී ඇතිවිය හැකි තත්වයක් ගැන හෝ සිතමින් පසුතැවිලි වීම සිරුරට ඉතාමත් හානිකරය. මේ පසුතැවිල්ල හේතුකොටගෙන මොළයේ සහ සිරුරේ සෛල දිරා පත්වන බව විද්‍යාඥයන් විසින් සොයාගනු ලැබ ඇත. රුධිර ධාවනයත් හදවතේ ක්‍රියාකාරීත්වයත් ග්‍රන්ථි හා ස්නායුවල මනා පැවැත්මත් සිදුවන්නේ පසුතැවිල්ල සිතින් තුරන් වූ විට බව ඉංග්‍රීසි වෛද්‍ය විද්‍යාඥයකු වන මහාචාර්ය චාර්ල්ස් එච් මයෝ කියයි. මේ චෛතසිකය මැඩ පැවැත්වීම අපහසු වුවත් ආත්ම විශ්වාසය හා අවංකකම වර්ධනය කළවිට එය තුනී කරගත හැකිය.

පිළියම බයිසිකල් පැදීම බව ලෝකයේ පළමුවන පෙළේ වෛද්‍ය විද්‍යාඥයකු හා හෘදයාබාධ විශේෂඥයකු වන මහාචාර්ය ඩඩ්ලි වයිට් කියයි. මෙය ක්‍රියාවෙන් පෙන්වන ඩඩ්ලි වයිට් දිනපතා රෝහලට පැමිණෙන්නේද බයිසිකලයෙනි. බයිසිකල් පැදීම කළ නොහැකි නම් දිනකට අඩු වශයෙන් සැතපුම් තුනක්වත් පයින් ගමන්කළ යුතුය. අපේ එදිනෙදා කටයුතුවලදී පමණක් නොව නින්දට යාමේදීත් උදයට අවදිවෙමින් ආහාර ගැනීමේදීත් එක්තරා කාල සටහනක් අනුගමනය කිරීම දිගාසිරි ලැබීම සඳහා ඉතාමත් අවශ්‍යය.

ජීවිතයේ ඒ ඒ අවස්ථාවන්හි අප පුරුදු කරගන්නා ඇබ්බැහිකම්වල සීමාවක් තිබිය යුතුය.

හොඳ වුවත් නරක වුවත් ඇබ්බැහිකම් අවබෝධයට හරස්වන බව වරක් එක් පෙරදිග පඬිවරයෙක් ප්‍රකාශ කළේය. එසේනම්, ඇබ්බැහිකම පිළිබඳ අප මනා සිහියෙන් සිටිය යුතු බව මෙයින් පැහැදිලිය. ඉඳුරන් පිනවීම අරමුණ කොට අප පුරුදු කරන ඇබ්බැහිකම් විශේෂයෙන් තරුණ ජීවිතයට ඉතාමත් හානිකර බව චාල්ස් සී කෝල්ටන් නම් විද්‍යාඥයා කියයි. පිපාසයෙන්ද තොරව මත්වීමෙන්ද තොරව සාදයකින් පිටවී යන්නාක් මෙන් ජීවිතයෙන්ද අප නික්ම යා යුතු බව ඇරිස්ටෝටල් පඬිවරයා කියයි.

සටහන -:
1990 අප්‍රේල් "මනහර" සඟරාව ඇසුරෙනි



# පුවත්පත් කලාවේ පතාක යෝධයකු වූ ලංකා ආරක්ෂක බලකායේ ලුතිනන්වරයා...

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස් ආයතනය) බිහිකිරීමට පුරෝගාමීවූ මෙන්ම පුවත්පත් කලාවේ පතාක යෝධයකු බවට පත් ඩී. ආර්. විජයවර්ධන ශ්‍රීමතාණන් එවකට ලංකාවේ යටත් විජිත සමයේ ලංකා ආරක්ෂක බලකායේ ලුතිනන්වරයකු වශයෙන් කලක් කටයුතු කළ යුද්ධ හමුදා නිලධාරියකු බව අදටත් බොහෝ මාධ්‍යවේදීන් පවා නොදන්නා කරුණකි. සැබැවින්ම ඩී. ආර්. විජයවර්ධන මහතාගේ නාමය මෙරට ඉතිහාසය තුළ වඩාත් ප්‍රචලිත වී තිබුණේ සාර්ථක ව්‍යාපාරිකයකු, ව්‍යවසායකයකු මෙන්ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගෙන් ලංකාව නිදහස් කරගැනීම සඳහා ලංකා නිදහස් ව්‍යාපාරයට සම්බන්ධ වූ විද්වතකු මෙන්ම මහත්මා ගතිගුණවලින් හෙබි සත්පුරුෂයකු ලෙසිනි. මේ මහා යුග පුරුෂයා  වර්ෂ 1915 සිට 1917 දක්වා අතර කාල සීමාව තුළ ලංකා පාබල හමුදාවට අනුයුක්තව සේවය කළ ලුතිනන්වරයෙකි.

වර්ෂ 1886 පෙබරවාරි 23 වැනිදා ඩී. ආර්. විජයවර්ධන උපන්නේ පුතුන් හත් දෙනකුගෙන් සහ දියණියන් දෙදෙනකුගෙන් යුත් පවුලක තුන්වැනි පිරිමි දරුවා වශයෙනි. පවුලේ බාලයා වූ ඩී. ආර්. විජේවර්ධනගේ පියා දොන් පිලිප් විජයවර්ධන නමින් ප්‍රකට වූයේ එවකට කොළඹ සේදවත්ත ප්‍රදේශයේ ප්‍රකට දැව ව්‍යාපාරිකයකු වශයෙනි. සාර්ථක ව්‍යාපාරිකයකු වූ දොන් පිලිප් විජයවර්ධනගේ සහ ඔහුගේ බිරිඳ වන හෙලේනා වීරසිංහගේ එකම අභිප්‍රාය වූයේ සිය පුත්‍රරත්නය වන ඩී. ආර්. විජේවර්ධනයන්ට සේදවත්ත මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබාදී ද්විතීක අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලය වෙත ඔහුව ඇතුළත් කරලීමටය.

කාලයාගේ ඇවෑමෙන් තරුණ විජයවර්ධන උසස් අධ්‍යාපනය සඳහා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට ඇතුළත් විය. එංගලන්තයේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය සහ නීතිවේදී උපාධිය ලබාගැනීමෙන් පසු එතුමන් නීතිඥවරයකු හා පසුකාලීනව "බැරිස්ටර්" වරයකු බවට පත්විය.

ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසු (එවකට ලංකාව) තරුණ විජයවර්ධන අලුත්කඩේ නීති වෘත්තිය ආරම්භ කළේය. මෙම යුගයේදී 1913 දී ඔහු දේශපාලනයට පිවිසි අතර, ලංකා ජාතික සංගමයේ ලේකම්වරයා ලෙස ඒකච්ඡන්දයෙන් තේරීපත් විය. ප්‍රකට ගත්කතුවරයකු වන ඩබ්ලිව්. ඒ. සිල්වා සමගින් අත්වැල් බැඳගත් තරුණ ඩී. ආර්. විජයවර්ධනයන් ලංකා ප්‍රතිසංස්කරණ සංගමයේ සම ලේකම්වරයා බවට ද පත්විය. එමෙන්ම, වර්ෂ 1915 දී ලංකාවේ ඇතිවූ ආන්දෝලනාත්මක කෝලාහලය සම්බන්ධව නීතිපති එදිරිව බස්නායක නිලමේ නඩුවට පෙනීසිටීම නීතිඥවරයකු ලෙස ඔහුගේ වෘත්තීයභාවය මැනවින් ප්‍රකට කළ තවත් එක් අවස්ථාවකි.

කෙසේ වෙතත්, එවකට ජවසම්පන්න නාඹර යොවනයකු වූ ඩී. ආර්. විජයවර්ධනයන් තුළ පැවැති තරුණ බව ඔහුව ලංකා පාබල හමුදාවේ ස්වේච්ඡා ඒකකයට කෙඩෙට් නිලධාරියකු වශයෙන් බැඳීමට යොමුකර තිබිණි. එමෙන්ම පුහුණු කාලයෙන් අනතුරුව දෙවන ලුතිනන්වරයකු වශයෙන් අධිකාරියට පත් කරන ලද විජයවර්ධනයන් එවකට එනම්, පළමු ලෝක යුද්ධ සංග්‍රාමයේ සේවය සඳහා තෝරාගෙන තිබිණි. ලුතිනන් ඩී.ආර්. විජයවර්ධන හමුදා සේවයේ සිටියදී රූමත් තරුණියක වන ඇලිස් ගර්ට්රූඩ් රූබි මීදෙණිය සමගින් වර්ෂ 1916 ජනවාරි මස 26 දින යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූල විවාහ උත්සවයකදී අතිනත ගෙන තිබිණි. ඔහුගේ ප්‍රිය මනාලිය වූයේ මීදෙණිය අධිකාරම් මහතාගේ සහ කොර්නේලියා මැග්ඩලින් සේනානායක මහත්මියගේ රුබර දියණියයි. සිය විවාහයෙන් අනතුරුව රංජිත් සහ සීවලී යන පුතුන් දෙදෙනකුගෙන්ද නාලනී, රාණි සහ කුසුමා ඇතුළු දියණියන් තිදෙනකුගෙන්ද පිය පදවිය ලත් ලුතිනන් ඩී. ආර්. විජේවර්ධනයන් වර්ෂ 1917 දී සිය අභිමතය පරිදි යුද්ධ හමුදා සේවයෙන් ඉල්ලා අස්වීමේ ලිපි ලේඛන ඉදිරිපත් කරන තෙක් ලංකා පාබල හමුදාවේ (ස්වේච්ඡා) ඒකකයේ ලුතිනන්වරයකු ලෙස සේවය කර තිබිණි.

ලංකා ආරක්ෂක බලකායේ ලංකා පාබල හමුදාවෙන් ඉල්ලා අස්වීමෙන් අනතුරුව, තරුණ ඩී. ආර්. විජයවර්ධනයන් තම ප්‍රිය බිරිඳ සමගින් ඉතා සුවපහසු ජීවන රටාවක් ගත කළේ තම පවුලට අයත් වතුපිටි ඇතුළු දේපල සහ අනෙකුත් ව්‍යාපාරවලින් ඔහුට ගලා එන පෞද්ගලික ආදායමෙනි. තම වත්කම් කළමනාකරණය කරගනිමින් ක්‍රම ක්‍රමයෙන් ව්‍යාපාරික කටයුතුවලට නැඹුරු වූ තරුණ විජයවර්ධනයන් තම සොහොයුරාවන ඩී. සී. විජයවර්ධනයන්ගෙන් ද ලද මූල්‍ය අනුග්‍රහය මත එවකට ඉතා සුළු පරිමාණයෙන්



ලේක්හවුස් ආයතනය අතීතයේ දිස්වූ අයුරු

මුද්‍රණය කෙරුණු "දිනමිණ" නැමැති පුවත් පතේ අයිතිය එහි මුල් හිමිකරුවන්ගෙන් මිළට ගෙන නව මුහුණුවරකින් එළිදැක්වීමට කටයුතු කර තිබිණි. පසුකාලීනව දිනපතා පළවන "ද සිලෝනීස්" *(The Ceylonese)* නැමැති තවත් ඉංග්‍රීසි පුවත් පතක් එහි හිමිකරුවන වන ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම්ගෙන් රුපියල් 16,000/-කට (එම යුගයට සාපේක්ෂව මෙය ඉතා විශාල මුදලකි.) ලබා ගැනීමට කටයුතු කර තිබිණි. එම ඉංග්‍රීසි පුවත්පත "සිලෝන් ඩේලි නිවුස්" (*Ceylon Daily News*) ලෙස නම් කිරීමෙන් අනතුරුව එම පුවත්පතේ මංගල කලාපය වර්ෂ 1918 ජනවාරි 03 වැනි දින මුද්‍රණද්වාරයෙන් නිකුත් කිරීමට එතුමන් විසින් වැඩිදුරටත් කටයුතු සංවිධානය කරන ලදී.

කෙසේ වෙතත්, ඩී. ආර්. විජයවර්ධනගේ දූරදර්ශී දැක්ම සහ ව්‍යපාරික කළමනාකරණ කුසලතාවන් හේතුවෙන් පසුකාලීනව "සිලෝන් ඩේලි නිවුස්" පුවත්පත ලංකාවේ ප්‍රමුඛතම උදෑසන ඉංග්‍රීසි පුවත්පතක් බවට පත් විය. කාලයාගේ ඇවෑමෙන් ඩී. ආර්. විජයවර්ධනට "තිනකරන්" නමැති තවත් ද්‍රවිඩ පුවත්පතක අයිතිය එහි මුල් හිමිකරුවන්ගෙන් පවරා ගැනීමට හැකිවිය. 1923 දී "ද ඔබ්සර්වර්" නම් වූ තවත් ඉංග්‍රීසි පුවත්පතක අයිතිය මිලදී ගැනීමට ඔහු සමත් වූයේ ඒ අනුව "සන්ඩේ ඔබ්සර්වර්", "ද ඔබ්සර්වර්", "ඩේලි නිවුස්", "දිනමිණ" (දිනපතා පුවත්පත), "සිළුමිණ" (සතිඅන්ත පුවත්පත), "තිනකරන්", "ඉරිදා තිනකරන්" ඇතුළු සිංහල, ද්‍රවිඩ හා ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රණය කරන ලද පුවත්පත් හතක් ඇතුළුව එම පුවත්පත් සියල්ලක්හිම මුද්‍රණ කටයුතු සිදුකිරීම කරනු ලැබුයේ ලේක්හවුස් නම් වූ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (*ANCL*) යටතේ එකම වහලක් යට ඒකාබද්ධ වෙමිනි. ඒ අනුව ඩී. ආර්. විජයවර්ධනගේ මගපෙන්වීම සහ උපදෙස් මත එවකට *ANCL* හි කළමනාකාරීත්වය "බේරේ" වැව ආශ්‍රිත ඉවුර දිගේ ලේක්හවුස් ආයතනයට අදාළව සුවිසල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ අතර, පසුව යෝජිත ගොඩනැගිල්ල "ලේක්හවුස්" ආයතනය ලෙසින් නම් කරන ලදී.

එසේම, ලේක්හවුස් ආයතනය යටතේ ප්‍රකාශයට පත් කරන ලද සියලුම පුවත්පත්වල මුද්‍රණය කිරීම් කටයුතු සහ එම පුවත්පත් දිවයිනේ විවිධ ප්‍රදේශවලට ප්‍රවාහනය කිරීම මෙන්ම බෙදාහැරීමේ අරමුණින් ඩී. ආර්. විජයවර්ධන මහතා දිවයිනේ දුෂ්කර ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් විශේෂ බස් සේවාවන් කිහිපයක්ද ආරම්භ කිරීමට පුරෝගාමී විය. පසුකාලීනව මෙම බස් සේවාව කතරගම වැනි දුෂ්කර ප්‍රදේශවලට පහසුවෙන් ලඟාවීම වෙනුවෙන් ජනතාව අතර ඉතා ජනප්‍රිය වූ පොදු ප්‍රවාහන මාධ්‍යයක් ද විය.



ඩීආර් විජයවර්ධන ශ්‍රී ලංකා පාබල හමුදාවේ (ස්වේච්ඡා) ඒකකයේ ලුතිනන්වරයකු ලෙස සේවය කළ අවධියේ ගත් ඔහුගේ මංගල ඡායාරූපය

ඩී. ආර්. විජයවර්ධනගේ පවුල ශ්‍රී ලංකාවේ සාර්ථක ව්‍යවසායකයන් සහ දේශපාලනයේ ප්‍රමුඛ පවුලක් ලෙසද හැඳින්වේ. ලංකාවේ ප්‍රකට අගවිනිසුරුවන් දෙදෙනකු, අගමැතිවරු දෙදෙනකු, ජනාධිපතිවරු දෙදෙනකු ඩී. ආර්. විජයවර්ධන පවුල තුළින් බිහිවූ අතර, ශ්‍රී ලංකාවේ වත්මන් ජනාධිපති සහ හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාද ඩී. ආර්. විජයවර්ධනයන්ගෙන් පැවතෙන මුණුබුරෙකි.

වර්ෂ 1956 දී ඩී. ආර්. විජයවර්ධන නම් වූ මෙම ශ්‍රේෂ්ඨ ව්‍යවසායකයාගේ අභාවයෙන් පසු ඔහුට කරන ලද උපහාරයක් ලෙස ලේක්හවුස් ආයතනය ඉදිරිපිට සිට "බේරේ" වැව ඉවුර දිගේ දිවෙන මාර්ගයක් පසු කාලීනව ඩී.ආර්. විජයවර්ධන මාවත ලෙස නම් කරන ලදී. තවත් සුවිශේෂී සිදුවීමක් වන්නේ වර්ෂ, 1973 දී එවකට ශ්‍රී ලංකාවේ අගමැතිනිය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස් ආයතනය) අංක 28 දරණ විශේෂ පාර්ලිමේන්තු විධිවිධාන පණතක් යටතේ ජනසතු කිරීමට පියවර ගෙන තිබීමයි.



සටහන -:
ලුතිනන් දමින්ද සෙනරත්
2(සේවා) ශ්‍රීලයුපෙදුසේබ
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය




# යුද්ධයෙන් පසු හමුදාවේ භූමිකාව

මව්වරුන්ට පියවරුන්ට තම දරුවනුත්, බිරින්දෑවරුන්ට තම සැමියනුත් සැමියන්ට තම බිරින්දෑවරුනුත්, දරුවන්ට සිය මව්පියනුත් අහිමිකළ යුද්ධයේ කටුක කර්කෂබව යළි යළිත් මෙරට වැසියන්ට සිහිකළ යුතු නැත. ඒ කර්කෂ කඨෝර යුද්ධය ශ්‍රී ලංකාව වෙළාගත් අඳුරු දශක තුන නිමාවූයේ 2009 මැයි 18 වැනි දිනය. ඒ ශ්‍රී ලංකා ඉතිහාසයේ ස්වර්ණමය දිනයක් රන් අකුරින් සනිටුහන් කරමිනි. එදා 1975 වර්ෂයේ දී යාපනය නගරාධිපති ඇල්ෆ්‍රඩ් දොරේඅප්පා ඝාතනය කරමින් වේලුපිල්ලේ ප්‍රභාකරන් අපේ මව්රටට උරුම කළ අඳුරු යුගය නිමාකරමින් ලැබූ මේ ජයග්‍රහණය මල් යහනා මතින් ලැබූ ජයග්‍රහණයක් නොවේ. එය දහස් ගණනකගේ ලේ කඳුළු මතින් උරුම වූ ජයග්‍රහණයකි.

වෙලුපිල්ලේ ප්‍රභාකරන්ගේ සහචරයන් විසින් යුද්ධ හමුදා සොල්දාදුවන් 13 දෙනකු 1983 වර්ෂයේ දී ඝාතනය කිරීමේ සිද්ධිය පාදක කරගමින් පළමු ඊලාම් යුද්ධය ආරම්භ විය. 1984 වර්ෂයේ සිට උතුරු පළාතේ සිංහල ජානපදිකයින් සමූල ඝාතනය කිරීම ආරම්භ කළ අතර, ඊට අමතරව කොළඹ අනුරාධපුර ප්‍රදේශ ඉලක්ක කරගනිමින් ත්‍රස්තවාදීහු ක්‍රියාත්මක වූහ. ඉන් අනතුරුව 1985 වසරේ තිම්පු සාකච්ඡා ක්‍රියාත්මක වුවද එම සාකච්ඡා සාර්ථක නොවිය. ඉන් අනතුරුව 1987- 89 සමයේ පැවති භීෂණකාරී අභ්‍යන්තර අරගලය මර්ධනය කිරීමේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සුවිශේෂී දායකත්වයක් දැක්විය. ඉන් අනතුරුව 1987 වර්ෂයේ දී ඉන්දීය සාමසාධක හමුදාව ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාව සමග එක්වූහ.

1995 අප්‍රේල් 19 දින ත්‍රස්තවාදීන් විසින් ත්‍රිකුණාමලය වරායේ නැංගුරම් ලා තිබූ නාවික හමුදාවට අයත් නෞකා දෙකක් විනාශ කිරීමත් සමග තුන්වැනි ඊලාම් යුද්ධය ආරම්භ විය. ඉන්පසු ත්‍රස්තවාදීන්ට එරෙහිව රිවිරැස, සත්ජය, ජයසිකුරු, රණගොස ආදී ක්‍රියාන්විත රජයේ හමුදාවන් විසින් දියත් කළ අතර, 2001 වර්ෂයේ දී යළි සටන් විරාමයක් ඇතිවිය. මෙය 2003 දක්වා පැවති අතර, 2005 වසරේදී සාම සාකච්ඡා ක්‍රියාත්මක වුවත් ඒවාද අසාර්ථක විය. 2006 වසරේදී රජයත් එල්ටීටීඊ සංවිධානයත් අතර විටින් විට යුද ගැටුම් ඇතිවිය. ඉන් අනතුරුව 2006 ජූලි 26 දින සිව්වන ඊලාම් යුද්ධය ආරම්භ වූ අතර, ඊට දේශපාලන නායකත්වය එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සේනාධිනායකයා වශයෙන් ලබාදුන් අතර, යුදබිමේ නායකත්වය එවකට යුද්ධ හමුදාධිපති ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා විසින් ලබාදුන්නේ යුද්ධය අවසන් කිරීමේ තිර අදිටනින් යුතුවය.

මෙය හුදෙක්ම මානුෂීය මෙහෙයුමක් විය. එල්ටීටීඊ ත්‍රස්තවාදීන් 2006 ජූලි 21 දා මාවිල්ආරු සොරොව්ව වසා දමමින් අහිංසක සිවිල් වැසියන් 30000ක පමණ පිරිසගේ ජල සැපයුම අත්හිටවූ අතර, මාවිල්ආරු මුදාගනිමින් ජනතාවගේ ජල අවශ්‍යතාවයන් සැපිරීම වෙනුවෙන් සිව්වන ඊලාම් යුද්ධය ආරම්භ විය. ශ්‍රී ලංකා රජයේ හමුදාවන්ට ඉතා පහසුවෙන් මාවිල්ආරු මුදාගත හැකි වූ අතර, ඉන්

අනතුරුව එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගේ බලකොටුවක් වූ තොප්පිගල මුදාගැනීමෙන් අනතුරුව එහි එල්ටීටීඊ බලය සහමුලින්ම ඉවත්කර නැගෙනහිර පළාත මුදාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ප්‍රමුඛ ත්‍රිවිධ හමුදාවෝ සමත් වූහ.

නැගෙනහිර ජයග්‍රහණයෙන් පසුව එල්ටීටීඊ ත්‍රස්තවාදීන් උතුරු පළාතට පමණක් සීමා වූ අතර, උතුරු පළාත ත්‍රස්තවාදීන්ගෙන් මුදාගැනීම සඳහා වූ වන්නි මානුෂීය මෙහෙයුම ඇරඹුණේ ඉන්අනතුරුවය. සාම්ප්‍රදායික යුද උපක්‍රම පසෙකට දා මෙරටටම ආවේණික වූ යුද උපක්‍රමයන් ඔස්සේ ඇරඹුණු උතුරු මානුෂීය මෙහෙයුම එල්ටීටීඊ සංවිධානයේ අවසානය උදාකරවීය. මේ අතර කොටි සංවිධානය සිය වයඹ දිග සැපයුම් කේන්ද්‍රස්ථානය ලෙස පවත්වාගෙන ගියේ මන්නාරමට නුදුරු සිලාවතුර මුහුදු කොටි කඳවුරයි.

උතුරු මානුෂීය මෙහෙයුමේ සුවිශේෂීමක් සිදුවීම වූයේ නාවික හමුදාවේද සහය ඇතිව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සිලාවතුර මුහුදු කොටි කඳවුර අල්ලා ගැනීමයි. හමුදාවේ ප්‍රහාරක බලයට මුහුණපෑමට නොහැකිවූ මුහුදු කොටි සිය කඳවුර හැර දමා පලාගිය අතර, 2007 සැප්තැම්බර් 2 දා සිලාවතුර පාලනය රජයේ හමුදාවන් සතුවිය.

එලෙස ඇරඹි උතුරු මානුෂීය මෙහෙයුමේ දී එල්ටීටීඊ සංවිධානය සතුව තිබූ අවසන් බිම් අඟලත් වෙල්ලමුල්ලිවයික්කාල් ප්‍රදේශයේදී අත්පත් කරගැනීමත් සමඟ 2009 මැයි 19 දින අති බිහිසුණු ත්‍රස්වාදය පරදා ප්‍රභාකරන් නමැති ඝාතකයාගේ මළසිරුර නන්දිකඩාල් කලපුවෙන් හමුවූයේ සාමයේ පරෙවියන්ට මුළු ශ්‍රී ලංකා අහස් තලයම යළි විවර කර දෙමිනි. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 23600 ක නිලධාරීන් සහ සෙසු නිලයින් ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත්ව සහ අතුරුදන්ව ඇත. එසේම, නිලධාරීන් සහ සෙසු නිලයින් 22,555 ක් තුවාල ලබා ඇත. මේ කළ කැපකිරීමේ හේතුවෙන් පරම වීර විභූෂණ පදක්කම් 29 ක්, වීරෝදාර විභූෂණ පදක්කම් 18 ක්, වීර වික්‍රම විභූෂණ පදක්කම් 312 ක්, රණ වික්‍රම පදක්කම් 5101 ක් සහ රණශූර පදක්කම් 27671 ක් සමඟ වීර ක්‍රියා පදක්කම් 33131 ක් හිමිගත්වා ඇත.

යුද්ධය අවසන් වූ පසුවද ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය මෙහෙවර



දශමයකිනුදු අඩු කළේ නැත. ඔවුහු සිය මෙහෙවර අඛණ්ඩව රට වෙනුවෙන් ඉටු කිරීමට පෙරට ආහ. තම රට වෙනුවෙන් පෙරට ඒමට ඔවුන්ට දිවා, රෑ, අව්ව, වැස්ස ගැටලුවක් වූයේ නැත. ඒ සැබෑම ජාතියේ ආරක්ෂකයාගේ භූමිකාවයි. විශේෂයෙන්ම යුද්ධයෙන් පසු උතුරු නැගෙනහිර පළාත්වල ජනජීවිතය යථා තත්වයට පත්කිරීමේ සංහිඳියා මෙන්ම පුනරුත්තාපන සහ නැවත පදිංචි කිරීමේ කටයුතුවලට ද යුද්ධ හමුදාව සෘජුව මැදිහත්විය.

එසේම, ජාතික ආරක්ෂාව තහවුරු කිරීමේ ප්‍රාථමික රාජකාරියෙන් ඔබ්බට ගොස් සෞඛ්‍ය සේවා, යටිතල පහසුකම් දියුණු කිරීම, අධ්‍යාපන පහසුකම් සැපයීම්, කෘෂිකාර්මික කටයුතු, ආගමික සහ සංස්කෘතික සහජීවන වැඩසටහන් විනෝදාස්වාද කටයුතු, ආදිය සිදුකරමින් ජාතිය ගොඩනැගීමේ කටයුතුවලදී ද පෙරමුණ ගත්හ. උතුරු ජනනි, නැගෙනහිර නවෝදය සංවර්ධන ව්‍යාපෘතිවලදී මෙන්ම අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවලදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දැක්වූයේ සුවිශේෂී දායකත්වයකි.

ශ්‍රී ලංකාව ආහාරවලින් ස්වයංපෝෂිත රටක් බිහිකිරීම වෙනුවෙන් යුද්ධ හමුදාව විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙල්ලන්කුම්, මැණික්ෆාම්, ආඩියාපුලියන්කුලම්. නීරාවිය, කන්දකාඩු, ගල්කන්ද, බළල්ල, යාල පලටුපාන ගොවිපළ සහ අරලගන්විල කෘෂිකර්ම පුහුණු පාසැල, යුද්ධ හමුදා මූලස්ථාන කෘෂි ව්‍යාපෘතිය, කොහිලවගුරවත්ත රෙජිමේන්තු ගොවිපළ මෙන්ම සියලු යුද්ධ හමුදා කඳවුරු ආශ්‍රිතව කෘෂිකර්ම සහ පශු සම්පත් බලකාය වෙතින් ආරම්භ කළ කෘෂිකර්ම ව්‍යාපෘතින් මේ වනවිට සාර්ථකව ඉදිරියට පැමිණ ඇත.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සියධුරයේ රාජකාරි ආරම්භ කිරීමෙන් අනතුරුව මෙරට කෘෂිකර්මාන්තය දියුණු කිරීම වෙනුවෙන් අවශ්‍ය සියලුම පියවර ගන්නැයි යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත භාරදුන් වගකීමට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යුද්ධ හමුදා කෘෂිකර්ම සහ පශු සම්පත් බලකාය සහ යුද්ධ හමුදා කෘෂි අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ මේ වනවිට විශාල ව්‍යාපෘති රැසක් ආරම්භ කර ඇත. එලෙස ආරම්භ කළ වැඩසටහන යටතේ අස්සැද්දූ බිම්වලින් ලබාගත් අස්වැන්න මෙලෙස රජයේ ව්‍යාපෘතියකට ලබාදීම සුවිශේෂී සිදුවීමක් විය.

එසේම, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සිය ධුරයේ රාජකාරි ආරම්භ කිරීමෙන් අනතුරුව දළදා මාලිගාව වන්දනාකිරීමට සහභාගී වූ අවස්ථාවේ මුල්වරට මාධ්‍යය වෙත පැවසූ පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ගොවිපළවලින් නෙළාගනු ලබන අස්වැන්න යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ප්‍රයෝජනයට ගන්නවා සේම අතිරික්තය රජයේ ව්‍යාපෘති හරහා රටේ සාමාන්‍යය ජනතාවට ලබාදීම මෙලෙස ආරම්භ කර ඇත. ඒ අනුව රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන තෝරාගත් දිළිඳු පවුල් වෙත සහල් සහනාධාරය ලබාදීමේ වැඩසටහනට යුද්ධ හමුදා ගොවිපළවලින් නෙළාගත් වී අස්වැන්නෙන් සැකසූ සහල් මෙට්‍රික් ටොන් 10 ක් ලබාදීමට නියමිතව ඇති අතර, එහි පළමු අදියර මෙලෙස ආරම්භ කරන ලදී. එමෙන්ම, වර්ෂ 2030 වනවිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තමන්ට අවශ්‍ය සියලු ආහාර ද්‍රව්‍ය හමුදාව තුළම නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කෙරෙන අතර, එමගින් යුද්ධ හමුදාව වෙනුවෙන් රජයට දැරීමට සිදුවන වැය බර අවම කිරීමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය යුධෝපකරණ ද්‍රව්‍යය යුද්ධ හමුදාව තුළින්ම නිෂ්පාදනය කරගැනීමේ අවශ්‍යතාවය නිසා අත්හැරදමා තිබූ වේයන්ගොඩ පෙහෙකම්හල් සංකීර්ණය නවීකරණය කර ARMY ORDNANCE INDUSTRIES නමින් ආරම්භ කෙරුණි.

එලෙස යළි ආරම්භ කළ කර්මාන්තශාලාවේ දී යුද්ධ හමුදාවට අත්‍යවශ්‍යය භාණ්ඩ විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කර ලදී. ඊට යකඩ ඇඳන් නිෂ්පාදන, හණෝපකරණ, ඇගළුම් නිෂ්පාදන, ටයර් කට්ටා නැවත ඇලවීම, ඇඳ ඇතිරිලි සහ කොට්ටා උර ආධුනික සෙසුනිලයින් පුහුණු කිරීම සඳහා අවශ්‍ය නිලඇඳුම්, කොට කලිසම්, හිස්වැසුම්, වැඩඇඳුම්, ටී ෂර්ට්, සියලුම වර්ගයේ පැක්වර්ග, වැහිකබා, පොංචො කේප්, වාහන කැනපි, සියලුම වර්ගයේ කූඩාරම්, නිලධාරීන් සහ සෙසු නිලයින් පළඳින සියලුම වර්ගවල බෙල්ට්, ඇසෝල්ට් ජැකට්, ෆ්ලැට් ජැකට් වැනි විශේෂ උපකරණ නිෂ්පාදනය කරනු ලබයි.

රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කරමින් බැලැස්ටික් හෙල්මට් නිෂ්පාදනය කිරීමද මෙම කර්මාන්ත ශාලාවේ සිදුකිරීම සුවිශේෂී කරුණකි. ඊට අමතරව නියමු ව්‍යාපෘතියක් ලෙස බෙරට් (හිස්වැසුම්) නිෂ්පාදන අංශය, පාවහන් නිෂ්පාදන අංශය, අත්යන්ත්‍ර හා රෙදිපිළි නිෂ්පාදන අංශය ආරම්භ කර ඇති අතර, මෙම කර්මාන්තශාලාව ස්ථාපනය කිරීමත් සමග යුද්ධ හමුදාවේ ඉහත සඳහන් කළ අවශ්‍යතාවයන් දේශීය සහ විදේශීය සැපයුම්කරුවන්ගෙන් ලබාගැනීමේදී වැයවන මුදලින් 40%කින් අවම කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හැකි වී ඇත . එය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව රටට ලබාදෙන  සුවිශේෂී දායකත්වයකි.

එමෙන්ම, ගංවතුර හදිසි නායයාම් ආදී ස්වභාවික විපත්වලදී අත් කවරතුවත් පෙරාතුව ජනතාව වෙනුවෙන් පෙරට එන්නේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවයි. මාවනැල්ල රාමසර කන්ද නායයාම ආදී වූ මහජනතාවට දැවැන්ත හානියක් සිදුකළ ව්‍යසන සියල්ලකදීම පාහේ යුද්ධ හමුදාව ඉටුකළ මෙහෙවර ජනතාව හා හමුදාව අතර, නව මානුෂීය බැඳීමක සහ අවබෝධයක ශක්තිමත් පදනමක් ගොඩනැගීය. එසේම, යුද්ධය දරුණු ලෙසින් ක්‍රියාත්මක වූ සමයේදී ඇති වූ සුනාමි ව්‍යසනයේ දී දකුණේ මෙන්ම උතුරේද පීඩාවට පත්වූ ජනතාව වෙනුවෙන් සහන සැලසීමට යුද්ධ හමුදාව කටයුතු කළේය. එසේම කොවිඩ් වසංගත සමයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ඉටුකළ සේවය අතිමහත්ය. ඒ වෙනුවෙන් ආපදා, උපද්‍රව, අවදානම්, ආපදා ප්‍රතිචාර පිළිබඳ අවදානම් විශ්ලේෂණයන් හා සම්බන්ධ විවිධ ක්‍රියාකාරකම් සිදුකිරීම විශ්ලේෂණය කිරීම, අවම කිරීම සහ කළමනාකරණය කිරීම යන අංශයන්හි අංග සම්පූර්ණ හමුදා චරිතයක් හැඩගැස්වීම වෙනුවෙන් මේ වනවිටත් කාලෝචිත ව්‍යාපෘතියක් ආරම්භ කර අවසන්ය. "ආපදා ප්‍රතිචාර පුහුණුව සඳහා ශ්‍රී ලංකා හමුදා මධ්‍යස්ථානය" නමින් ගම්පොළ දී ආරම්භ කළ මේ නව ව්‍යාපෘතියේ දී, ජාතික හා ජාත්‍යන්තර ආපදා කළමනාකරණ සහ මානුෂීය ආධාර ක්ෂේත්‍රයේ සිවිල් - මිලිටරි මෙහෙයුම් පිළිබඳ පුහුණුව සහ පර්යේෂණ, ආපදාවන්ට ප්‍රතිචාර වශයෙන් උසස් තත්වයේ ආපදා ප්‍රතිචාර සහ මානුෂීය සහාය ලබාදීම සිදුකරනු ලැබේ.

එමෙන්ම, නීතිවිරෝධී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙහෙයුම් සහ බුද්ධි ආවේක්ෂණ රාජකාරි පුළුල් කරන ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරල් වික්‍රම් ලියනගේ ආරක්ෂක සේනා ආඥාපතිවරුන්ට සහ අදාළ සියලුම පාර්ශවයන්ට උපදෙස් ලබාදී ඇත. 2023 වසරේ ගත වූ කාලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව රැස්කරගත් බුද්ධි තොරතුරුවලට අනුව ශ්‍රී ලංකා පොලිසිය සහ විශේෂ කාර්ය බලකාය සමග සිදුකළ වැටලීම්වලදී නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම සම්බන්ධයෙන් අවස්ථා 256 කදී පුද්ගලයින්  277 දෙනකු අත්අඩංගුවට ගෙන ඇත. අදාළ වැටලීම්වලදී අයිස් කිලෝග්‍රෑම් දෙකකට ආසන්න ප්‍රමාණයක් කේරළ ගංජා කිලෝග්‍රෑම් එකසිය පනහකට ආසන්න ප්‍රමාණයක්, ගංජා කිලෝග්‍රෑම් පණහකට ආසන්න ප්‍රමාණයක්, සහ හෙරොයින් ග්‍රෑම් පන්සියයකට ආසන්න ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට හැකි වී ඇත. ඊට අමතරව හැෂ්, කුෂ් සහ හෂීෂ් ආදී මත්ද්‍රව්‍යයද, නීතිවිරෝධී දුම්වැටි, මත්පෙති, නීතිවිරෝධී දේශීය මත්පැන්ද අත්අඩංගුවට ගැනීමට කටයුතු කර ඇත.

එසේම, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමසාධක මෙහෙයුම්වල සහභාගී වීමෙන් ශ්‍රීලංකාවේ හමුදාවන් ජාත්‍යන්තරයේ සුවිශේෂී කීර්තිනාමයක් අත්පත්කර ගෙන ඇත. යුද්ධ හමුදාව විසින් පමණක් එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි ආරම්භ කළ දින සිට මේ දක්වා හයිටි, ලෙබනන්, දකුණු සුඩානය, මධ්‍යම අප්‍රිකානු ජනරජය සහ මාලි රාජ්‍යය වෙත යුද්ධ හමුදා නිලධාරීන් 1858 ක් සහ සෙසු නිලයින් 18557 ක් වශයෙන් 20415 ක ප්‍රමාණයක් සාමසාධක රාජකාරි සඳහා යොදවා ඇත. මේ වනවිට මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායීතාවය ඇති කිරීමේ මෙහෙයුම් මූලස්ථානය යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන් 20 ක් සහ සෙසු නිලයින් 243 ක් සාමසාධක රාජකාරි සඳහා යොදවා සිටිති.
එදා මෙදා තුර එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරිවලින් පමණක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ඇමරිකානු ඩොලර් මිලියන තුන්සියයකට ආසන්න විදෙස් විනිමය ප්‍රමාණයක් උපයා දී ඇත. යුද්ධ හමුදා නවෝත්පාදනයන්ට නව සන්ධිස්ථානයක් එක්කරමින්, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා භටපිරිස් විසින් නිෂ්පාදනය කරන ලද යුනිකෝන්/යුනිබෆල් රථ, සාමසාධක රාජකාරි සඳහා යොදවා සිටින ශ්‍රී ලාංකික සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමේ (Combat Convoy Company) පරිහරණය සඳහා යොදවා ඇති අතර, මෙලෙස නිර්මාණය කරන ලද යුනිකෝන්/යුනිබෆල් සහ උපකරණ එක්සත් ජාතීන්ගේ පිරිවිතරයන්ට අනුකූල වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ආනයනික අමතර කොටස් භාවිතා කරමින් නිෂ්පාදනය කර ඇති හෙයින් රජයට සහ යුද්ධ හමුදාවට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කර ගත හැකිවී ඇත.

එදා එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙන් මෙරට මුදාගනිමින් දේශය එක්සේසත් කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කටයුතු කළා මෙන් යුද ජයග්‍රහණයෙන් වසර දාහතරක් සපිරෙන මොහොතේදීත් රටේ අවශ්‍යතාව වෙනුවෙන් දිවිපරදුවට තබා ඉදිරියට පැමිණ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සිය ජාතික මෙහෙවර ඉටුකරමින් සිටිති. ඒ ඔවුන් තම මව්බිම සියල්ලට ඉහළින් රඳවාගෙන කටයුතු කරන නිසාවෙනි.



සටහන:-
ලුතිනන් දිලංක ගුණතිලක
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය



# අපහාස කිරීමේ ලලිත කලාව

අනාදිමත් කාලයක පටන් මිනිසා වාග් සටන් වලට රුචියක් දැක්විය. මෙකල වෙසෙන අප බොහෝ දෙනා සිතෙහි පහලවන අවංක අදහස් එලෙසින්ම නොපවසා ඒවා වචන තුළ වසන් කිරීමට පෙලඹෙතත් අවංක සිතැඟි පලකිරීමට තරම් දිරියක් ඇති ස්වල්ප දෙනා අප හැමගේ අගය කිරීමට ලක්වෙති.

සතුරන් කපා හෙලන මුවහත් අසිපතක් ලෙසින් බස හැසිරවීමට සමත් ශූර බුද්ධියකින් යුත් ස්වල්ප දෙනෙක් අතීත හා අනතීත හැම සමාජයකම විසූහ.

පුරාණ රෝම වැසියෝ කෙනකු ගැන කිවයුතු යමක් නොසඟවා පළ කිරීමට කිසිදු බියක් හෝ මැලිබවක් නොදැක්වූහ.

මාර්ටියල් නමැති රෝම කවියා මේ අතින් කෙතරම් දක්ෂයෙක් වීද කිවහොත් අනුන්ට පහර ගැසීම ඔහුගේ ජීවනෝපාය විය. ක්ලෝයේ නමැති එක් කාන්තාවක් ගැන ඔහු කළ සටහනක් මෙසේය.

"මට ඔබේ වත නැතුවාට කමක් නැත. මට ඔබේ ගෙල නැතුවාට කමක් නැත. මට ඔබේ දෑත නැතුවාට කමක් නැත. මට ඔබේ ළැම නැතුවාට කමක් නැත. ඔබේ වෙනත් නයන කාන්තා අංගෝපාංග වලින්ද කමක් නැත. ඇත්ත වශයෙන්ම මේ අංගෝපාංගයන් එකින් එක නම් කිරීම මට මහ වදයක් වන හෙයින් කොටින් කියතොත් ඔබ සහමුලින්ම නැතුවාට කමක් නැත."

කවියන් ගත් කතුවරුන් සිත්තරුන් හා සංගීතඥයින් විරුද්ධවාදීන්ගේ දරුණු උපහාසයට නිතර ලක්වූ පිරිසකි.

ටර්නර්ගේ චිත්‍රයක් මාක්ට්වේන් විසින් හඳුන්වන ලද්දේ "තක්කාලි බඳුනක් තුළ දඟලන කැස්බෑ ලෙල්ලෙන් තැනූ බළලකු සේය."

නවීන චිත්‍ර ශෛලියක් වන භාව රූපී චිත්‍ර කෙරෙහි සිය පිළිකුළ දක්වමින් ඇල්කැප් නමැති නූතන ඇමරිකානු උපහාසකරු ඒ චිත්‍ර කලාව විස්තර කළේ මෙසේය.

"එය ප්‍රතිපත්ති විරහිත පුද්ගලයන් විසින් තුෂ්නිම්භූත වූ පුද්ලයන්ට විකුණනු ලබන අදක්ෂ පුද්ලයන්ගේ නිර්මාණයකි."

දරුණුම වාග් ප්‍රහාරයන් අසන්නට ඇත්තේ සාහිත්‍ය ලෝකයේය. සොක්‍රටීස් නමැති පැරණි ග්‍රීක දාර්ශනිකයා තොමස් බැබින්ටන් මැකොලේගේ උදහසකට ලක්වූයේ මෙසේය.

"ඔහුගේ පොතපත වැඩි වැඩියෙන් කියවන තරමට ඔහුට වසදී මැරීම ගැන මම අඩුවෙන් පුදුමවෙමි."

සාහිත්‍යකරුවකු මෙන්ම දේශපාලඥයකු වුවද මැකොලේ නොනවත්වා කතා කිරීමට පුරුදුව සිටි කෙනෙකි. එනිසා ඔහු සතුරන්ගේ ද උදහසට ලක්විය. ක්‍රිමියන් යුද්ධයේදී නම ගිය ෆ්ලෝරන්ස් නයිටිංගේල් නමැති හෙදිය මැකෝලේගේ ඒ පුරුද්ද ගැන මෙසේ පැවසුවාය.

"ඔහුගේ අල්ලාපය තනි පුද්ගලයකුගේ පෙරහැරකි"

වාග් ප්‍රහාරය ගැනනම් දැරූ තව ඉංග්‍රීසි ජාතිකයකු වූ සිඩ්නි ස්මිත් නමැති පූජක තුමා මැකෝලේ ගැන මෙසේ පවසා තබේ.

"ඔහු බුද්ධිය උතුරා ගිය පුද්ගලයකු පමණක් නොව ඒ උතුරා ගිය ජලයෙහි එරී සිටි කෙනෙකි."

සිඩ්නි ස්මිත් පූජක තුමා අනුන් පමණක් නොව තමන්ද උපහාසයට ලක්කර ගැනීමට තරම් විශාල හදවතක් තිබුණු පුද්ගලයෙකි. ස්මිත් පූජකතුමා වරක් තමන් ගැනම සඳහන් කර ගත්තේ මෙසේය.

"මා පල්ලියේ දේශනාව පවත්වනවිට ශ්‍රාවකයන් නින්දේ දී පවා හිස සලමින් මගේ අදහස් අගය කරන බව දැකීම මට සතුටට කරුණකි."

ප්‍රංශ විප්ලවය ගැන ශ්‍රේෂ්ඨතම කෘතිය ලියූ ඉංග්‍රීසි ජාතික තෝමස් කාර්ලයිල් විවේචනයේදී ඉතා දරුණු භාෂාවක් පාවිච්චි කළ කෙනෙකි. එහෙත්, කාර්ලයිල් පමණක් නොව ඔහුගේ බිරිඳද ඇතැමුන්ගේ තියුණු සරදමට ලක්වී තිබේ. කාර්ලයිල් ජෝඩුව ගැන සඳහන් කරමින් සැමුවල් බට්ලර් මෙසේ කීය.

"දෙවියන් වහන්සේ කාර්ලයිල් හා කාර්ලයිල් මහත්මිය අතර විවාහයක්

වීමට සැලසූ එක ඉතා හොඳ දෙයකි. එමගින් සිදුවූයේ දෙදෙනකුගේ ජීවිත කාලකණ්ණිවීම පමණි. නැත්නම් හතර දෙනකුගේ ජීවිත කාලකණ්ණි වීමට ඉඩ තිබුණි."

සුප්‍රකට ඇමරිකානු සාහිත්‍යකරු මාක් ට්වේන් කථා පවත්වන විට භාෂාව කස පහරක් මෙන් පාවිච්චි කළ කෙනෙකි. ඔහුගේ වැකි කිහිපයක් මෙසේය.

"මන්ත්‍රීවරයකුට උගැන්විය හැකි ඕනෑම දෙයක් පාහේ මැක්කකුට උගැන්වීමට පුළුවන."

"ලිපිනයක් නැති පවරයක් වගේ තමුසෙ ඔතන නිකම් බලාගෙන ඉන්නේ ඇයි?"

"සමහරුන් යුතුකමක් ඉෂ්ට කළවිට එහි දෝංකාරය සැනපුම් ගණනාවක් ඈතට ඇසේ."

සැමුවල් ජොන්සන් නමැති ඉංග්‍රීසි සාහිත්‍යධරයා ඔහු වෙත එවන ලද ආධුනික ලේඛකයකුගේ කෘතියක අත්පිටපත ගැන සිය අදහස මෙසේ පළ කළේය.

"ඔබගේ කෘතිය අගනා එකක් මෙන්ම නිර්මාණාත්මක එකකි. එහෙත් අගනා කොටස නිර්මාණාත්මක නොවේ. නිර්මාණාත්මක කොටස අගනා නොවේ."

ඇමරිකානු උපහාසකරුවෙක් හා විකට නළුවෙක් වූ ග්‍රූචෝ මාක්ස් වෙත එක් ලේඛකයකු විසින් ඔහු ලියූ උපහාස කෘතියක් යවන ලදී. ඒ කෘතිය ගැන සිය අදහස පල කරමින් මාක්ස් ඒ ලේඛකයා වෙත මෙසේ ලියා යැව්ය.

"ඔබේ පොත අතට ගත් මොහොතේ පටන් එය බිම තබන තුරු මට ඉලකැඩෙන තුරු සිනා ගියේය. කවදා හෝ එය කියවීමට මම අදහස් කරමි."

අතීතයේ මෙන්ම වර්තමානයේදීද සියලු රටවල දරුණු උපහාසයට හා පරිහාසයට ලක්වූ මාතෘකාවන් නම් ගැහැනිය සහ විවාහයයි.

"ඇය මියගියාට පසු තරම් අන්කිසි කලෙක එතරම් ප්‍රිය මනාප වූයේ නැත." (ටෙරන්ස්)

"දෙවියන් වහන්සේ ආදම් මවා ඔහු සකල ජීවීන්ගේ අධිපතියා බවට පත් කළේය. එහෙත් ඊවා ඒ සියල්ල වනසා දැම්මාය." (මාටින් ලූතර්)

"සෑම ස්ත්‍රියක්ම විවාහ විය යුතු බවත් කිසිම පිරිමියකු විවාහ නොවිය යුතු බවත් මා කවදත් දැරූ මතයයි" (බෙන්ජමින් ඩිස්රේයලි)

කාන්තා පක්ෂයෙන්ද පිරිමින් වෙත උහුලන්නට බැරි පහරවල් වැදී නැත්තේ නොවේ. කැනඩාවේ නගරාධිපතිවරියක් වූ චාලට් විටන් මෙසේ පවසා තිබේ.

ගැහැනුන් කවර දෙයක් කළත් පිරිමින්ට වඩා භාගයක්වත් හොඳයයි පිළිගනු සඳහා ඔවුන් එය පිරිමින්ට වඩා දෙගුණයක් හොඳින් කළ යුතුය. මෙය අසීරු කටයුත්තක් නොවීම අපේ වාසනාවකි.

බ්‍රිතාන්‍යයේ හිටපු අගමැති වින්ස්ටන් චර්චිල් වාග් ප්‍රහාරයට නම් දැරූ කෙනෙකි. පිරිමින් පමණක් නොව ගැහැණුන් ද ඔහුගේ දරුණු වාග් ප්‍රහාරයෙන් බේරුනේ නැත.

බ්‍රිතාන්‍ය මන්ත්‍රිණියක් වූ ඇස්ටර් අර්යාව "වින්ස්ටන් ඔබ මගේ සැමියා නම් මා ඔබේ කෝපි එකට වස දමනවා"

චර්චිල්: "මහත්මියණි මා ඔබේ සැමියා වුවානම් ඒක මම සතුටින් පානය කරනවා."

බ්‍රිතාන්‍ය මන්ත්‍රිණී: බෙසී බ්‍රැඩොක් වින්ස්ටන් අද ඔබ වෙරි වෙලා.

චර්චිල්: "බෙසී ඔබ කැත ගැහැනියක් හෙට උදේ මගේ වෙරි හිඳී තිබේවි. එහෙත් ඔබේ කැත ඒ විදියටම තියෙනවා ඇත."

ඇමරිකානු මන්ත්‍රීවරයෙක් වූ ජෝන් රැන්ඩොල්ෆ් සහ හෙන්රික්ලේ අතර වාග් යුද්ධයක් හට ගත්තේ වොෂිංටනයේ පටු මාවතකදීය. මේ පටු මාවතේ දී දෙදෙනා මුහුණුට මුහුණ ලා හමුවූහ.

"ක්ලේ මහත්මයාණෙනි, මම නම් පාහරයකුට පාර ඉඩදීලා අයින් වෙන්නේ නෑ."

රැන්ඩොල්ෆ්: "ඒ වුනාට මම නම් නිතරම පාහරයකුට පාර ඉඩ දෙනවා" (මෙසේ කියමින් රැන්ඩොල්ෆ් පාරේ පැත්තකට ඇදුනේය.)

රටවල් හා ජාතීන් නොයෙක් විට කෘර උපහාසයට ලක්වේ. ඉංග්‍රීසි ජාතිකයින් ගැන සඳහන් කරමින් ඩන්කන් ස්පේක් මෙසේ කියා තිබේ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට හිරු නොබසින්නේ මන්දැයි මා දන්නවා. "එළියක් නැති තැනක ඉන්න ඉංග්‍රීසිකරයකු ගැන දෙවියන් වහන්සේටවත් විශ්වාසයක් නෑ."

ජර්මන් කිවිදෙක් වූ හෙන්රිච් හෙයින් ඉංග්‍රීසි කාරයින්ගේ උඩගුව මෙසේ උපහාසයට ලක් කළේය.

"නිශ්ශබ්දතාවය යනු ඉංග්‍රීසිකාරයා සමග කෙරෙන කථා බහකි"

"මකුණකු මරණු සඳහා ඉංග්‍රීසිකාරයා ඇඳක් පුච්චනු ඇත" යනුවෙන් තුර්කි ප්‍රස්ථා පිරුළක් තිබේ.

ඇමරිකාව ගැන සඳහන් කරමින් ඉංග්‍රීසි ගත්කරු ඔස්කාර් වයිල්ඩ් මෙසේ කීය. "කොලොම්බස්ටත් කලින් කිහිප වතාවක්ම ඇමරිකාව අහුවෙලා තියෙනවා. එහෙත් ඇමරිකාව අහුවෙන හැම පාරකම ඒ කාරණය යට ගහනවා"

"සියට සියක් ඇමරිකානු ලේ ඇති මිනිහෙක් සියට අනූනමයක මෝඩයෙක්" යයි බර්නාඩ් ෂෝ පවසා තිබේ.

ඕනෑම රටක උපහාසකරුවන්ගේ ප්‍රියතම ගොදුරක් නම් දේශපාලනය හා දේශපාලඥයන්ය.

ඇමරිකානු ජාතික එල්.ඇල් මෙන්කන් ප්‍රජාතන්ත්‍රවාදය හැඳින්වූයේ "බූරුවන් විසින් නරි නයිදෙලා පුදනු ලැබීමක්" ලෙසිනි.

ඇමරිකානු මැති සබයේ කථානායකයාව සිටි රොබට් රීඩ් මන්ත්‍රීවරුන් දෙදෙනකු ගැන සඳහන් කරමින් මෙසේ පවසා තිබේ.

"ඔවුන් කට අරින සෑම අවස්ථාවකම සමස්ත මනුෂ්‍ය බුද්ධි සම්භාරයෙන් කොටසක් විනාශ වී යයි."

දෙවියන් වහන්සේ කාර්ලයිල් හා කාර්ලයිල් මහත්මිය අතර විවාහයක් වීමට සැලසූ එක ඉතා හොඳ දෙයකි. එමගින් සිදුවූයේ දෙදෙනකුගේ ජීවිත කාලකණ්ණිවීම පමණි. නැත්නම් හතර දෙනකුගේ ජීවිත කාලකණ්ණි වීමට ඉඩ තිබුණි.

සම්පාත :- උපුටා ගැනීමකි

# අර්බුදයකට මුහුණ දෙන හැටි



"අර්බුදයකට පෙර මුහුණපාන පුද්ලගයා සිටින්නේ තමන්ට නුපුරුදු භූමියකය. ඒ හා සමාන බාධාවන් බිහිකළා වූ අතීත සිද්ධීන් ඔවුනගේ සිහියට නගාගනිති. විසඳිය නොහැකි ප්‍රශ්නයකට තමන් මුහුණපාන්නේ යැයි සිතන පුද්ගලයා තමන්ට ඉතාම සමීප අය සමඟ ගැටුම් ඇති කරගනී. ඒ වගේම ඉතා පීඩාකාරී මානසික තත්වයකට වැටේ. මෙබඳු තත්වයන්ට පත්වන පුද්ගලයාට ආහාර ගැනීමට වුවමනාවක් නැත. ඔහුට නින්ද යන්නේ නැත. තමන් අධික සේ විඩාවට පත්ව සිටින බවත් ඔහුට දැනේ"

එපතේ පටන් මරණය දක්වා අපගේ ජීවිතය පරිවර්තනය වෙමින් පවතී. මේ පරිවර්තනය නිරන්තරයෙන් සමහරවිට ඉදිරියට පනින ශීඝ්‍රගාමී පිම්මකි. නව අවස්ථාවක පිටිපසට විසිවීමකි.

මේ වෙනස කෙබඳුද කිවහොත් ඇතැම් විට ඉතා දක්ෂ සේවකයෙක් සිය රැකියා කටයුත්තේදී පසුබෑමට පුළුවන. ඒ වගේම කිසිදු වගකීමකින් තොර අකාර්යක්ෂම තරුණියක් කදිම මවක් බවට පත්වීමට ඉඩ ඇත. හොඳට හෝ නරකට සිදුවන මෙබඳු හදිස්සි පරිවර්තනයන් අපට තේරුම් කර දිය හැක්කේ කවරාකාරයකින්ද? මානසික ආබාදවලින් පෙළෙන අය ගැන පරීක්ෂණ පැවැත්වූ මනෝවිද්‍යාඥයෝ එක් තීරණයකට එළඹියහ.

එනම්, මානසික ආබාධය හට ගැනීමට කලින් රෝගියා ජීවිතයේ යම් කිසි බරපතල අර්බුදයකට මුහුණ පා ඇති බවකි.

සමහර අය මුහුණ පා තිබුණේ අවාසනාවන්ත සිද්ධියකට හෝ බරපතල හානියකටය. එනම් දරුවකු මියයාම, රැකියාවක් අහිමිවීම හෝ ප්‍රධාන පෙළේ රෝගයකට භාජනවීම වැනි සිද්ධියකි.

එහෙත්, අර්බුදයකට මුහුණ පෑ අන් සමහරුන් පාත්‍ර වී සිටියේ ඊට හාත්පසින්ම වෙනස් දේ වලටය. එනම්, දරුවකු ඉපදීම, රැකියාව අතින් දියුණුවක් ලැබීම වැනි දේවලටය.

අර්බුදයකට පෙර මුහුණපාන පුද්ගලයා සිටින්නේ තමන්ට නුපුරුදු භූමියකය. ඒ හා සමාන බාධාවන් බිහි කළා වූ අතීත සිද්ධීන් ඔවුන්ගේ සිහියට නගාගනිති. විසඳිය නොහැකි ප්‍රශ්නයකට තමන් මුහුණපාන්නේ යැයි සිතන පුද්ගලයා තමන්ට ඉතාම සමීප අය සමග ගැටුම් ඇතිකර ගනී. ඒ වගේම ඉතා පීඩාකාරී මානසික තත්වයකට වැටේ. මෙබඳු තත්වයකට පත්වන පුද්ගලයාට ආහාර ගැනීමට වුවමනාවක් නැත. ඔහුට නින්ද යන්නේ නැත. තමන් අධික සේ විඩාවට පත්ව සිටින බවත් ඔහුට දැනේ.

මෙබඳු පුද්ගලයකු මුහුණපාන්නේ මානසික ආබාධයකටයි. අන් අයට පෙනෙනතත් ඇත්ත වශයෙන් ඔහුගෙන් ප්‍රකාශවන්නේ එබඳු අර්බුදයකට මුහුණපාන ඕනෑම කෙනකුගෙන් ප්‍රකාශ වන සාමාන්‍ය ප්‍රතික්‍රියාවන්ය.

අවසානයේදී ඔවුහු මොනයම් විදියකින් හෝ ස්වකීය ප්‍රශ්න විසඳාගනී. මේ විසඳුමෙන් පසු එක්කෝ ඔවුහු මානසික වශයෙන් වඩා ශක්තිමත් තත්වයකට පත්වෙති. නැත්නම් හිටියාටත් වඩා දුබල තත්වයකට පිරිහේ. මේ වෙනස සිදුවන්නේ කෙසේද? ඇමරිකාවේ හාවඩ් විශ්ව විද්‍යාලයේ වෛද්‍ය අංශය විසින් මේ ගැන පර්යේෂණ පවත්වන ලදී.

ජීවිතයේ අර්බුදකාරී තත්වයන්ට අප මුහුණදෙන ආකාරයෙන් ඉන් අපගේ ජීවිතයෙහි සිද්ධවන පරිවර්තනයනුත් ඒ පරීක්ෂණවලින් හෙළිවිය. නිදසුනක් වශයෙන් නියමිත කාලයට පෙර දරුවන් බිහිවන මව්වරු ඒ අර්බුදයට මුහුණපාන ආකාර දෙකක් ඇත්තේය. සමහරුන් ඊට මුහුණ පා ඇත්තේ ශෝකාකුලවය. ඔවුන් සිය සැමියාගේ පටන් වෛද්‍යවරුන් හා හෙදියන් දක්වා වූ සියලුදෙනා කෙරෙහි කෝපය දක්වන ලදී.

මේ අර්බුදයටම මුහුණපා ඇති අන් කතුන් ඊට වඩා ශාන්ත ලෙස හැසිරී ඇත්තේය. මානසික විශේෂඥයන් කර තිබෙන පර්යේෂණවලින් හෙළිවී ඇති දෙයක් නම් අර්බුදයට කලබලකාරීව මුහුණදුන් කාන්තාවන් පසුව පවුල් ජීවිතය අතින් ඉතා සාමකාමීව හා ප්‍රේමයෙන් යුක්තව හැසුරුණු බවත්, අනෙක් අය ඊට පටහැනි අන්දමින් හැසුරුණු බවත්ය.

බොහෝ විට විවාහ ජීවිතයේ මුල් මාස කිහිපය තුළ කායික මෙන්ම මානසික අර්බුදයන් පැන නගී. අලුත විවාහවන යුවලක් ඊට පෙර තමන් හා දෙමාපියන් අතර පැවති දැඩි සම්බන්ධතාවය හීනකොට තමන් අතර සම්බන්ධතාවය දැඩි කරගත යුතුය. මේ ආකාරයෙන් හැසිරුණේ නැතහොත් විවාහය අසාර්ථක වීමට ඉඩ ඇත්තේය. ජීවිතයේ සියලු අර්බුදයන් මුහුණුවර දෙකකින් යුක්තය. සමහර අර්බුදයන් අපට ගුණදායක විය හැකි අතර, අනෙක් අර්බුදයන් හානිකර විය හැක්කේය.

- 1990 අප්‍රේල් මහාර සඟරාව ඇසුරිනි



# ලායා හෝටල් සමූහය

ලායා සමූහ හෝටල් ප්‍රධාන කාර්යාලයේ අධීක්ෂණය මත යුද්ධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් සුවිශේෂී පහසුකම්වලින් සමන්විත හෝටල් පහසුකම් ලබාදීමට කටයුතු කොට ඇත. මේ යටතේ සේවයේ නියුතු සියලුම සාමාජිකයින්, විශ්‍රාමික සහ දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ ලඟම ඥාතීන් හට විශේෂිත වට්ටම් යටතේ ලායා බීච් වාද්දුව, ලායා ලෙෂර් කුකුලේගග සහ ලායා වේව්ස් කල්කුඩා යන හොටෙල් වෙතින් පහසුකම් ලබාගැනීමට හැකියාව ඇත.

යුද්ධ හමුදාධිපති ගේ අදහසකට අනුව යුද්ධ හමුදා විධායක ජෙනරාල් ගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක මෙම සුබසාධන වැඩසටහන් හරහා රණවිරුන්ට හා එම ඥාතීන්ට සහනදායී මිලගණන් යටතේ ආහාරපාන හා සුවපහසු නවාතැන් සමඟින් සුඛෝපභෝගී හොටල්වල අපූර්ව අත්දැකීම් ලබාගැනීමට අවස්ථාව සැලසේ. එහිදී, පහත සඳහන් පරිදි පහසුකම් සලසාදී ඇත.

- යුද්ධ හමුදා සාමාජිකයින්ගේ විවාහ උත්සව සඳහා විශේෂ වට්ටම් (Wedding Package).
- විවාහ සංවත්සර උත්සව (Anniversary Package).
- යුද්ධ හමුදා සාමාජිකයින් සඳහාම වෙන්වූ Honeymoon Package (දින දෙකක් සඳහා රු 20,000.00 නවාතැන් ආහාර පාන සහිතව)
- යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ප්‍රිය සම්භාෂණයන් සඳහා වෙන්වූ විශේෂ කෑම වට්ටෝරු සකසා ඇත.
- සුභසාධක විශේෂ වට්ටම (Special Welfare Package) පහත සඳහන් පරිදි ඔබ සඳහා වෙන් කර ඇත.

| Description | Rates | Army Officers | Army Ors | Special Welfere Package |
|---|---|---|---|---|
| **Laya Beach Wadduwa** | | | | |
| SGL Room FB | 24,000.00 | 11,900.00 | 10,200.00 | 8,200.00 |
| DBL Room FB | 29,000.00 | 16,100.00 | 15,800.00 | 11,800.00 |
| TPL Room FB | 35,000.00 | 21,600.00 | 21,300.00 | 15,400.00 |
| **Laya Leisure Kukuleganga** | | | | |
| SGL Apartment FB | 39,500.00 | 17,900.00 | 17,100.00 | 9,900.00 |
| DBL Apartment FB | 69,000.00 | 34,200.00 | 34,200.00 | 19,200.00 |
| TPL Apartment FB | 100,500.00 | 51,300.00 | 51,300.00 | 28,600.00 |
| **Laya Waves Kalkudah** | | | | |
| Suit Room 2pax FB | 30,000.00 | 17,200.00 | 16,500.00 | 11,000.00 |
| Suit Room 4pax FB | 45,000.00 | 23,900.00 | 22,800.00 | 17,800.00 |
| DLX FML Room 6 pax FB | 56,000.00 | 30,100.00 | 29,100.00 | 24,600.00 |



**ලායා බීච්**

දුරකථන - +94 382 232 815
+94 382 284 832
ෆැක්ස් - +94 382 284 831
ඊමේල් - layabeach@layahotels.lk
fomlayabeach@layahotels.lk
ලිපිනය - 286/3, ගාලු පාර, තල්පිටිය උතුර, වාද්දුව, ශ්‍රී ලංකා.

**ලායා ලෙෂර්**


දුරකථන - +94 342 210 756
+94 777 419 756
ෆැක්ස් - +94 342 236 545
ඊමේල් - layaleisure@layahotels.lk
fomlayaleisure@layahotels.lk
ලිපිනය - උක්වැල්ල, මෝල්කාව, ශ්‍රී ලංකා.



**ලායා වේව්ස්**

දුරකථන - +94 652 050 500
ෆැක්ස් - +94 652 020 777
ඊමේල් - layawaves@layahotels.lk
gmlayawaves@layahotels.lk
ලිපිනය - පාසිකුඩා, කල්කුඩා, ශ්‍රී ලංකා.










## හිතේ ඇඳි බිතු සිතුවම...

දෑසම පියාගෙන යහනට වී රෑක
ඇන්ඳා සිතුවමක් මා සිතතුළ මෙලෙස
දවසෙම විඩාවෙන් පීඩා විඳී ගතට
දැනුණා සිසිලසක් සුළඟක් නොමැතිවම

බිතු සිතුවමක් සේ පෙනුණත් දුරට සොඳ
හරි ලස්සනයි ඈතට කඳුපෙල නිබඳ
ඉර බැසයන ගොම්මන් රෑ කලුව මැද
නැගලා බලන්නට සිත්විය අවට සඳ

කොතරම් අපූරුද කඳු පාමුල සවස
ටික ටික උඩට යනකොට දැනෙනා වෙහෙස
කිච්චිබිච්ච නදින් මුසපත්වී මා මනස
දුරුවිය ඇසිල්ලෙන් මගෙ ගත සිත වෙහෙස

කඳු මුදුනේ සිට බලනා විට අවට
හරි ලස්සනට පෙනුණා මහ වැව් නෙතට
හෙළ රජවරුන් ඉදිකළ පන්සල් දුරට
දැක මහ තේජසක් දැනුණයි මේ සිතට

සෙ/556348
ලා/කෝ විජේසිංහ ඩබ්ලිව්ඒඩීඑල්
2 කරෙ

## මගේ පියාණන්...

ජීවිතය නමැති සාගරය තරණය කරන්නට
මා හට නැවියකු වූ මගේ පියා
ජීවිතය නමැති මඩවගුරේ
සුවඳ හමන පුෂ්පයක් වන්නට මට කියාදුන්
උගත මනා ශිල්පය මතු රැකෙනා
පණ්ඩිත වදන්පෙළ අරුත මාහට නිරන්තරයෙන්
කියාදෙමින් මගේ දිවිය ජයග්‍රහණයේ මුදුන්කඩ තුළට
රැගෙනගිය මගේ පියා උපදින භවයෙත් මගේම
පියා වෙන්නයි මගේ පැතුම

සෙ/ඊ100346
රෝසෙ දිල්ෂාන් එච්ඒඑස්
7(සෙව) ශ්‍රීලසසබ

## යුපො 21...

මහ තල්මසකු සේ
මේ මහා පොත්ගුල
මගේ මනසට
ගිලීමට හැකිනම්
කොතරම් වාසනාවක්ද...?

සෙ/6ආර්00478
සැරයන් ජයසේන ආර්ඒඑන්එන්
යුහ කළඹුර
රෙම ශ්‍රීලයුකාබ

## මගේ සුදු දෝණී...

පෙමින් වෙලිලා කාලයක්
උනත් නෑ කිසි පාලුවක්
හිඳිනෙම් තව නීල මැණික්
ඒ අපේ රන් දියණියක්

තැවුල් දුරලූ රන් කඳක්
උනා නුඹ මට පුර හඳක්
මටම මාවලූ පින් කඳක්
මගේ වුන රන් දියණිය

ප්‍රේමයට තව එක නමක්
හදින් නැගෙනා හිමි නමක්
සෙනෙහෙ ගලනා පෙම් ගඟක්
නුඹ නොවෙද සුදු දෝණියේ

සෙ/485517
සැරයන් අජිත් කුමාර ඒඩී
20 ගරෙ

## ආධුණික සෙබලා...

ආ - ආදර වදන් ඉවතලන
ධු - ධුරාචාර පිටුදැක
ණි - නිහතමානී පරිසරය
ක - කරුණාබර හදවත් බඳු...

සෙ - සෙවණ සැලදෙන වෘක්ෂයක් සේ
බ - බල සම්පන්න හැඩි දැඩි
ලා - ලාමක අදහස් ඉවත ලන...

සාර්ථක පුහුණුවක් නිමකරන
"ආධුණික සෙබළා"

නි/70207
කපිතාන් ඒපීඑස් චන්ද්‍රසිරි ගරෙ
ආමාප්‍රකා නිල නිවස
කොළඹ - 07

## සෙබළ සිතුවිලි...

ලක් දෙරණ සුරකිමින්
ජීවිතය උකසට තබමින්
මිහිතලය රැක ගනිමින්
සේවය කල අප විරුවානෝ

වැඳුණු සැර උණ්ඩයෙන්
දෑස් අත් පා අහිමි කරමින්
ජාතිය හඩවමින්
සේවය කළ අප විරුවාණෝ

සිහිය වකලින් ඇවිදිමින්
අත්වාරුවක ආධාරයෙන්
පාදයක වාරුවෙන්
පිය නගන විරුවාණෝ

පැලඳ සහය පාදයෙන්
දිරි දිවි පෙවෙත රැකෙමින්
ඔබට උත්තමාචාරය
පුදකරමි විරුවාණෝ....

සෙ/652661
කෝප්‍රල් ආරියරත්න පේඩීපේ
1 ශ්‍රීලයුවෙබ

## ආදර දෝණී...

ආදර මගේ දෝණි
නුඹ ලැබුණ දා සිට
මා හට ලැබුණි
පිය පදවිය...
දින දින ලොකුවී
වන විට
මා හද සතුටු වන බව
රකිමි මා නුඹව
මැණිකක් ලෙසා...

සෙ/2වල්00815
සැරයන් චතුර කුමාර පීජීඑන්
2 (සෙව) ශ්‍රීලයුවෙබ



# ක්‍රීඩා විත්ති

## Super Knights International Chess Championship 2023 ක්‍රීඩක ක්‍රීඩිකාවෝ දස්කම් දක්වති

ශ්‍රී ලංකාවේ සහ විදේශ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 500 කට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් අප්‍රේල් මස 05 වන දින සිට දින පහක් පුරා මහරගම ජාතික තරුණ සේවා සභාවේදී පැවති "Super Knights International Chess Championship 2023" චෙස් තරගාවලියෙහි අනුශූරතාව දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායම සමත් විය. එහිදී, ELO ශ්‍රේණිගත කිරීම් 1600 - 1800 කාණ්ඩයේ ශූරතාවය ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ මේජර් ඒඑබීඩීපී අබේවර්ධනට හිමි වූ අතර, ELO ශ්‍රේණිගත කිරීම් 1000 - 1200 කාණ්ඩයේ සම දෙවන ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ කෝප්‍රල් එන්එස් සිල්වා විසින් දිනාගන්නා ලදි.




## ආරක්ෂක සේවා ක්‍රීඩා උළෙල - 2023, පාපන්දු ශූරතාවය යුද්ධ හමුදාවට






ත්‍රිවිධ හමුදා පාපන්දු ක්‍රීඩකයන්ගේ සහභාගීත්වයෙන් ආරක්ෂක සේවා ක්‍රීඩා උළෙල - 2023 ඉකුත් මැයි 22 වන දින තුරග තරග පිටියේදී පැවැත්විණ. එහිදී, පාපන්දු තරගාවලියේ පිරිමි කාණ්ඩයේ අවසන් මිනිත්තු දහය තුළ ගෝල දෙකක් ලබාගනිමින් තියුණු තරඟයකින් අනතුරුව නාවික හමුදා පා පන්දු කණ්ඩායමට එරෙහිව ශූරතාවය දිනාගැනීමට යුද්ධ හමුදා පා පන්දු කණ්ඩායම සමත්විය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ කෝප්‍රල් මෙන්ඩිස් එල්සීඑස්කේ සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ ලාන්ස් කෝප්‍රල් රහුමාන් එම්ඒජ් තරගාවලියේ වීරයන් බවට පත්වූහ. මෙහි කාන්තා කාණ්ඩයේ ශූරතාවය ශ්‍රී ලංකා නාවික හමුදා කාන්තා පාපන්දු කණ්ඩායම දිනාගත් අතර අනුශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා පා පන්දු කණ්ඩායමට හිමිවිය.

# ආරක්ෂක සේවා බැඩ්මින්ටන් තරඟාවලියේ වැඩි දස්කම් යුද්ධ හමුදාවෙන්




ආරක්ෂක සේවා බැඩ්මින්ටන් තරඟාවලිය කොළඹ ශ්‍රී ලංකා ගුවන් හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී ඉකුත් මැයි මස 29 වන දින සිට 31 වන දින දක්වා පැවැත්විණ. එහිදී, ඊට සහභාගී වූ යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සිය දක්ෂතා මනාලෙස පෙන්නුම් කරමින් ත්‍රිවිධ හමුදා සාමාජිකයින් අතර වූ සියලුම ශූරතාවන් යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් හිමිකරගැනීම කැපීපෙනේ. සම්මාන ප්‍රදානෝත්සවය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධ්‍යක්ෂ ජෙනරාල් ගුවන් මෙහෙයුම් එයාර් වයිස් මාර්ෂල් සම්පත් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී එෆ්ඩබ්ලිව්සී කිව්එෆ්අයි යුද්ධ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් පීඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී, ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයේ උප සභාපති පාලිත හෙට්ටිආරච්චි මහතා සහ යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

# ආරක්ෂක සේවා ක්‍රීඩා උළෙල - 2023, රග්බි තරඟාවලියේදී යුද්ධ හමුදාවෙන් විශිෂ්ට දස්කම්






ආරක්ෂක සේවා ක්‍රීඩා උළෙල - 2023, රග්බි තරඟාවලිය මැයි මස 9 දින සිට 23 දින දක්වා රත්මලාන ශ්‍රී ලංකා ගුවන් හමුදා ක්‍රීඩාංගණයේ පැවති අතර, එහිදී යුද්ධ හමුදා රග්බි ක්‍රීඩක ක්‍රීඩිකාවෝ කැපී පෙනෙන දස්කම් දැක්වූහ. ත්‍රිවිධ හමුදා පිරිමි සහ කාන්තා රග්බි කණ්ඩායම් මෙම ශූරතාවය සඳහා තරඟවැදුණු අතර, එහිදී යුද්ධ හමුදා කාන්තා රග්බි කණ්ඩායම තියුණු තරඟයකින් පසුව ලකුණු 12 - 00 ලෙස නාවික හමුදා කාන්තා කණ්ඩායම පරදවමින් රන් පදක්කම දිනාගැනීමට සමත් විය. යුද්ධ හමුදා සහ නාවික හමුදා පිරිමි රග්බි කණ්ඩායම් අතර පැවති තියුණු තරඟයකින් පසුව ලකුණු 20 ට- 27 ක් ලෙස තරඟයේ අනු ශූරතාවය යුද්ධ හමුදාවට හිමිවිය. කාන්තා අංශයේ දක්ෂතම ක්‍රීඩිකාව ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ලාන්ස් කෝප්‍රල් ඩීසීටී ලියනගේ සම්මානය හිමිකරගත්තාය.

# Nuwar Eliya Lake Cross - 2023 තරඟාවලියේ ජය යුද්ධ හමුදාවට

ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා රියැදුරන්ගේ හා යතුරුපැදිකරුවන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා යතුරුපැදි ක්‍රීඩා සම්මේලනය වෙතින් සංවිධානය කරනු ලැබූ Nuwar Eliya Lake Cross - 2023 තරඟාවලිය යුද්ධ හමුදා ධාවකයින් ඇතුළු දිවයින පුරා මෝටර් රථ ධාවකයින් රැසකගේ සහභාගීත්වයෙන් අප්‍රේල් මස 14 වන දින සිට 16 වන දින දක්වා නුවරඑළිය ධාවන පථයේදී පැවැත්විණි. එහිදී, මෝටර් ක්‍රොස් ධාවන ඉසව් 17 ක ජයග්‍රහණ යුද්ධ හමුදා ක්‍රීඩකයෝ දිනාගැනීමට සමත්වූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මෝටර් රථ ක්‍රීඩා කම්ටුවේ සභාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී තරඟකරුවන් සඳහා අවශ්‍ය මගපෙන්වීම් ලබාදෙමින් ඔවුන් දිරිමත් කළේය.



# 2023 අන්තර් රෙජිමේන්තු මල්ලවපොර තරඟාවලියට ක්‍රීඩක ක්‍රීඩිකාවන් 150 දෙනෙක්





අන්තර් රෙජිමේන්තු මල්ලවපොර තරඟාවලිය - 2023, පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගනයේ දී ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසකගේ සහභාගීත්වයෙන් පසුගිය මැයි මස 25 දින සිට 28 දින දක්වා පැවැත්විණි. මේ සඳහා සියලු රෙජිමේන්තු නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 150 දෙනකු සහභාගී වූහ. එහිදී, තරඟාවලියේ පිරිමි අංශයේ ශූරතාව ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායම දිනාගත් අතර, අනුශූරතාව හිමිකරගැනීමට ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා කණ්ඩායම සමත්විය. එහි ආධුනික අංශයේ ශූරතාව ශ්‍රී ලංකා පාබල හමුදා කණ්ඩායමටත් අනුශූරතාව ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායමටත් හිමිවිය. කාන්තා අංශයේ ශූරතාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා කණ්ඩායම හිමිකර ගනිද්දී අනුශූරතාව දිනාගැනීමට ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා කණ්ඩායම සමත්විය.

# "ප්‍රවීන් අභියෝගතා කුසලාන" එල්ලේ ශූරතාව



"ප්‍රවීන් අභියෝගතා කුසලාන" එල්ලේ තරඟාවලිය ඉකුත් මැයි මස 20 වන දින බංගදෙණිය, කරුක්කුලිය විද්‍යාල ක්‍රීඩාංගණයේදී පැවත්විණ. එහිදී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා එල්ලේ කණ්ඩායම බංගගිරිය චැලෙන්ජර්ස් ක්‍රීඩා සමාජ කණ්ඩායමට එරෙහිව තරඟවැදී තියුණු තරඟයකින් පසුව එහි ශූරතාවය දිනාගැනීමට සමත්විය.

# මංගල නිශාන්ත අනුස්මරණ එල්ලේ ශූරතාව

රත්නගිරිය වික්ටරි ක්‍රීඩා සමාජය වෙතින් 11 වන වරටත් සංවිධානය කරනු ලැබූ මංගල නිශාන්ත අනුස්මරණ එල්ලේ තරඟාවලිය පසුගිය මැයි මස 14 වන දින මාදම්පේ දුම්මලසූරිය වික්ටරි ක්‍රීඩා පිටියේ දී ශ්‍රී ලංකා යුද්ධ හමුදා එල්ලේ කණ්ඩායම ඇතුළු කණ්ඩායම් හයක සහභාගීත්වයෙන් පැවැත්විණි. එහිදී, ගණේමුල්ල වාසනා ක්‍රීඩා සමාජය ශ්‍රී ලංකා යුද්ධ හමුදා එල්ලේ කණ්ඩායම සමග අවසන් මහා තරගයට සුදුසුකම් ලබාගත් අතර, එම තරගයේදී යුද්ධ හමුදා එල්ලේ කණ්ඩායම පන්දු 30 කදී ලකුණු 10 ක් රැස්කළ අතර ප්‍රතිවාදී ගනේමුල්ල වාසනා කණ්ඩායමට රැස්කරගැනීමට හැකිවූයේ පන්දු 24 කදී ලකුණු 03 ක් පමණි. ඒ අනුව 11 වන මංගල නිශාන්ත අනුස්මරණ එල්ලේ තරඟාවලියේ ශූරතාව දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා එල්ලේ කණ්ඩායම සමත්විය.



# සංචාරයන්හි මතක සටහන්





ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද) ආඥාපති සහ යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ඊපී වීරසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී යූඑස්පී ඒටීඕ ඉකුත් මැයි 17 වන දින වේයන්ගොඩ පිහිටි මධ්‍යම අවි පතුරොම් ගබඩාවෙහි සංචාරයක නිරත විය. එහිදී, සේනාවිධායක කර්නල් කේපීඑන්එස්කේ කාරියවසම් එල්එස්සී ඒටීඕ විසින් එම ගබඩාවේ පාලන රාජකාරීන් සම්බන්ධව දැනුවත් කරන ලදී. යුද්ධ හමුදා සොල්දාදුවකුගේ විනය, විශ්වාසය, ඇත්දැකීම් සහ නායකත්ව ගුණාංග දියුණු කරගැනීම යුද්ධ හමුදාවේ උන්නතියට දායකවන ආකාරය පිළිබඳ දැනුම්වත් කරමින් කර්නල් සේනාවිධායක සිය සංචාරයේදී හටපිරිස් අමතන්නටද අමතක නොකළේය.



යුද්ධ හමුදා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් අභිනවයෙන් පත්වූ මේජර් ජෙනරාල් ජීඒසී ප්‍රනාන්දු යූඑස්පී ඉකුත් මැයි 15 වන දින සිය ප්‍රථම නිල සංචාරය ලෙස කොළඹ පිහිටි යුද්ධ හමුදා රෝහලෙහි නිරීක්ෂණ චාරිකාවක් සිදුකළේය. එහිදී, එම රෝහලෙහි රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් සමග සුහදව අදහස් හුවමාරු කරගත් හෙතෙම ඔවුන් හා තේපැන් සංග්‍රහයකට ද එක්වූහ.


# රණවිරුවා






**අධීක්ෂණය**

බ්‍රිගේඩියර
කේඩබ්ලිව්එස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ආර්එම්ඩබ්ලිව්පීකේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්ඩබ්ලිව් ලක්මිකා

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



“ වීරත්වය යනු හුදු චචන මාත්‍රයක් නොවේ. එසේම බලකිරීමෙන් හෝ අණ කිරීමෙන් වීරයන් බිහිකළ නොහැකිය. එය වූ කලී අවබෝධය, හැඟීම හා කැපකිරීම හමුවේ නිරායාසයෙන් සිදුවන්නකි. රණබිමෙහි සේම ඉන් පරිභාහිරවද අන් අයගේ ජීවිතවල අතිශය තීරණාත්මක ඕනෑම මොහොතකදී විරුවකුගේ වීරත්වය ඉස්මතුවනුයේ ඇසිල්ලකිනි. කෝප්‍රල් කරුණාරත්න ඊට කදිමට උදාහරණ සපයයි ”

# අභීත විරුවකුගේ වික්‍රමාන්විත මෙහෙවරට උපහාර...



ඉකුත් මැයි 26 වන දින මහනුවර සිට මහියංගනය දක්වා ගමන්කරමින් තිබූ මගීන්ගෙන් පිරුණු බස්රථයකට හදිසියේ සිදුවන්නට ගිය විශාල විනාශයක් විරෝදාර රණවිරුවකුගේ ක්ෂණික ක්‍රියාකලාපයක් හේතුවෙන් වළකාලීමට හැකිවිය. හේ නමින් 4 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ කෝප්‍රල් කරුණාරත්න කේඑම්බීආර්කේවල් විය.

අදාළ කෝප්‍රල්වරයා ඇතුළු 50 දෙනකුගෙන් පමණ යුත් පිරිසක් සහිත එම බස්රථය උඩුදුම්බර ප්‍රදේශයෙන් ගමන් කරන අවස්ථාවේ වංගුවක් ගැනීමේදී රියදුරු සිය අසුනෙන් ඉවතට විසිවී ඇති අතර, එහිදී මීටර් 50ක් පමණ දුරක් රියදුරු නොමැතිව එම බස්රථය ගමන් කර ඇත. එහිදී, එම සිදුවීම දුටු යුද්ධ හමුදා සෙබළ කෝප්‍රල් කරුණාරත්න රණවිරුවා යුහුසුලුව ක්‍රියාත්මක වී රියදුරු නොමැතිව ධාවනය වූ බස් රථයේ රියදුරු අසුනට ගොස් මහත් පරිශ්‍රමයක් දරා එය පාලනය කර නවත්වාගැනීමට සමත් විය.

සමස්ත යුද හමුදාවටම ගෞරවයක් ගෙනදෙමින් තත් කොනොහි ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව සිදුකළ එම චකිතර ක්‍රියාව අගයා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් ඔහුට ප්‍රශංසාත්මක ලාංඡනය පිරිනමන ලදී. පසුගියදාට යෙදුනු යුද්ධ හමුදාධිපතිගේ පදවි ප්‍රාප්තියේ වර්ෂ පූර්ණ උත්සවයට සමගාමීව එම කටයුත්ත සිදුකෙරිණි.



රණබිමේ මතක

# වැලි මත මැකුනු හිත්වල රැඳුනු සලකුණු...

කවුරු ඇවිද්දත්
වැල්ලෙ සලකුණු ඇඳෙනව.
ඒවගේම ඒව
ඉබේම මැකිලත් යනව.
ඒත් රණවිරුවන්ගේ සලකුණු
එහෙම මැකෙන්නෙ නෑ.
ඔවුන් මහපොලොවෙ
අඩියක් තියනකොට
සලකුණු අඳෙන්නෙ
මිනිස්සුන්ගෙ හිත්වල.
ඔවුන් මේ රට වෙනුවෙන් කළ
අසීමිත කැපකිරීම
කෙළෙහිගුණ දත් ජාතියකට
අමතක වෙන්නෙ නැහැ.
මේ බූට් අඩි සලකුණු යට
සැඟවුණු කතා බොහොමයි.
ඒ හැම කතාවකම
අවසානෙට කියවෙන්නෙ
ඔවුන් ජීවිත පරිත්‍යාගයෙන්
අපිට රටක් ඉතුරු කරදුන් බවයි.